SGLife

EDUCATION / TRAINING / COACHING

# PROTECT YOUR FUTURE

# ජීවිත රක්ෂණය තුළින් අනාගතය සුරැකීම

SURANJITH GODAGAMA

Life insurance and your family's future

SINHALA / DIGITAL READING EDITION

Original text preserved

ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට පෙර හෝ අලෙවි කිරීමට පෙර අනිවාර්යයෙන්ම කියවිය යුතු පොතකි.

# ජීවිත රක්ෂණය තුළින් අනාගතය සුරැකීම

"රක්ෂණය සැමවිටම මිලදීගෙන ඇත්තේ කෙනෙක් තව කෙනෙක්ට ආදරය කරන නිසාය."

# ජීවිත රක්ෂණය
# තුළින්
# අනාගතය සුරැකීම


## සුරංජිත් ගොඩගම
DipM, ACIM, CII (Award), Cert.CII, DipHRM

51/8G, 9 වැනි පටුමග, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල
suranjithgodagama.sg@gmail.com
+94777238015

**ජීවිත රක්‍ෂණය තුළින් අනාගතය සුරැකීම**

© සුරංජිත් ගොඩගම

ප්‍රථම මුද්‍රණය - 2014

ISBN - 978-955-44941-1-4

**මුද්‍රණය** බිලූහෝන් මුද්‍රණ (පුද්ගලික) සමාගම
522, උඩුමුල්ල පාර, බත්තරමුල්ල,
011 2877794

**කවර නිර්මාණය** - සෞම්‍ය සඳරුවන් ලියනගේ

**පරිගණක අක්‍ෂර සංයෝජනය සහ පිටු සැකසුම** පමෝද් පියුෂාන්
ෂාන්-සංජු ටයිප් සෙටින්
නො. 238/2
සෝමාලංකාර මාවත,
මාගම්මන, හෝමාගම.
දු: ඇ: 0716 855 873, 0702 788 587
Email- pamodpiushan@yahoo.com
pamodpiushankp@gmali.com

මෙම කෘතියෙහි කිසිදු කොටසක් කර්තෘගේ ලිඛිත අවසරයකින් තොරව නැවත පිටපත් කිරීම, මුද්‍රණය කිරීම හෝ කිසිදු ආකාරයක විද්‍යුත් මාධ්‍යයකින් හෝ පටිගත කිරීමක් මගින් හෝ දත්ත ගබඩා කිරීමේ හා ආපසු ගැනීමේ පද්ධතියක් මගින් හෝ මෙහි සඳහන් කරුණු යොදා ගැනීම සපුරා තහනම්.

# පිදුම

ලෝකය නිවැරදිව දකින්න

නැණස පෑදු

මගේ සියළු ගුරුවරුන්ට

මෙම පොත ගෞරවයෙන් පුදකරමි !

"මගේ සිතැඟි පරිදි කළ හැකිව තිබුණේ නම්, 'රක්ෂණය' යන වදන මම සෑම නිවසකම දොර මත සහ සෑම මිනිස් සිතකම ලියා තබමි. ඒ මක් නිසාද යත්, ඉතාමත් සුළු කැපකිරීමක් සිදු කර, මහා ව්‍යසනයකින් කැඩී බිඳී ඉහිරී යා හැකි පවුල්, ජීවිත රක්ෂණය මගින් සුරක්ෂිතභාවයට පත්කළ හැකි බව මා තරයේ විශ්වාස කරන නිසාය. තමන් සතු සියලු වස්තුව සමග, ජීවිතයේ අවදානම නමැති දුර්වල නෞකාවේ නැගී දුෂ්කරත්වයෙන් දුෂ්කරත්වය කරා දියත්වෙන පවුලක, ප්‍රධාන ආදායම් උපයන්නාගේ හදිසි මරණය නිසා අභාග්‍යය කරා ඇද වැටීමෙන් ඇතිවන භයානක නාස්තිය වැළකීම අප හැමගේ වගකීමක් වන්නේ, හුදු මනුෂ්‍ය සන්තුෂ්ටිය නිසාම පමණක් නොව, එවන් අභාග්‍යයක් මුළු ජාතියේම ආර්ථික සෞඛ්‍යය හා ශක්තිමත්භාවයට තදින් බලපාන බැවිනි"

-වින්ස්ටන් චර්චිල්-

# කර්තෘගෙන් පණිවුඩයක්

පියෙකුගේ අකල් මරණයක් නිසා දරුවන්ට පාසැල් අත හැරීමට සිදුවූ අවස්ථා මෙන්ම සැමියාගේ අකල් මරණය නිසා තනිවන බිරිඳ, දරුවන් ඇති දැඩි කිරීමට දරන දුක්බර වෙහෙස මා මේ සමාජයේ කොතෙකුත් දැක තිබෙනවා.

මුදල් නොමැතිකම නිසාම රෝහල් වල නොමිලේ ප්‍රතිකාර ලබා ගැනීමට පෝලිමකට වී අනාගතය පිළිබඳ හිස් දෑසින් යුතුව බලා හිඳින දෙමවුපියන් හා වයස්ගත රෝගීන් මා දැක තිබෙනවා. ඉතා අසාධ්‍ය රෝගවලින් පෙළෙන අසරණ රෝගීන් පවා මුදල් නොමැතිකම නිසාම දෙවියන්ට තම ජීවිත භාරකර නොමිලේ ප්‍රතිකාර ලැබෙන තුරු බලා සිටිනවා. නොමිලේ ලැබෙන සෞඛ්‍ය සේවාවන් සඳහා දිගු කාලයක් තමාගේ වාරය එනතුරු බලා සිටීම හැර ඔවුන්ට වෙනත් විකල්පයක් නොමැත.

අද සමාජයේ බහුලව දකින්නට ලැබෙන මෙවැනි ශෝචනීය ගැටළුවලට ඇති කදිම විසඳුම, “ජීවිත රක්ෂණය”යි. කෙනෙකු ගේ පවුලේ ආදරණීයයන්ගේ ජීවිතයේ මෙවැනි අනපේක්ෂිත උපද්‍රව වලින් සිදුවන මූල්‍යමය හානි වලට මුහුණ දීමේ කදිම විකල්පය ජීවිත රක්ෂණයයි.

“ජීවිත රක්ෂණය හැම විටම විකුණන දෙයක් මිස කැමැත්තෙන් මිලදී ගන්නා දෙයක් නොවේ” මෙය, රක්ෂණය හා බැඳුනු පිරිස අතර ඇති කියමනක්. එනමුත් ජීවිත වල ඇති අනපේක්ෂිත සිද්ධීන් දකින විට සත්‍ය වශයෙන් ම සිදුවිය යුතු වන්නේ, “ජීවිත රක්ෂණය තම කැමැත්තෙන්ම මිලදී ගත යුතු දෙයක් මිස කෙනෙකු විසින් බලෙන් විකිණිය යුතු දෙයක් නොවේ.”

ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය හා ජපානය වැනි සංවර්ධිත රටවල්වල බහුතරයක් ජනතාව, ප්‍රමාණවත් ලෙස සිය ජීවිත රක්ෂණය කරගෙන ඇත. එනමුත් ශ්‍රී ලංකාවේ රක්ෂණය වී

ඇති ජීවිත ප්‍රමාණය, සංඛ්‍යාත්මකව ඉතාමත් පහළ අගයක පවතියි. මීට ප්‍රධානම හේතුව ලෙස මා විශ්වාස කරන්නේ ජීවිත රක්ෂණයේ අමිල වටිනාකම හා එමගින් සිය ජීවිත හා අනාගතය සුරක්ෂිත කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව ඇති නිවැරදි දැනුම හා අවබෝධය ලාංකීය ජනතාව අතර ඉතා අඩු වීමයි.

මූල්‍ය සැලසුම්කරණය හා ජීවිත රක්ෂණය පිළිබඳව දේශනයක් පැවැත්වීමට මෑතකදී මට අවස්ථාවක් ලැබිණි. එහිදී, පවුලක අනාගත සුරක්ෂිතභාවය සහතික කිරීමට මූල්‍ය සැලසුම්කරණයේ ඇති වැදගත්කම මෙන්ම ජීවිත රක්ෂණ තුළින් ඊට ලැබෙන අද්විතීය අත්වැල හා පවුලක ප්‍රධාන ආදායම් උපයන්නා ජීවත්ව සිටියත් නැතත් ඔවුන්ගේ අනාගත මූල්‍යමය බලාපොරොත්තු ඉටුකරගන්නා අන්දම මවිසින් හොඳින් විස්තර කෙරිණි.

දේශනය අවසානයේ මා වෙත පැමිණි මහත්මයෙක් මෙසේ පැවසීය. "ඔබ පැවසූ දේ මගේ සිතට තදින් කා වැදුණා. මම ඇත්තටම ඉතා වාසනාවන්තයි, ඒ මොකද, කිසිදු අභාග්‍යයකින් තොරව ජීවිතයේ සියළු අවධීන් මගේ පවුලේ අය සමග මා සාර්ථකව පසුකරා. දැන් මට වයස අවුරුදු 77යි, ඔබ පැවසූ අන්දමට මේ වයසේ දී මට දැන් ජීවිත රක්ෂණයක් අනවශ්‍යයි. නමුත් මම තරයේ අදහනවා ආදරය හඳුනන හැම අම්මා, තාත්තා කෙනෙක්ම ඔබ පැවසූ "ආදරයේ කතාව" ට ඇහුම්කන් දිය යුතුම බව. හැමෝම අතරට මේ පණිවිඩය යැවීමටත් එමගින් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරගන්නට මම ඔබට පොතක් ලියන්න ආරාධනා කරනවා. එම පොත, උතුම් සමාජ මෙහෙවරක් වනවා නොඅනුමානයි. ඒ වගේම ඒ පොත, සැම දෙනාටම මිලදී ගතහැකි පහසු මිලකට ලබා දෙන්න."

මම ඔහුගේ ආරාධනාව පිළිගත් අතර මෙම කුඩා පොත ඉතා ඉක්මනින් සැකසීමට, ඔහු පැවසූ දෙය මට මහත් ධෛර්යයක් විය.

**සුරංජිත් ගොඩගම**

# පෙරවදන

රක්ෂණයේ වටිනාකම හා එහි වැදගත්කම, රක්ෂණ කර්මාන්තයේ නියුතු වුවන් ඉතා පැහැදිලිව හඳුනනවා. එනමුත්, අපට බොහෝ විටම අසන්නට ලැබෙන්නේ, අනිවාර්ය වන අවස්ථාවන් හැරුණු විට අන් සෑමවිටම පාහේ, රක්ෂණය, අලෙවි කිරීමට සිදුවන බවයි. මෙම තත්ත්වය ඉදිරියටත් සිදුවන්නට ඉඩ දී බලා නොසිට, එය වෙනස් කිරීම සඳහා සුරංජිත් විසින් වටිනා පරිශ්‍රමයක් දරා ඇත.

රක්ෂණය තුළින් පුද්ගල ජීවිතයට ගෙනදෙන මහගු ප්‍රතිලාභයන් හරහා සමාන්‍ය පාඨකයාට රක්ෂණයේ වැදගත්කම පිළිබඳ මනා වැටහීමක් මේ පොත තුළින් ලැබෙයි. රක්ෂණයේ වටිනාකම මැනවින් වටහා දෙන, මෙම සරලව ලියවුණු පොත කියවීමෙන්, සුරංජිත් මෙයින් අදහස් කරන පණිවුඩය මට පැහැදිලිව තේරුම් ගියා. එය කියවා ගෙන යනවිට, හරියටම මා සුරංජිත් හා සංවාදයක යෙදුනාක් මෙන් මට හැඟී ගියේ ඔහු සතු දක්ෂ සන්නිවේදන කුසලතාවය නිසාය.

වේගවත්ව දිවෙන ලෝකයක වෙසෙන පාඨකයා මොහොතක් ඉන් බැහැරව නතරවී, තමන්ගේ හා තම පවුලේ ජීවිත හා අනාගතය දිහා හොඳින් සිතා බලන්නට පොළඹවන ජීවිත රක්ෂණ කථා පෙළක් මෙම පොතෙහි අඩංගුයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ජීවිත රක්ෂණය පිළිබඳ දැඩි විශ්වාසයක් පාඨකයා තුළ මුල්බැස ගැනීමයි.

සුරංජිත් අදහස් කරන ආකාරයටම මෙම පොත, කෙනෙකු විසින් ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට හෝ අලෙවි

කිරීමට පෙර හොඳින් කියවිය යුතුම පොතකි. බොහෝ පිරිසක් අතට මෙම පොත රැගෙන යාමෙන් ජීවිත රක්ෂණය තුළින් තම ජීවිත ආලෝකමත් වන ආකාරය පිළිබඳ නිවැරදි හා මනා වැටහීමක් ඇති කිරීමටත් ජීවිත රක්ෂණය, අගය කිරීමටත් බොහෝමයක් දෙනා පෙළඹෙනු නියතයි. කෙනෙකු විසින් අපට යමක් විකුණනවාට අප අකමැතිය. බොහෝමයක් දෙනා ජීවිත රක්ෂණයක් සඳහා දීර්ඝ කාලීනව ගිවිසුමකට එළඹුණු පසු එම තීරණය ගැන සැක උපදවා ගන්නෙත් අවිනිශ්චිතබවක් ඇති කරගන්නේත් මේ හේතුව නිසාමයි. එසේ ම, නිවැරදි අවබෝධයකින් තොරව විකුණන ලද ජීවිත රක්ෂණ ඔප්පු, ඉතා කෙටි කාලයකින් වාරික ගෙවීම අත්හැරීම හේතුවෙන් අවලංගුවී යයි.

රක්ෂණ ව්‍යාපාරයේ සුභ සාධනය සඳහා මෙහෙවරක් මෙම පොත තුළින් ඉටුවෙයි. එමෙන්ම තම ලාංකික සහෝදර ජනතාවට ජීවිත රක්ෂණයේ වටිනාකම පිළිබඳ හොඳ වැටහීමක් ඇති කර, එය ලබා ගැනීමට දිරිගන්වමින් ඔවුන්ට මූල්‍යම අතින් ස්වාධීන වීම සඳහා අවශ්‍ය මූලික අංගයක් බව පෙන්වා දෙන මෙම පොත, සුරංජිත් විසින් ඉටු කිරීමට උත්සාහ දරන වටිනා සමාජ මෙහෙවරක් ලෙස අගය කිරීම වටියි.

ජීවිත රක්ෂණ උපදේශක නිලධාරීන් විසින් මෙම පොත පරිහරණය කරමින් ඔවුන්ගේ අලෙවි කුසලතාවන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය මූලික අඩිතාලමක් ලැබේවා යන්න මගේ නිරන්තර ප්‍රාර්ථනයයි.

**දීපාල් සූරියාරච්චි**
අධ්‍යක්ෂක - AIA රක්ෂණ සමාගම

# පටුන


පිටු අංකය

| | | |
|---|---|---|
| 1 | ජීවිතයේ ස්වභාවය | 13-18 |
| 2 | ජීවිත රක්ෂණ අවශ්‍යතා | 19-56 |
| 3 | ජීවන ගමනේ වෙනස් වන මූල්‍යමය අවශ්‍යතා | 57-72 |
| 4 | වෘත්තීන්වල ස්වභාවය අනුව වෙනස්වන මූල්‍යමය අවශ්‍යතා | 73-82 |
| 5 | ජීවිත රක්ෂණ අවශ්‍යතා ගණනය කිරීම | 83-86 |
| 6 | ජීවිත රක්ෂණයේ මූලික සිද්ධාන්ත සහ ආකල්ප | 87-92 |
| 7 | විවිධ ජීවිත රක්ෂණ වර්ග | 93-96 |
| 8 | ජීවිත රක්ෂණයක් මිලදී ගත හැකි ක්‍රම | 97-102 |
| 9 | ජීවිත රක්ෂණ අත්දැකීම් | 103-110 |
| 10 | සමාප්තිය | 111-112 |

12

# 1

# ජීවිතයේ ස්වභාවය

## 1.1 ජීවිතය යනු සිහින එකතුවකි!

අපේ ජීවිතය වටා රැඳුණු දේවල්වල අර්ථය වැටහෙන්නට පටන් ගත් දා සිට අප සැමකෙනෙකු ම සිහින මවනවා. 'මට ජීවිතයෙන් අවශ්‍යවන්නේ කුමක්ද? මා අනාගතයේ කවුරුන් විය යුතුද? මගේ ජීවිතය තුළ මම සම්පූර්ණකර ගතයුතු දේ මොනවාද? මගේ ආදරණීයයන් හා අන් අය වෙනුවෙන් මවිසින් කළ යුතු දේ හා මා ඔවුන් වෙනුවෙන් ඉතිරි කළ යුතු දේ මොනවාද?' ආදී බොහෝ කල්පනාවන් අපට ඇති වෙනවා.

ඕනෑම කෙනෙකු, ඔවුන්ටම වෙන්වූ සිහින ගොඩනගාගෙන ඒවා සාක්ෂාත් කරගැනීමට නිරන්තරයෙන් වෙහෙසෙනවා. ඔබේත්, මගෙත් ඒ සිහින අතර, 'හොඳ රක්ෂාවක් සොයාගන්න, එහෙමත් නැතිනම් තමන්ගේම කියල ව්‍යාපාරයක් ගොඩනගන්න, සල්ලි හොඳට ඉතුරු කරගන්න, ගෙයක් ඉඩමක් මිලට ගන්න, මටම කියලා වාහනයක් මිලට ගන්න, විවාහ වෙලා දරුවෝ හදන්න, සැප නිවාඩුවක් ගතකරන්න නැතිනම් පිටරට හෝ ලෝකේ වටේ සංචාරයකට යන්න,' වාගේ බොහෝ දේ ඇතුළත් වෙනවා.

මේ බලාපොරොත්තු හා සිහින මගින්, අපව, මුදල් උපයන්න හා ඉතිරි කරන්න මෙන්ම වෙහෙස මහන්සි වී වැඩ කිරීමටද ඉදිරියටම මෙහෙයවනවා. මෙහෙම යන ජීවිත ගමනේ දී අපට නොයෙක් ආකාරයේ අභියෝග, කරදර බාධා ඇතිවෙනවා. ඒවායින් සමහරක් අපට පාලනය කරන්නට පුළුවන්. නමුත්, බොහෝමයක් ඒවා අපට පාලනය කරන්නට නොහැකියි.

අනපේක්ෂිතව ඇතිවෙන මෙවන් කරදර හා අභියෝග නිසා අපි දුක් මහන්සියෙන් හම්බ කරගත්ත සියලුම ධනය නැති නාස්ති වී අපව දැඩි මූල්‍ය අර්බුදයක් කරා ඇද වැටෙන්න පුළුවනි. ඉතින් අප අපගේ බලාපොරොත්තු හා සිහින සඳහා වෙහෙසෙනවා වාගේම, මෙවැනි අනපේක්ෂිතව ඇතිවිය හැකි ජීවිත අවදානම් ගැනත් හොඳින් සිතාබලා ඒවාට සූදානම්

නොවුණොත්, ජීවිතය අපේ අරමුණු ඔස්සේ ඉදිරියට නොගිහින් ඉන් ඉවතට ඇදී විනාශ වී යන්නට පුළුවන්.

## 1.2 මිනිසුන් තුළ පවතින භය හයක්

අපේ ජීවිතවල බලාපොරොත්තු, සිහින වගේම නොයෙක් විධියේ බිය, අපගේ සිත්වල පවතිනවා. හිත්වල සැනසීම නැතිකර, අපේ ආත්ම විශ්වාසය පහළට ඇද දමන්න ඒවාට පුළුවන්.

පුද්ගල සාර්ථකත්වය පිළිබඳ සුප්‍රකට ග්‍රන්ථ ලේඛකයකුවන නැපෝලියන් හිල් විසින් රචිත ***"ද ලෝ ඔෆ් සක්සස්"*** නමැති ග්‍රන්ථයේ, පුද්ගලයකු තුළ ජීවිතය පුරාවට පවතින බිය 6 ක් ඇති බව සඳහන් කරයි.

ඒවා නම්,

- දුප්පත් වීමට ඇති බිය,
- මහලුවීමට ඇති බිය,
- විවේචනයට ලක්වීමට ඇති බිය,
- ආදරය නැතිවේ යයි ඇතිවන බිය,
- ලෙඩ වීමට ඇති බිය,
- මරණයට ඇති බිය.

ජීවිතවල සිහින හා බලාපොරොත්තු, පුද්ගලයින් ඉදිරියට මෙහෙයවයි; බිය ඔවුන් ආපස්සට ඇද දමා ඒ ඉදිරි ගමන වළකයි. හැමකෙනෙකුටම, මෙවැනි බාධක හා බිය පරදා ඉදිරියට යන්න අවශ්‍යයි. බියෙන් තොරව මානසික සුවයකින් යුතුව සතුටින් තම බලාපොරොත්තු හා සිහින මුදුන් පමුණුවා ගැනීමට අපි හැමෝටම යහපත් මාර්ගයක් අවශ්‍යයි.

# 1.3 මනුෂ්‍ය/මානව අවශ්‍යතාවයන්

බොහෝ මනෝවිද්‍යාඥයින්, පුද්ගලයින් ගේ මානව අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනය කර තිබෙනවා. ඒ අතරින්, ඒබ්‍රහම් එච් මැස්ලෝ නම් වූ මනෝවිද්‍යාඥවරයාගේ "මානව ජීවන අවශ්‍යතා විශ්ලේෂණය" ඉතා ප්‍රසිද්ධ වනවා. ඔහුගේ පරීක්ෂණයන්ට අනුව සෑම පුද්ගලයකුම මානව ජීවන අවශ්‍යතා 5 ක් අනුපිළිවෙලින් සපුරා ගැනීමට වෙහෙසෙනවා. එම අවශ්‍යතා ඇතිවන අවස්ථා අනුව අනුපිළිවෙලක් ද හඳුන්වා දී තිබෙනවා.

මෙම මානව ජීවන අවශ්‍යතා පිරමීඩයක හැඩයක් ගන්නවා. මුලින්ම තිබෙන්නේ, මූලික අවශ්‍යතාවයන්ය. ඒවා සපුරා ගන්නා තෙක් පිරමීඩයේ අනෙකුත් මට්ටම වල ඇති අවශ්‍යතා කරා යෑම ඇණහිටිනවා



සාමාන්‍ය කුඩා පවුලක් ගැන සිතමු. ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් වන්නේ කෑමට යමක් හා බීමට වතුර සොයා ගැනීම, ඇඳීමට ඇඳුම් හා සුරක්ෂිතව වාසය කිරීමට ස්ථානයක් යනාදියයි. මූලික අවශ්‍යතා සපුරා ගත් පසු ආරක්ෂාව, ස්ථාවර බව හා සෞඛ්‍යය වැනි ආරක්ෂක අවශ්‍යතා පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමුවේ.

ඔවුන්ගේ පළමු හා දෙවන අවශ්‍යතාවන් සම්පූර්ණ වූ පසු එම කුඩා පවුල තම පවුලේ සාමාජිකයින් ගණන වැඩි කර ගැනීමට, අන් අයගේ පිළිගැනීමට ලක්වීම, සමිති සමාගම්වල සාමාජිකත්වය ලබා ගැනීම හා සමාජයේ ප්‍රසිද්ධ පුද්ගලයින් බවට පත්වීම වැනි දේ පිළිබඳව සිතීමට පටන් ගනියි. මින් පසු මේ කුඩා පවුල් ඒකකය ඔවුන් වැනි වූ අනෙකුත් පවුල් ගෙවන ජීවන රටාවන් හා ක්‍රියාකාරකම් අනුගමනය කරයි. නිවසක් සෑදීම, වාහනයක් මිලට ගැනීම ආදිය ඒවා අතර වේ.

තුන්වන මට්ටමේ අවශ්‍යතා, එනම් සාමාජයීය අවශ්‍යතා සම්පූර්ණ කරගත් පසුවද මෙමෙ පවුල් ඒකකය සෑහීමට පත් වන්නේ නැත. ඔවුන් තවතවත් සැප පහසුකම් සොයා යාමට පෙළඹේ. දරුවන් වඩාත් ඉහළ මට්ටමේ පාසල්වලට යැවීම; වඩාත් සුවපහසු හා නවීන පන්නයේ නිවසක පදිංචිවීම; ඉහළ වෘත්තීයමය සුදුසුකම් සපුරාගෙන රැකියාවේ ඉහළ තනතුරු දැරීම; සුවපහසු, ඉඩ ඇති නවීන මෝටර් රථයක් ගැනීම; මිල අධික නවීන විලාසිතානුකූල ගෘහභාණ්ඩ වලින් නිවෙස් අලංකාර කිරීම හා ඔවුන් ජීවත්වන සමාජ පසුබිම තුළ පිළිගන්නා වැදගත් නායකත්වයන් දැරීම යනාදී විවිධ අවශ්‍යතාවයන් ඇතිවෙයි.

සිව්වන මට්ටමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරගන්නා පවුල් ඒකකයන් තව දුරටත් අතෘප්තිකරව ජීවත්වෙයි. ඔවුන් මෙවැනි ජීවින මට්ටමක සිටියද පූර්ණ ආත්ම-තෘප්තිය කරා එසේ නැතහොත්, උපරිම ආස්වාදය කරා යාමට ප්‍රයත්න දැරීම මනුෂ්‍ය ස්වභාවය වේ.

මනුෂ්‍ය ජීවිතය යනු සිහින, බලාපොරොත්තු මෙන්ම

අභිලාෂයන් වලින් පිරුණු දිගු ගමනක්. වඩාත් යහපත් හෙට දවසක් උදා කරගැනීමට, ජීවිතය විඳ ගැනීමට, තව තවත් සුවපහසුකම් හා විනෝදාශ්වාදයන් ලබා ගැනීමට, මුල්‍යමය සාර්ථකත්වයන් ළඟා කර ගැනීමට, ආදරය හා ගෞරවය ලැබීමට මෙන්ම සිය ආත්ම තෘප්තිය ළඟා කරගැනීමට සෑම කෙනෙකුම වෙහෙසෙනවා. මෙම ජීවන ගමන එක එල්ලේ දිවෙන මාර්ගයක පහසුවෙන් යා හැකි ගමනක් නොවෙයි. කුඩා අනපේක්ෂිත සිදුවීමකින් වුවද ජීවිතයක මහා වෙනසක් ඇතිකළ හැකිය.

# 2

# ජීවිත රක්ෂණ අවශ්‍යතා

# 2.0 ජීවිත රක්ෂණ අවශ්‍යතා

ජීවිත රක්ෂණය අපගේ මූල්‍ය අවශ්‍යතා සම්බන්ධව කටයුතු කරයි. එම මූල්‍ය අවශ්‍යතා "අපේක්ෂිත" හා "අනපේක්ෂිත" ලෙසට බාණ්ඩ දෙකකට වෙන් කෙරෙයි.

පවුලක අපේක්ෂිත මූල්‍ය අවශ්‍යතාවයන් වනුයේ; ඉතිරිකිරීම්, දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් හා විශ්‍රාමය වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම, දේපළ මිලට ගැනීම ආදී ඒවා වේ. අනපේක්ෂිත සිදුවීම්, එනම් මෙසේ වේ යයි කලින් දැකිය නොහැකි සිදුවීම් නම්; අකල් මරණ, හදිසි අනතුරු, රෝගාබාධයන් වැනි ඒවාය. මෙම අපේක්ෂිත හා අනපේක්ෂිත සංසිද්ධීන් දෙකටම විසඳුම් දිය හැකි වෙනත් කිසිදු මූල්‍ය උපාංගයක් ලොව නැති අතර ජීවිත රක්ෂණයේ සදා නොවෙනස් අද්විතීය බව මෙන්ම අසිරිය වනුයේ, එතුළින් පමණක් මෙම සංසිද්ධීන් දෙකටම විසඳුම් ලබා දීමට ඇති හැකියාවයි.

## 2.1. දිවියේ හොඳම ආදර හසුන

කසුන් සහ නාමල් හොඳ යාළුවො දෙන්නෙක්. මේ දෙන්නම පාසලේ 5 වැනි ශ්‍රේණියේ එකටමයි ඉගෙන ගන්නේ. ඒ විතරක් නෙමෙයි, මේ දෙන්නම අසල්වැසියෝ. හැමදාම වගේ මේ දෙන්නම හරි කැමතියි පාසලෙන් පස්සේ සෙල්ලම් කරන්න. දුවලා පැනලා සෙල්ලම් කරලා මහන්සි වුණාම දෙන්නම ගේ ළඟ තියෙන ගල් බංකුව උඩ වාඩිවෙලා තොරතෝංචියක් නැතුව දවස පුරා සිද්ධ වුණු දේවල් ගැන කතා කරනවා. කසුන් හරිම කැමතියි ඉස්කෝලේ එයාලා කරපු ක්‍රීඩා ගැන කතා කරන්න; ඉස්කෝලේ විශේෂයෙන් සිදු වුණු දේවල් වගේම සමහර වෙලාවල් වලදී හරිම වැදගත් මාතෘකා ගැනත් කතා කරනවා. කසුන් එක්ක සංසන්දනය කරනකොට නාමල් ටිකක් නිශ්ශබ්ද ළමයෙක්.

එක දවසක් සෙල්ලම් කරලා ඉවරවෙලා දෙන්නා මෙහෙම කතාවට වැටුණා. හිටි හැටියේම කසුන් නාමල්ගෙන් ටිකක් අමුතු ප්‍රශ්නයක් මෙහෙම අහනවා, “නාමල්, ඔයා දන්නවද ‘ඉන්ෂුවරන්ස්’ කියන්නේ මොකද්ද කියලා?” නාමල් ටිකක් කල්පනා කරලා මෙහෙම කියනවා, “ම්ම් ... මම නම් ‘ඉන්ෂුවරන්ස්’ කියන්නේ මොකද්ද කියලා දන්නේ නැහැ. ඒත්, මට ඇහිලා තියෙනවා අපේ අම්මා නම් නිතරම කියනවා, අනේ පුතාගේ තාත්තා ‘ඉන්ෂුවරන්ස්’ එකක් ගත්තා නම්, අක්කාටයි මටයි අපි කලින් ගිය ඉස්කෝලෙන් අයින් වෙලා මේ ඉස්කෝලෙට යන්නවත්, අපේ කාර් එකයි ගෙදරයි විකුණන්නවත් වෙන්නේ නැහැ කියලා. ඒ විතරක් නෙමෙයි, තාත්තා ‘ඉන්ෂුවරන්ස්’ කියන දේ ගත්තා නම්, අපිව තනියම ගෙදර තියලා අම්මාට වැඩට යන්නවත්, අපි ගැන හිතලා හැමදා ම රෑට අඬන්නවත් අම්මට වෙන්නේ නැහැ කියලා මට හිතෙනවා.”

නාමල් මෙහෙම කියනවා අහගෙන හිටපු කසුන් ආයෙමත් හඬ අවදිකළා. “නාමල්, එතකොට මේ ‘ඉන්ෂුවරන්ස්’ කියල කියන්නේ, ඔයාගේ තාත්තාට ඔයාලාට දීලා යන්න බැරිවුණු දෙයක් ද?” නාමල් පොඩ්ඩක් වෙලා බර කල්පනාවක ඉඳලා හොඳ දිග, හුස්මක් ගැඹුරින් අරගත්තා.

“මට මතකයි අපේ අම්මා මෙහෙ ආපු දවස්වල මට කීවා, පුතේ, ඔයාගේ තාත්තා අපිට දෙන්න පුළුවන් හොඳම දේවල් දුන්නා. අපි වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කළා. තාත්තා ගේ මුළු ලෝකෙම වුණේ අපි තුන්දෙනා. තාත්තා අපිට ගොඩාක් ආදරෙයි. ඒත් තාත්තා ගේ කාර්ය බහුල ජීවිතේ නිසා එයාට බැරිවුණා අපි වෙනුවෙන් එක් දෙයක් කරන්න. ඒ, එයාගේ ආදරය හෙට වෙනුවෙන් ආරක්ෂා කරන්න”.

"රක්ෂණයක් සැමවිටම මිලදීගෙන ඇත්තේ කෙනෙක් තවකෙනෙකුට ආදරය කරන නිසාය."

"ඒ කියන්නේ 'ඉන්ෂුවරන්ස්' කියලා කියන්නේ තාත්තා කෙනෙක් එයාගේ පවුලේ අයගේ ආදරය සුරක්ෂිත කරන ලියුමක් ද?" කසුන් ඇහුවා. ඇගේ කොනකින් මතුවුණු පුංචි කඳුළු බිංදුවක් කම්මුල දිගේ ගලා ගෙන යද්දී බිම බලාගෙන සෙමින් උරහිස් ගස්සා සිහින්ව හඬ අවදි කළ නාමල් කියනවා, "මම දන්නේ නැහැ කසුන්, අනේ අපේ අම්මා ගෙන් අහන්න."

**ඔබට ජීවිත රක්ෂණයේ වැදගත්කම දැන ගැනීමට අවශ්‍ය නම්, වැන්දඹුවකගෙන් අසන්න**

හැම අම්මා තාත්තා කෙනෙකුගේම එකම හීනය, තමන්ගේ දරුවන්ට දෙන්න පුළුවන් හොඳම දේ ලබා දෙන්නයි. දරුවන්ව සතුටෙන් තියන්න; දරුවෝ කන්න ආස දේවල් අරන්දෙන්න; දරුවෝ කැමති තැන්වලට එක්ක යන්න; දරුවන්ව හොඳම ඉස්කෝල වලට යවලා දෙන්න පුළුවන් ඉහළම අධ්‍යාපනයක් ලබා දෙන්න අම්මලා තාත්තලා නොවිඳිනා දුකක්, නොකරන කැපකිරීමක් නැහැ. ලෝකේ තියෙන හොඳම දේ තමන්ගේ දරුවන්ට ලබාදීම තමයි හැම අම්මා, තාත්තා කෙනෙක්ගේම එකම හීනය. සමාජයේ පිළිගන්නා වැදගත් මට්ටමකට පවුලේ හැමෝවම ගෙනවිත්, ලස්සන නවීන පන්නයේ ගෙයක් හදල දීලා හැමෝටම සතුටින් කාලය ගත කරන්න පුළුවන් විධියට පරිසරයක් ගොඩනගන්න දෙමවුපියෝ මුළු පවුලම උනන්දු කරවනවා.

මේ විධියට මුළු පවුලටම ලස්සන, සැප පහසුව පිරුණු, ජීවිතයක් ගත කරන්න පුළුවන් වෙන විධියට අම්මලා, තාත්තලා කැප වෙලා ආදරයෙන් කටයුතු කරනවා. එහෙම කරන්නේ

අනාගතයේත් දිගටම තමන්ගේ පවුලේ අයට ඒ සුව පහසු ජීවිතය දිගටම ඒ විධියටම පවත්වා ගෙන යන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුවකින්. පවුලේ බරපැන දරන්නා එහෙමත් නැත්නම් ප්‍රධාන ආදායම් උපයන්නා විධියට තමන්ගේ පවුලේ අයට මෙවැනි ජීවන රටාවක් දිගටම පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගත්තේ නැතිනම්, හදිසි අවස්ථාවකදී ඒ පවුල අන්ත අසරණභාවයට පත්වෙනවා; තමන් හුරුවුණු ඒ ලස්සන ජීවිත රටාව ගත කරන්න බැරි වෙනවා. ඒවගේ අසරණ උනොත්, දරුවෝ වෙනුවෙන්, මුළු පවුලේම අනාගතය වෙනුවෙන් මැවූ හීන බොඳවෙලා, නැතිවෙලා යනවා.

> **"කෙනෙකුට තමන්ව රැක ගැනීමට, ජීවිත රක්ෂණයක් මිලදී ගැනීම තරම් වටින වෙන කිසිඳු සුරක්ෂිත ක්‍රමයක් ගැන මට නොසිතෙයි."**
>
> **ලින්ඩන් බී. ජොන්සන්**

ගෙයක් මිලට ගැනීම හොඳ ආයෝජනයක්, ඒ නිවස ආදරයෙන් පිරුණු නිවසක් බවට පත්කිරීම හැම තාත්තා කෙනෙකුගේම වගකීමයි. තාත්තා හිටියත් නැතත්, ඒ ගෙදර ආදරය හැමදාමත් සුරක්ෂිතව තැබීම සහතික කිරීම හැම තාත්තා කෙනෙකුගේම වගකීමයි. නිවසක් හැමදාම පවතින ආයෝජනයක්. හැබැයි එම නිවාසය දේපලක් වශයෙන් පවුලකට අයිති වීමට නම්, එය ණය වලින් තොර නිදහස් දේපලක් විය යුතුයි.

අපගේ පවුලේ සෞභාග්‍යය, අපේ සිහින සාක්ෂාත්වීම රඳා පවතින්නේ ජීවිත රක්ෂණය මතයි. ජීවිතවලට බලපවත්නා කුරිරු අස්ථිරභාවයන් හමුවේ, ජීවිත රක්ෂණය තුළින්, අපේ සිහින හා අපගේ ආදරණීයයන්ගේ අනාගතය, වඩාත් සුරක්ෂිත කර දෙයි.

රක්ෂණය කියන්නේ දුරදර්ශී පුද්ගලයකු විසින්, ඉදිරියේ ඇතිවිය හැකි අනපේක්ෂිත සිදුවීමකට සූදානමක් ලෙස ගොඩනගන අරමුදලකි.

ෆ්ලුසිඩාට් Flucidate

"රක්ෂණය යනු, කිහිපදෙනෙකුට සිදුවන පාඩුවක් සමූහයක් අතර බෙදා ගැනීමයි."

ඩිස්නඩ්ල් Disnadle

## නිදර්ශන අංක 1 - පවුලේ ආදායම් උපයන්නා ජීවත්ව සිටියදී ...

යැපෙන්නන් ආදායම් උපයන්නා



ප්‍රීතිමත් පවුලක් හරියටම සමබර සීසෝවක් වාගේයි. සීසෝවෙන් ප්‍රධාන ආදායම් උපයන්නා හදිසියේ ඉවත් වුණොතින් සීසොවේ සමබර තාවය බිඳී යැපෙන්නන්ගේ ස්ථාවර බව නැතිවීයයි. යැපෙන්නන්ට නැවත නැගිට සිටීමට නොහැකි පරිදි පහළට ඇදවැටිය හැකියි.

## නිදර්ශන අංක 2 - පවුලේ ආදායම් උපයන්නාගේ අකල් මරණයක දී ...




දෙවෙනි නිදර්ශනයට අනුව හදිසියේ ප්‍රධාන ආදායම් උපයන්නා පවුල නමැති සීසෝවෙන් ඉවත් වුවහොත්, නිවැරදි හා සුදුසුම ජීවිත රක්ෂණ සැළසුමක් තුළින් පවුලේ යැපෙන්නන් හට පුරුදු ජීවන රටා එලෙසින් පවත්වාගෙන යාමටත් දරුවන්ට සුරක්ෂිත අනාගතයක් සාදා දීමටත් හැකිවෙනවා.

## 2.2 රක්ෂණයෙහි නියම අරුත වැටහුණු විට, යමෙක් එය මිලදී ගනියි.

ABC යනු වෙළෙඳපොළේ අංක 1 මූල්‍යමය සමාගමක්. අද, ABC සමාගමේ වාර්ෂික ව්‍යාපාර සැලසුම්කරණ වැඩමුළුවේ දෙවැනි දිනයයි. ඉහළ කළමණාකාරීත්වයේ හතළිස් දෙනෙකු මීට සහභාගී වන අතර එය පැවැත්වෙන්නේ තරු පහේ හෝටලයකය.

දිවා ආහාරය සඳහා වූ විවේකය අතරතුර ජීවිතාරක්ෂක ජැකට්ටුවක් (life saving jacket) විකිණීමට පැමිණි අලෙවිකරුවකු එය ලබා ගැනීමෙන් සිදුවන වාසි සහ ඔවුන් එය මිලදී ගැනීමේ වැදගත්කම මෙම

කළමණාකරුවන්ට සඳහන් කෙළේය. ඉන් එකක් රු. 1500 ක් මිල වන බැව් පැවසූ ඔහු ඔවුන් කැමති නම් ඒවා දැන් ඔවුන්ට මිලට ගැනීමට හැකි බව පැවසුවේය. ඔබ හිතන්නේ එම කළමණාකාරීත්වයේ සාමාජිකයින් අතරින් කී දෙනෙක් නම් ඒවා මිලට ගත්තේ ද? කිසිවෙකුට ඒ පිළිබඳ කිසිදු උනන්දුවක් නොවිණි. ඒ එම අලෙවි ඉදිරිපත් කිරීම ඔවුන්ට කිසිදු අදාළත්වයක් නොවූ නිසාත්, ඒ වාගේම එම භාණ්ඩයේ දැඩි අවශ්‍යතාවක් ඔවුන්ට නොදැනුණු නිසාත් ය.

පුරා දින දෙකක් පැවැත්වූ වාර්ෂික ව්‍යාපාර සැළසුම්කරණ වැඩමුළුව සාර්ථක ලෙස නිමා වූවා. වැඩමුළුවේ සාර්ථකත්වය සැමරීමට අවසාන දිනයේ විනෝද ගමනක් යාමට ප්‍රධාන විධායක නිලධාරීතුමා මේ පිරිසට ආරාධනා කළා. මේ හෝටලය පිහිටා තිබුණේ එක් පැත්තකින් මුහුදට සම්බන්ධ වන දර්ශනීය කුඩා කලපුවක් මැදයි. ප්‍රධාන පාරෙන් අතුරු පාරක් ඊට ඇතුල් වීමට කලපුව හරහා වැටී තිබුණත්, මේ කණ්ඩායම බෝට්ටු සවාරියකින් ප්‍රධාන මාවත වෙත යන්නට තීරණය කළා. කලපුව අවට සිරි නැරඹීමට හෝටලය විසින් යොදාගත් බෝට්ටුව පිළියෙළ කර දිවා ආහාරයත් එහිදීම ගැනීමටත් කලපුව වටා රවුමක් ගොස් ප්‍රධාන මාවතට ගොඩබැසීමටත් මේ පිරිස සැලසුම් කර තිබුණා.

බෝට්ටුව දියත් වෙලා ටික වෙලාවකින් මේ පිරිස සිංදු කියමින්, නටමින් විනෝද වෙන්නට පටන් ගත්තා. මුහුදට සම්බන්ධවෙන කොටසට ළං වන විට ටිකක් පාලනයෙන් තොරවූ මේ පිරිස බෝට්ටුව පදවන්නාට මුහුද දෙසට යන ලෙස බල කළා. ඒ මාර්ගය ගල්පර බහුල බව දන්නා බෝට්ටුවේ නියමුවා එය ඉතා අනතුරුදායක බව කීවත් පිරිසගේ පෙරැත්තය නිසා මඳ දුරක් එදෙසට පැදවූවා. හිටි හැටියේ මහා හඬක් සමගම බෝට්ටුව නතරවුණා. කාර්මික දෝෂයක් නිසා බෝට්ටුව නතරවුණු බව එහි කාර්ය මණ්ඩලය පැවසුවත්, බිම දිගේ වතුර ගලා ගෙන එන විට හැමෝටම

තේරුම් ගියේ බෝට්ටුව පතුල ගල් පරයක වැදී ඇති බවයි. වතුර කාන්දුවෙන වේගය අනුව ආපසු හරවා යාමට හැකියාවක් නොතිබුණි.

මෙය කෙටි බෝට්ටු චාරිකාවක් නිසා ජීවිතාරක්ෂක ජැකට්ටුද එම බෝට්ටුවේ තිබුණේ නැත. ජීවිතය බේරා ගැනීමට නම් ඇති එකම ක්‍රමය සියලු බඩු බාහිරාදිය අතහැර වතුරට පැන ගොඩබිම දෙසට පිහිනායාම බව බෝට්ටුවේ කාර්යමණ්ඩලය පැවසුවා.

හැමෝටම එවෙලේ මතක වුණේ ජීවිතාරක්ෂක ජැකට්ටු විකිණීමට පැමිණි අලෙවි නියෝජිතයාවයි. ජීවිත බේරගන්න වතුර සමග සටන් කරදදී එහි අගය හොඳින්ම දැනුණ ද මේ අවස්ථාවේ දී ඔවුන්ට එය මිලදී ගත නොහැකියි.

**ජීවිත රක්ෂණයක් වේලාසනින් මිලදීගත යුතු අතර අත්‍යවශ්‍ය අවස්ථාවේ එය ඔබ ළඟ නැතිනම් ඔබට එය කවදාවත් ලබාගැනීමට නොහැකි වනු ඇත.**

## 2.3 මානව ආර්ථික වටිනාකම [Human Life Financial Value සුරක්ෂිත කිරීම.

පුද්ගලයෙකු ගේ ජීවිතයකට වටිනාකමක් හෝ අගයක් නියම කළ නොහැකියි. ඒ, පුද්ගල ජීවිතයක් අමිල සම්පතක්වන බැවිණි. එනමුත්, පුද්ගලයකු විසින් ජීවිත කාලය තුළ උපයා ගත හැකි ආදායම අනුව ඒ පුද්ගලයාගේ මූල්‍යමය වටිනාකම තක්සේරු කළ හැකියි. උදාහරණයක් ලෙස, මාසිකව රු.100,000ක ආදායමක් උපයන, අවුරුදු 30ක් වයස කළමණාකාරවරයෙකුගේ මාසික මානව ආර්ථික වටිනාකම වන්නේ රු.100,000 කි.

ඔහු විශ්‍රාම යනතෙක් ඔහු විසින් උපයන සම්පූර්ණ ආදායම් ප්‍රමාණය කුමක් විය හැකිද?

විශ්‍රාම යන වයස අවුරුදු 55 ක් වේ නම්, රැකියාවේ නියැලීමට ඔහු සතුව ඇත්තේ තව අවුරුදු 25 කි. ඔහුගේ මුළු මානව ආර්ථික වටිනාකම කුමක්ද?

| | |
|---|---|
| මාසික ආදායම x 12 x වැඩ කිරීමට ඇති කාලය | = මුළු මානව ආර්ථික වටිනාකම |
| 100,000 x 12 x 25 | = 30,000,000 |

මෙම කළමණාකාරවරයාට විශ්‍රාම යනතුරු අවම වශයෙන් රු. 30,000,000 ක ආදායමක් ඉපයීමට හැකියාවක් තිබෙනවා. වාර්ෂික වැටුප් වර්ධක වැඩිවීම්, පාරිතෝෂික හා බෝනස් මෙන්ම රැකියා මට්ටමේ උසස් වීම් වැනි කාරණා හේතුවෙන් මෙම අගය තවත් ඉහළ යා හැකියි.

මඳක් කල්පනා කරන්න, වාර්ෂිකව රු. 1,200,000 ක මුදලක් උපයන යන්ත්‍රයක් ඔබ සතුව තිබේනම්, ඔබ එම යන්ත්‍රය රක්ෂණය කරනවාද? අනිවාර්යයෙන්ම ඔබේ පිළිතුර වන්නේ, "ඔව්" කියායි. ඉහත උදාහරණය අනුව බැලුවොත්, ඔබේ ජීවිතයත් හරියට එවැනි යන්ත්‍රයක් වගෙයි නේද?

ඉහත නිදර්ශනයේ සඳහන් කළමණාකාරවරයාට වයස අවුරුදු 30 දී අකල් මරණයක් සිදුවුණොත්, ඔහුගේ පවුලේ යැපෙන්නන්ට අවම වශයෙන් රු. 30,000,000 මුදලක් අහිමි වනවා. පවුලක ආදායම උපයන තාත්තා කෙනෙකුගේ අකල් මරණයක් නිසා එම පවුලට මරණ 3ක් සිදුවනවා.

1. පියෙකුගේ මරණය,
2. සැමියෙකුගේ මරණය,
3. ආදායමේ මරණය.

මෙම මරණ තුනටම සාධාරණ වූ පිළිතුරක් ලබා දිය හැකි කිසිදු මූල්‍යමය විසඳුමක් ලෝකයේ නැත. එනමුත් රක්ෂණය තුළින් පමණක් තුන්වැනි මරණය වන පවුලේ ආදායමේ මරණය වැළක්විය හැක. රක්ෂණය තුළින් පමණක් දරුවන්ගේ අනාගත සිහින සාක්ෂාත් කරදී මුළු පවුලම සුරක්ෂිත කළ හැක.

> "අවශ්‍ය පමණ ජීවිත රක්‍ෂණයක් ලබා ගැනීම, පුරවැසියන් බහුතරයක් අත රැඳුණු, කාලීන, සදාචාරාත්මක වගකීමකි."
>
> ෆ්රැන්ක්ලින් ඩී රූස්වෙල්ට්

## 2.4 අරමුදලක් ගොඩනගා ඉතිරිකිරීම - අරමුදල් සම්පාදනය

රක්ෂණය අද්විතීයයි. රක්ෂණය මගින් කුඩා වාරිකයක් ආයෝජනය කර විශාල ධනස්කන්දයක් ගොඩනැගිය හැකියි. රක්ෂණයට සමාන විසඳුමක් තවත් නැත; එවැනි ආයෝජනයක්, එවැනි රැකවරණයක් සපයන මූල්‍ය උපාංගයක් ලෝකයේ තවත් නැත.

| රු.1000 ක මුදලක් අවුරුදු 10 ක් පුරා තැන්පත් කිරීම | දින 20කට පසු සිදුවූ තැන්පත්කරුගේ අකල් මරණය සිදුවුවේ නම් ලැබෙන මුදල | අවුරුදු 10 කට පසු ප්‍රතිලාභය |
|---|---|---|
| බැංකුවේ තැන්පත් කිරීම | රු.1000 පොලිය + | රු.120,000 + පොලිය |
| ජීවිත රක්ෂණය | රු 100,000 | රු. 100,000 + ප්‍රසාද දීමනා |

- ජීවිත රක්ෂණයට රු.1000ක් ආයෝජනය කළ සැනින් රු. 100,000ක බුදලයක් එවෙලේම ගොඩනැගෙයි.
- බැංකුවෙන් ගෙවෙන්නේ තැන්පත්කරු එතෙක් තැන්පත් කළ මුදල හා ඊට එකතුවූ පොළී ප්‍රමාණය පමණයි.

| |
|---|
| **බැංකුවක්, ඉතිරිකර ගොඩනගයි;<br>රක්ෂණය, ගොඩනගා ඉතිරිකරයි.** |




## 2.5 ජීවිත රක්ෂණය අනිවාර්යය ඉතිරි කිරීමක්

මුදල් ඉපයීම හා ඉතිරිකිරීම එකිනෙකට වෙනස් නමුත් එකසේ අමාරු කාර්යයන් දෙකකි. ඉතිරි කිරීම මෙතරම් අමාරු වන්නේ ඇයි? ඊට හේතුව වන්නේ, පුද්ගලයින් තමන් කැමති දේවල්, ආහාර පාන හා හොඳ ඇඳුම් පැළඳුම් මිලට ගෙන ජීවිතය රසවිඳීමට වඩාත් ප්‍රිය කරන නිසාය. බොහෝවිට අවශ්‍යතාවට වඩා සිතට ප්‍රිය වූ දේ මිලට ගැනීමට පෙළඹෙන මිනිසුන් ඉක්මන් සන්තෘප්තිය ප්‍රිය කරයි. වියදම් කිරීම පමා කරමින් මුදල් ඉතිරිකිරීම සඳහා දැඩි විනයක් අවශ්‍යයි.

සාමාන්‍යයෙන් කරන ඉතිරි කිරීම, පහත ආකාරයෙන් දැක්විය හැකියි,

| ආදායම - වියදම් = ඉතිරි කිරීම් |
|---|

ඉහත සමීකරණයක් ආකාරයෙන් දැක්වූ ඉතිරි කිරීමේ ක්‍රමයේදී, වියදම් ප්‍රමාණය මත ඉතිරි කිරීමේ ප්‍රමාණය බෙහෙවින් රඳා පවතියි. වියදම, ආදායමට වඩා වැඩිනම් හෝ ආදායම් ප්‍රමාණයට සමාන වූවොත්, ඉතිරිකිරීම් කිසිවක් නැතිවෙයි.

අපට වඩාත් සුදුසු, ඥාණාන්විත ඉතිරි කිරීමේ ක්‍රමය කුමක්ද?

| ආදායම - ඉතිරිකිරීම් = වියදම් |
|---|

ඉහතින් දැක්වෙන ක්‍රමය අනුගමනය කරන කෙනෙක් ඉතිරිකිරීම වෙනුවෙන් පළමුව කොටසක් වෙන්කිරීමට පුරුදුවෙයි. මෙය ඉතාමත් සාර්ථක ඉතිරිකිරීමේ ක්‍රමයකි.

මොහොතක් සිතන්න. ඔබ රු.10,000ක් රැගෙන සැණකෙළියක් බැලීමට ගියොත් ඔබ අතින් නොදැනුවත්වම මුළු මුදලම වියදම් විය හැකියි. නමුත් ඔබ එම මුදලින් රු.2000ක් ගෙදර තබා, රු. 8000ක් පමණක් සැණකෙළියට රැගෙන ගියොත් ඔබ අතින් වියදම් වෙන්නේ ඒ ප්‍රමාණය පමණයි. මෙහිදී සිදුවූයේ ඉහත කී ඉතිරිකිරීමේ ආකාරය ක්‍රියාවේ යෙදීමයි. ඔබ ප්‍රථමයෙන් රු.2000ක් වෙන් කළ විට ඒ මුදල වියදම් නොවී ඉතිරි කර ගැනීමට ඔබට හැකිවූයේ එය වෙන් කිරීමට තිබූ කැපවීම හා විනය නිසයි.

ජීවිත රක්ෂණයක ඉතිරි කිරීම දිගු කාලයක් පුරා කැපවීමෙන් කළ යුතු දෙයක්. එය, සුරක්ෂිතව අරමුදලක් ගොඩනැගීමට ඇති සාර්ථකම ක්‍රමයයි. සාමාන්‍යයෙන් ඉතිරිකිරීම වඩාත් සාර්ථක වන්නේ එය බැඳීමක් ලෙස දැනුණු විටයි.

ඊයේ දවස ඇතුළත ඔබ විසින් සිදුකළ ක්‍රියාකාරකම් ඔබට මතකයට නගා ගත හැකිද? ඒ ක්‍රියාකාරකම් සඳහා ඔබ කොතරම් පැය ගණනක් ගත කළාද? දැන් ඔබ ඔබෙන් මෙසේ

ඇසුවොත්; ඔබට වුවමනාවක් තිබුණි නම්, ඊයේ දවස තුළ ඔබගේ කාලයෙන් විනාඩි තිහක්, වැදගත් යමක් කියවීම සඳහා වැයකළ හැකිව තිබුණා නේද කියා, අනිවාර්යයෙන්ම ඔබේ පිළිතුර වන්නේ "ඔව්" කියායි. එසේ නම්, ඔබ එවන් යමක් නොකියවූයේ ඇයි? ඊට හේතුව නම් ඔබට විනාඩි තිහක් වැදගත් යමක් කියවීම සඳහා ඔබට කිසිදු බැඳීමක් නොවූ නිසයි; එසේත් නැතිනම් එවැන්නක් කිරීමට ඔබ බැඳී නොසිටි නිසයි.

මේ ආකාරයටම, පසුගිය මාසය තුළ දී ඔබට වුවමනාව තිබුණේ නම් රු. 2000ක් ඉතිරි කරගැනීමට හැකියාව තිබුණිද, යන්න ඔබෙන් විමසුවොත්, ඔබ ඊටත් දෙන්නේ "ඔව්" යන පිළිතුරමයි. යමෙක් ඔබෙන් රු. 2000ක ණයක් ඉල්ලා ගත්තේ නම්, ඒ මාසය තුළ ඔබ කෙසේ හෝ තිබෙන මුදල පිරිමසා ගෙන ජීවත් වනවා නොවේ ද?

එසේනම්, යම් කිසි දෙයකට අප තුළ දැඩි ආශාවක් හෝ ඕනෑකමක් තිබෙනවිට, අපට ඊට අනුකූලව හැඩගැසිය හැකි බව ඒ අනුව ඔබට දැන් වැටහෙනවා ඇති.

අපි, අපේ පවුලේ අයට තදින් ආදරය කරනවා නම්, අපේ ආදරණීය යැපෙන්නන් ගේ අනාගතය සාර්ථකවෙනවා දකින්නට අප තුළ දැඩි ඕනෑකමක් තිබේනම්, අන් කිසිවකුගේ බලපෑමකින් තොරව, අපිම ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට ඒකාන්තයෙන්ම පෙළඹෙනවා. ඔවුන් කෙරෙහි අප තුළ පවතින දැඩි ඇල්ම නිසාම අප හැම කෙනෙකුම, ජීවිත රක්ෂණය ඔස්සේ දිගු කාලීන ඉතිරි කිරීමකට කැපවී, අඛණ්ඩව ඒ සඳහා මුදල් වෙන්කරනු නොඅනුමානයි.

**ජීවිත රක්ෂණය යනු, විනයානුකූලව ඉතිරි කිරීමයි**

## 2.5.1 දුප්පත්වීමෙන් වැළකීම- පවුල් ආදායම් රැකවරණය

දුප්පත්කම ඉතා වේදනාකාරී අත්දැකීමක්. අප බොහෝදෙනෙකුට ජීවිතයේ කොයි මොහොතක හෝ එම නීරස අත්දැකීම ලැබී ඇති බව නිසැකයි. අපේ සිතේ අපට ඉෂ්ට කරගන්න ආසා කරන දේ අපට ලබා ගන්න ඕනෑ කරන දේ බොහෝමයක් තිබුනත් ඊට අවශ්‍ය මුදල් අපට නොමැති විට, ඇතිවන්නේ මහා කනස්සල්ලක්, කලකිරීමක්. සමාජයේ එක් කොටසකට හොඳින් මුදල් තිබී ඔවුන් ජීවිතය සතුටින් විඳින අතර තවත් කොටසක් නීරස දුප්පත්කමේ කටුක බව අත්විඳින ආකාරය දකින විට මිනිසුන්ගේ මෙම කලකිරීම තවත් වැඩිවෙනවා. ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ ජනතාව දුප්පත්කමෙන් පීඩා විඳිනවා.

සමහරු දුප්පත්ව ඉපදුනත්, ඔවුන්ගේ දැඩි අධිෂ්ඨානයත් වෙහෙස මහන්සිවී වැඩකිරීමත් නිසා ලෝකය ජයගෙන ඔවුන් ජීවිතය සතුටින් විඳිනවා. තවත් සමහරු ධනවත්ව ඉපිද, ධනවත්ව ජීවත් වී, ධනවත්ව මිය යනවා. යම් ස්ථාවර මූල්‍යමය මට්ටමකට පැමිණි පසු මිනිසුන් ජීවිතය සතුටින් විඳිමින් සුරක්ෂිත සෞභාග්‍යමත් අනාගතයක් ලබා ගැනීම කරා ගමන් කරනවා. එය නැතිකර ගැනීමට කැමති වෙන්නේ නැහැ.

පවුලක ආදරණීය පියා නොසිතූ මොහොතක මරණයට පත්වුණොත්, එහෙමත් නැතිනම් හදිසි අනතුරක් හේතුවෙන් සදාකාලික අබලතාවයකට පත්වීම හෝ පිළිකාවක් වැනි අසාධ්‍ය රෝගාබාධයක් වැළඳීම වැනි විපත්තියකට ලක් වුණොත් ඒ පවුල හිටි හැටියේම දිළිඳුභාවයට ඇද වැටීමට ගත වන්නේ ඉතාමත් සුළු කාලයක්. එය මිනිසුන් සිතන්නට අකමැති තිත්ත ඇත්තක් වුණත් මේ ආකාරයේ අවස්ථාවන් සමාජයේ බොහෝ දකින්නට තිබෙනවා. මෙවන් වූ අවස්ථා ගැන සිතන්නට හා මුහුණ දීමට මිනිසුන් අකමැතියි. එවන් අවස්ථාවකට අවශ්‍ය වියදම් සකස්කරගෙන නොමැති පවුල් වලට අත්වන ප්‍රතිඵලය ඉතාමත් අභාග්‍ය සම්පන්නයි.

## වෙනත් කෙනෙකුට පැවරිය නොහැකි වගකීමකි.

රමේෂ් හා විසල් ජර්මන් ටෙක් ආයතනයේ ඩිප්ලෝමාව හදාරන කාලයේ දී හමු වුනු හොඳ යාළුවෝ දෙන්නෙක්. මේ දෙන්නම ඊට පස්සේ අවුරුදු 5 කට ඩුබායි ගිහින් යහමින් මුදල් උපයාගෙන ආපහු ලංකාවට ආවේ 2000 දීයි. දෙදෙනාම සාකච්ඡා කරලා එකට මුදල් යොදවලා ගරාජ් එකක් ආරම්භ කළා. වාහන වලට අවශ්‍ය සියලු සේවා සපයමින් ආයතනය හොඳින් දියුණු වුණා. රමේෂ් හා විසල් විවාහ වෙලා දරුවෝ දෙන්නා බැගින් ඉන්නවා. දෙදෙනාම ගෙවල් එක ළඟ හදාගෙන තියෙන්නේ. අපූරු දරුපැටවු ලැබිලා ඔවුන් එක්කම හිතේ සන්තෝෂයෙන් ඉන්න මේ දෙගොල්ලන්ගේ ජීවිතේ හරිම සුන්දරව ගෙවීගෙන යනවා.

මේ යාළුවො දෙන්නා අවුරුද්දකට වතාවක් ජපානෙට ගිහින් ගරාජ් එකට නිතර අවශ්‍ය වෙන වාහන අමතර කොටස් ගෙන්වා ඔවුන්ගේ පාරිභෝගිකයින්ට ඉක්මන් හා අනගි සේවාවක් ලබා දෙමින් හොඳ ආදායමක් උපයනවා. පසුගිය වතාවේ දෙන්නම පුරුදු විදිහටම ජපානේ ගිහින් තෝරාගත් වාහන අමතර කොටස් ලංකාවට පිටත් කරලා කටුනායක ගුවන් තොටුපළට ගොඩ බැස්සේ 2012 ජුනි 20 වැනිදා උදේ 1.15.

වෙනදා වගේම වෑන් එකක් කුලියට අරගෙන දෙදෙනා කොළඹට එන්න පිටත් වුණා. එදා උදේ 4ට විතර රමේෂ්ගේ බිරිඳටත් විසල් ගේ බිරිඳටත් පොලිසියෙන් ලැබුණු දුරකතන ඇමතුමෙන් ඒ දෙන්නගේ ජීවිත නොසිතූ විදිහට වෙනස්වුණා. වාවාගන්න බැරිවුණත් කටුක ඇත්ත වුණේ දරුපැටවුත් එක්ක ඔවුන් මේ ලෝකේ තනිවුණු බවයි; රමේෂ්වත් විසල්වත් ආයිත් කවදාවත් දකින්නට නොලැබෙන බවයි.

මේ යාළුවෝ දෙන්නා හැම දෙයක්ම කළේ එකට එකතුවෙලා; හැබැයි එක දෙයක් ගැන නම් දෙන්නට එකතු වෙන්න බැරි වුනා. ජීවිත රක්ෂණය ගැන දෙන්නට දෙන්නා එකිනෙකට

වෙනස් අදහස්, මති මතාන්තර දැරුවා. අන්තිමට විසල් විතරක් තීරණය කළා රුපියල් මිලියන 5 ක ජීවිත රක්ෂණයක් ගන්න. රමේෂ් හිතුවේ ජීවිත රක්ෂණය කියන්නේ අමතර වගකීමක් කියලයි.

සිය දයාබර සැමියා ගේ මරණය නිසා රමේෂ්ගේ බිරිඳට ඉතාමත් කනගාටුවෙන් වුණත් ඉඩ දෙන්න සිදු වුණා රමේෂ් ආදරයෙන් හදපු ගේ වෙන්දේසි කරන්න. බැංකුව රමේෂ්ගේ ගෙදර වෙන්දේසි කර ඔවුන්ගේ මුදල් අය කර ගත්තා. රමේෂ්ගේ බිරිඳට දරු පැටවු දෙන්නත් එක්ක, එක කාමරයයි සාලෙයි පුංචි කුස්සියයි තියෙන පොඩි ගෙයක් කුලියට අරන් යන්න සිද්ධ වුණා.

> ජීවිත රක්‍ෂණය යනු තවත් එක් වගකීමක් නොවේ; එය දැනටමත් ඔබ සතු වගකීම් ඉටු කිරීමට ඇති හොඳම විධියයි.

බිස්නස් එක නැවැත්වූවාට පස්සේ ඉතුරුවුණු සුළු මුදලින් ගෙවල් කුලී ගෙවා ගෙන ජීවිතය කොහොමහරි ගෙවන්න රමේෂ්ගේ බිරිඳ තීරණය කළා. නමුත් අනාගතය ගැන ඇයට ඇත්තේ විශාල බියක්. විසල්ගේ පවුල වෙනස්. ඒ ගොල්ලන්ට ලැබුණු රුපියල් මිලියන 5 ක මුදල ඔවුන්ට හොඳටම ප්‍රමාණවත්.

එයාලාට රුපියල් මිලියන 5න් ලැබෙන ආදායම නිසා ඉස්සර හිටියා වාගේම ඒ ජීවින රටාව පවත්වා ගෙන යන්න පුළුවන් වුණා.

ජීවිත රක්ෂණයේ අවශ්‍යතාවය හරියටම පැරෂූටයක් වගෙයි.

"ඔබට එය අවශ්‍ය වූ විට, එය ඔබ ළඟ නැතිනම් අන් කිසිදිනක එය ඔබට අවශ්‍ය නොවනු ඇත."



මිනිසුන් ඔවුන්ගේ නිවාස, භාණ්ඩ හා යාන වාහන රක්ෂණය කිරීමට බොහෝ උනන්දු වන නමුත්, නැතිවීමට බොහෝ ඉඩ ඇති, ඔවුන්ගේ පවුල්වලට වඩාත්ම වටිනා දේ වන, තමාගේ ජීවිතය, රක්ෂණය කිරීම මගහැරීම, හරි පුදුම, අසාමාන්‍ය දෙයකි.

**බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින්**

## 2.5.2 ජීවිත රක්ෂණය විශාල මානසික සහනයක්.

ඔබෙන් ඇසුවොත්, "ඔබ මැරෙන්න සූදානම්ද?" කියා, බොහෝ විට ඔබ පිළිතුරු දෙයි, 'මට දැන්ම මැරෙන්න බැහැ, මගේ වගකීම් සියල්ල ඉටු කරලා මම වයසට ගියාම මැරෙන්න සූදානම්' කියා. වයසට ගිහින් මියයාම ස්වභාවික හා අපේක්ෂිත දෙයක්. නමුත් රෝගයක් හෝ හදිසි අනතුරක් නිසා සිදුවන අකල් මරණයක් සඳහා කිසිවෙකුත් සූදානම් නැහැ. ඒවගේ දෙයකදී පවුලේ මූල්‍ය වගකීම්, පවුලේ අය වෙනුවෙන් ඉටු කරන්න බැඳී සිටින දේවල්, පවුලේ ආරක්ෂාව වගේ දේවල් වෙන කෙනෙකුට පවරන්න අපට බැහැ. නමුත් ජීවිත රක්ෂණයට හැකියාව තිබෙනවා එවැනි විපත්තියකදී පවුලකට අවශ්‍ය වන මූල්‍යමය සහයෝගය ලබා දීලා එම පවුල මූල්‍යමය අතින් සුරක්ෂිත කර ඔවුන්ගේ අනාගත බලාපොරොත්තු සැබෑ කර දෙන්නට.

### මසුරන් වටිනා සිහි කැඳවීමක්!

තිසර වාහන සමාගමක ඉංජිනේරුවරයෙක් වගේම ඒ සමාගමට ඉතා අත්‍යවශ්‍ය, වැදගත් පුද්ගලයින් අතරින් කෙනෙක්. සමාගමත් ඔහු වෙනුවෙන් විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කරන්නේ පුහුණු සඳහා යොමු කරලා ඔහුව තව තවත් සංවර්ධනය කර ඔහුගෙන් උපරිම සේවයක් සමාගමට ලබා ගන්නයි.

අවුරුද්දකට වතාවක් අනිවාර්යයෙන්ම තිසර ජර්මනියේ තියෙන තමන්ගේ සමාගමේ මව් සමාගමට යන්නේ එහි තියෙන නවතම නිපැයුම් හා ක්‍රියාදාමයන් හොඳින් අධ්‍යයනය කරලා තමන්ගේ සමාගමේ ඒවා දියත් කර ව්‍යාපාර ප්‍රතිඵල වර්ධනය කරන්නයි.

2013දීත් වෙනදා වගේම තිසර, ජර්මනිය බලා පිටත් වුණේ

2013 මාර්තු විසි තුන් වැනිදා යි. සාමාන්‍යයෙන් මෙය ඉතා දිගු ගමනක් වන අතර අවම වශයෙන් මුහුදු මට්ටමේ සිට අඩි 33,000 ඉහළින් තමයි ගුවන් යානය ගමන් ගන්නේ. එදා එකපාරටම ගුවන් යානයේ නියමුවා ඉදිරියෙන් ඇති වායුගෝලයේ වෙනස් වීමක් ගැන අනතුරු ඇඟවීමක් කළ අතර ගුවන් යානය අසාමාන්‍ය ලෙස ගැස්සෙන්නට පටන් ගත්තා. හැමෝම හරිම කලබලකාරී තත්ත්වයකට පත් වුණා. ගුවන් යානය හයියෙන් හෙලවෙන ගමන් පහළට වැටෙනවා වගේ දැනුණා.

ආසන පටි පැළඳ ගෙනම සිටින ලෙස හා ලබා දී ඇති ආරක්ෂාකාරී පියවරයන් අනුගමනය කරන ලෙසත්, හැමෝටම ගුවන් යානයේ නියමුවා තරයේ අවවාද කළා. ගුවන් යානය හයියෙන් හෙලවෙනකොට අත් දෙක හිස මත තියන් ආසනයේ ඉදිරියට නැමී ආරක්ෂාකාරී ඉරියව්වෙන් හිටිය තිසරට මතක් වුණේ තම ආදරණීය බිරිඳ හා පුංචි දරුපැටව් දෙන්න ගැනයි. තමන් නැතිව ඔවුන් මේ ලෝකේ තනිවී ජීවත් වෙන්නේ කොහොමද? තිසරට තමන්ගේ ආදරණීය බිරිඳගේ මුහුණ මැවිලා පෙනුණා.

තමන්ගේ පුංචි දරුවෝ දෙන්නාගේ අහිංසකව හිනා වෙන මුහුණු හිතේ ඇඳෙනකොට තිසරට කඳුලුත් ආවා. කලබලයත් එක්ක තිසරගේ හිතේ ඊට පස්සේ ඇඳුනේ බිරිඳත් දරුවොත් තමන් නැතුව අඬා වැළපෙන හැටියි. ඒ එක්කම තමන් නැතුව බිරිඳ රස්සාවක් හොය හොයා යන හැටි, ගේ විකුණලා කුලියට පොඩි ගේකට යන හැටිත් එක එක මිනිස්සුන්ගෙන් තමන්ගේ පවුලට වෙන බලපෑම මේ ඔක්කොම තිසරගේ හිතේ චිත්‍රපටියක් වගේ විදුලි වේගයෙන් දර්ශනය වුණා.

ගුවන් යානය ඇතුළේ මෙම කලබල වේලාව පුරාවටම තිසරට වහගෙන හිටපු ඇස් දෙක ඇතුළෙන් මැවී මැවී පෙනුණේ තමන් හදිසියේ මිය ගියා නම් පවුලේ අය ගේ එදිනෙදා වියදම් බලාගන්නේ, නිවාස ණය වාරික ගෙවන එක ගැන

බලන්නේ කවුද? නිවාස ණය නොගෙවුවොත් තමන් හදපු ලස්සන ගෙදරින් මගේ පවුලේ අයට යන්න වෙයි ද? මගේ බිරිඳ තනිවම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, ඔවුන්ගේ අනාගත සිහින වගේ දේවල් ඉෂ්ට කරගන්නේ කොහොමද? කියලයි. මේ වගේ දහසක් සිතිවිලිවලින් තිසර අසරණ වුණා. තිසරට දැනුණා තමන් තවම මැරෙන්න සූදානම් නැති බව.

> ඔබේ වැටුප තිබියදී වුවද, බොහෝ අමාරුකම් විඳගන්න සිදුවේ නම්, ඔබ නොමැති දවසක, ඔබේ පවුලේ අය කෙසේ නම් ජීවත් වේ ද?

මේ අතර ගුවන් යානයේ නියමුවා තත්ත්වය නැවතත් යහපත් අතට හැරුණු බව ප්‍රකාශ කළා. එනමුත් සුපරික්ෂාකාරී ලෙස ආසන පටි තද කර ගෙන සිටින ලෙසට ඔහු පැවසුවා. ඒ වෙලාවේ දෙවියන්ට මුළු හිතින්ම ස්තුතිවන්ත වෙමින් සිටි තිසරට, ජීවිතයටම අමතක නොවන පාඩමක් හිතට දැනුණා.

අනාගතයේ නැවත කිසිම දිනක, ආදර බිරිඳ හා දරුවන්ට තමන්ගේ හදිසි මරණයක් නිසා මුහුණ දෙන්න පුළුවන් අවදානම් තත්ත්වය, කිසිදවසක ඇති නොවෙන්න, හැකි ඉක්මනින්ම වග බලා ගන්නා බවට තිසර තමන්ටම ප්‍රතිඥා දුන්නා.

**මොහොතක් සිතන්න**

**"ඔබ ඊයේ රෑ හදිසියේ මිය ගියේ නම්,**

**ඔබේ පවුලේ අයට අද කුමක් විය හැකිද?**

**"ඔවුන් කුමක් කරනවා ඇතිදැයි ඔබ සිතන්නේ ද?"**

## 2.6.1 ජීවිත රක්ෂණය තුළින් බලාපොරොත්තු හා සිහින සුරක්ෂිත කරගනිමු.

විවේචනයට ලක්වීම කාටත් ඉතා අමිහිරි අත්දැකීමක්. ඒ වගේ නීරස අත්දැකීමකට ලක්වීමට කවුරුවත් කැමති නැහැ. පවුලක ආදායම උපයන තාත්තා කෙනෙක් ගේ හිස මත තම බිරිඳ හා දරුවන් වෙනුවෙන් ඉෂ්ට කළ යුතු යුතුකම් හා වගකීම් රාශියක් පැටවී තිබෙනවා. තාත්තා කෙනෙක්, තමන් නැති කාලයක බිරිඳ හෝ දරුවන්ගෙන් තමන් ඒ යුතුකම් හා වගකීම් හරියාකාරව ඉෂ්ට කළේ නැත යන අපවාදය හෝ විවේචනය එල්ලවෙනවාට කිසිසේත්ම අකමැතියි. තමන් නැති කාලෙක පවුලට නිසි ආදායම ලබාදෙන ලෙසට සැලසුම් කළේ නැති නම්, පවුලේ ආදායම් උපයන තාත්තා ගේ අකල් මරණයකදී බිරිඳට පවුල් බර හා වියදම් බර කරට ගැනීමට සිදුවනවා නොඅනුමානයි.

මුදල් නැතිකම නිසා බිරිඳට රැකියාවක් කරන්නට හෝ වෙන අයට අත පාන්න සිදු වුණොත්? දරුවන්ට පාසල් මාරු කරන්නට සිදු වුණොත්? ඔවුන් ගේ උසස් අධ්‍යාපන සිහින නැතිවී ඔවුන් හුරුවූ සැප පහසු ජීවිතය නැතිවී කටුක ජීවිතයක් ගත කරන්න සිදු වුණොත්? සමහරවිට ඒ දරුවෝ තාත්තාට හිතින් දොස් කියාවි. ඇයි අපේ තාත්තා හිතුවේ නැත්තේ එයාට අනාගතයේ මේ වගේ දෙයක් උණොත් කියලා? තාත්තා නැති කාලෙක අපිට ජීවත් වෙන විදිහක්, අපේ උසස් අධ්‍යාපනය, අපේ අනාගතය ගැන තාත්තා කලින් හිතුවෙ නැත්තේ ඇයි? කියලා දරුවෝ, බිරිඳ අසාවි. සමහර විටෙක තාත්තාට තිබුණු ආදරය නැතිවී තරහවක් ඒ හිත් වලට එන්නත් පුළුවනි.

අකල් මරණයක් වගේ කලින් නුදුටුව අභාග්‍යයක් ගැන කිසිවෙකුටත් දෝෂාරෝපණය කිරීම අනුවණ, නිෂ්ඵල ක්‍රියාවක්. ඒ වුණත්, පවුලක ආදායම උපයන්නා විධියට, එවන් අභාග්‍යයක් ඇතිවුණොත් කියා සිතලා, දූරදර්ශී වී, තම යුතුකම් හා වගකීම් සිතා බලා නිසි ලෙස සැලසුම් කළොත්, ඇතිවිය හැකි අනිටු

ප්‍රතිඵල අවම කරගත හැකියි. එසේ නැතිනම් වගකීම් පැහැර හැරියාට ඔහුට වගකීමට සිදුවෙයි; තම ආදරණීයයන්ගෙන් මෙන්ම සමාජයෙන්ද ඔහුව විවේචනයට ලක්විය හැකියි.

## ඉටු නොකළ පොරොන්දුව

අයියලා දෙන්නෙකුත් එක අක්කා කෙනෙකුත් ඇති කසුන් පවුලේ බාලයායි. පවුලේ බාලයා නිසාම එයාට හැමෝගෙම අවධානය ලැබුණා. නිතරම සෙල්ලමට බර කසුන් ඉගෙනගන්නවාටත් වඩා කැමති ක්‍රීඩා කරන්න. කසුන්ගේ තාත්තා, එඩ්වඩ් පෙරෙයිරා මහතා හොඳ ව්‍යාපාරිකයෙක්. එයා හරිම ආසයි පවුලේ හැමෝම සතුටින් ඉන්නවා දකින්න. කොහොම හරි හැමෝම එක්ක අවුරුද්දකට වතාවක් සතියක විතර පිටරට සවාරියක් එක්ක යනවාමයි. එක වතාවක් මේ හැමෝම සිංගප්පූරුවට ගියා. එදා ගුවන් යානයේ ගුවන් නියමුවා කසුන්ගේ තාත්තාගේ හොඳ යාලුවෙක්.

ගුවන් නියමු කුටියට කසුන්වත් කසුන්ගේ පොඩි අයියාවත් එක්කගෙන යන්න කසුන්ගේ තාත්තාට පුළුවන් වුණා. එදා කසුන් එතනදී ලබපු අත්දැකීම කසුන්ගේ හිතේ තදින්ම ඇඳුනා. ගුවන් නියමුවා යානයේ බොත්තම් එක එක ඔබලා, ගුවන් යානය හසුරුවන හැටි බලන් හිටපු කසුන් ගේ එකම අධිෂ්ඨානය වුණේ ලොකුවෙලා දක්ෂ ගුවන් නියමුවකු වෙන්නයි. ඉතින් වෙනදාට වඩා හොඳට ඉගෙන ගන්න උනන්දු වුණු කසුන්ගේ හීනය වුණේ ඇමරිකාවට ගිහින් එහෙ තියෙන හොඳම විශ්ව විද්‍යාලයෙන් ගුවන් යානා පැදවීමේ විද්‍යාව එහෙමත් නැත්නම් "එරෝනොටික්ස්" උපාධියක් කරලා දක්ෂ ගුවන් නියමුවකු වෙන්නයි. හරියටම අවුරුදු 9 කට පස්සේ කසුන් ලන්ඩන් උසස් පෙළ A පාස් 3ක් ගත්තා.

අම්මයි තාත්තයි හුඟාක් සතුටු වෙලා ඇමරිකාවේ විශ්ව විද්‍යාලයට ඉල්ලුම්පත්‍ර දැම්මා. මේ කාලය වෙනකොට

කසුන්ගේ පවුලේ අනිත් සහෝදර සහෝදරියනුත් අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළ අතර වැඩිමහල් සහෝදරයා මොරටුව ඉංජිනේරු පීඨයට ඇතුළත් වුණා; දෙවැනි අයියා පෞද්ගලික විශ්ව විද්‍යාලයක ව්‍යාපාර උපාධියට ඉගෙන ගන්නා අතරම අක්කා පෞද්ගලික ආයතනයක් තුළින් ගණකාධිකරණය සම්බන්ධ (CIMA - චාටඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් මැනේජ්මන්ට් එකවුන්ටන්ට්ස්) සඳහා ඉගෙනගනිමින් හිටියේ.

මාස දෙකකට පස්සේ කසුන්ට ඇමෙරිකා විශ්ව විද්‍යාලයකින් ලිපියක් ඇවිත් තිබුණා එයාව එහි ඉගෙන ගන්න තෝරාගත් බව දන්වමින්. නමුත් කසුන් ඒක උඩින් පල්ලෙන් කියවලා කිසි කෙනෙකුට ඒ සතුටු ආරංචිය නොකියාම ගුලිකරලා විසිකර දැම්මා. ඒ ආරංචිය කසුන්ට ගෙනාවේ දුකක් විතරයි. ඊට පස්සේ කසුන් කාමරය ළඟ කොරිඩෝ එකේ වාඩිවුණා. ඒ වෙනකොට කසුන් ගේ තාත්තා ගාල්ලේ ඉඳන් අධිවේගී මාර්ගයේ එන අතරතුර හදිසි අනතුරකින් සදහටම පවුලෙන් වෙන්වෙලා මාසයක් ගත වෙලා. කසුන්ගේ තාත්තා ලොකු ව්‍යාපාරිකයෙක් වෙලා හිටියාට ව්‍යාපාර සඳහා බැංකු වලින් විශාල ණය මුදල් අරන් තිබුණා. තාත්තා ගේ මරණයෙන් පස්සේ ඒ බැංකු වලට ව්‍යාපාරය සින්න වෙලා බැංකුව එමගින් ණය පියවා ගත්තා. කසුන්ගේ අයියලාටත් අක්කාටත් යන එන මග හිතා ගන්න බැරිව හිටියේ. ඉදිරියට ඉගෙන ගන්නවද, රස්සාවක් කරලා ගෙදර වියදම් පියවනවද කියල එයාලා කල්පනා කළා. තාත්තා ඇයි අපව මේ තරම් අසරණ කළේ කියලා කසුන්ට තරහා ගියා.

කසුන් තාත්තා ගැන මෙහෙම කල්පනා කර කර ඉන්නකොට අම්මායි අයියලා දෙන්නයි අක්කයි එතනට ඇවිත් කසුන් ළඟ වාඩිවුණා. කසුන් ඉන්න හැටි දැකලා, අම්ම ළං වෙලා කසුන්ගේ ඔලුවත් අත්දෙකත් අතගාලා අහනවා, "කසුන්, ඇයි පුතේ? විශ්ව විද්‍යාලෙට තෝරගත්තා කියන ලියුම ආවා ද" කියලා. කසුන් ඔලුව වනලා 'ඔව්' කියා කසුන් අම්මා ගෙන් මෙහෙම අහනවා. "ඇයි අම්මේ තාත්තා මේ තරම් මට බලාපොරොත්තු දුන්නේ?"

**කිසිවෙක් අසමත් වීමට සැලසුම් නොකරයි.**
**නමුත් බොහෝ දෙනා සැලසුම් කිරීමට අසමත් වෙති.**




ඉහත දක්වා ඇති පරිදි පවුලේ ආදායම හිටි හැටියේ නතර වුවොත් දැනට සිටින ජීවන මට්ටම පහළට ඇද වැටී පවුලේ සිහින බොඳ වී යා හැක. ජීවිත රක්ෂණයක් මගින් නැතිවූ ආදායම, එනම් ඉහත රූපසටහනෙන් දැක්වෙන පරිදි ජීවිත රක්ෂණය මගින් නැවත එලෙසින්ම ලබා දෙන්න හැකියාව තිබෙනවා. එවිට ගත කළ ජීවන මට්ටම එලෙසින්ම පවත්වා ගෙන යන්න ඒ පවුලේ අයට පුළුවන්.

**දරුවෙක් උස් මහත් කරන්න කොපමණ වියදමක් අවශ්‍යද?**




**ඔබ ජීවත්ව සිටියේ නැතිනම් දරුවාගේ සාර්ථකත්වය පිළිබඳ ඔබ සහතික වන්නේ කෙසේ ද?**

## 2.6.2 දරුවන්ගේ අනාගතය සුරකිමු

පවුලක් සතුටින් කාලය ගතකරන්නට අත්‍යවශ්‍ය අංග තමයි ආදායම, ආරක්ෂාව හා ආදරය. ආදරය හරියටම රෙදි කැබැල්ලක පුංචි නූල් වාගෙයි. හරියටම ඒ නූල් ශක්තිමත්ව බැඳී තිබෙනවා වාගේම පවුලක සාමාජිකයින් එකිනෙකා කෙරෙහි තදින් බැඳ තබන්නේ ආදරය මගිනි. බිරිඳ හෝ සැමියා, දරුවන්, දෙමවුපියන්, සහෝදර සහෝදරියන් වෙනුවෙන් අපි බොහෝ දේවල් කරන්නේ ඔවුන්ට අපි ආදරය කරන නිසායි. අපේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් අපි නොයෙක් පොරොන්දු දෙනවා; කැපකිරීම් කරනවා, සැලසුම් හදලා ඔවුන්ට ලස්සන, සැපවත් ඒ වගේම ස්ථිර අනාගතයක් හදලා දෙන්න වෙහෙසෙනවා. පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා ජීවත්ව සිටියොත්, එවැනි පොරොන්දු ඉටු කිරීම ගැනවත්, කැපකිරීම් කිරීම ගැනවත් කිසිම සැකයක් නැහැ; නමුත් ආදායම උපයන පුද්ගලයාට නිතරම තිබෙන බිය තමයි මේ සියලු යුතුකම් හා වගකීම් ඉෂ්ට කරන්නට තමන්ට මේ ලෝකේ ජීවත් වීමට වාසනාව නැතිවුණොත් තමන්ගේ පවුලේ ආදරණීයයන් ට කුමක් වේවිද? යන්න. ආදායම ගෙන එන තාත්තා ඒ පවුලට තමන් ගේ ආදායම ඉදිරියට ලැබෙන විධියට සුරක්ෂිත කළොත්, ඒ පවුලේ හැමෝටම තාත්තා මේ ලෝකේ නැති දාකට වුණත් තාත්තා ගේ ආදරය ජීවමානව දැනේවි. ඒ නිසයි, තාත්තා කෙනෙකු තමන්ගේ පවුලේ අයට ලියන වටිනාම ආදර හසුන 'ජීවිත රක්ෂණය' යයි කියන්නේ.

## ආදරය සහ මුදල්

*බිස්කට් නිපදවන ප්‍රසිද්ධ සමාගමක අලෙවි කළමනාකරුවෙකු ලෙස චෝලිත සේවය කරයි. ඔහු අවුරුදු 20 දී පාසලේ පෙම්වතිය, නිමේෂි එක්ක විවාහ වුණා. දෙන්නාගේම දෙමවුපියෝ මේ කටයුත්තට බොහෝම විරුද්ධ වුණ නිසා එයාලාගේ ආශිර්වාදය මේ දෙපලට ලැබුණේ නැහැ. නමුත්*

මේ දෙන්න විවාහ වෙලා වෙනමම පදිංචියට ගියා. චෝලිත කොළඹ රැකියාව කරන නිසා දෙමවුපියන්ගෙන් ඈත්වෙලා සැහැල්ලු සරල ජීවිතයක් ගත කරන්න ඔවුන්ට පුළුවන් වුණා.

හරියටම අවුරුදු දෙකකට පස්සෙ චෝලිත, හරිම හුරුබුහුටි දූ සිඟිත්තියකගේ තාත්තා කෙනෙක් වුණා. චෝලිතගේ රැකියාවේ ස්වභාවය නිසා නිතර කොළඹින් පිට යන්න සිදුවුණා වගේම දින කිහිපයක් ගෙදරින් පිට ඉන්න සිදුවෙනවා. ඒ දවස් වලට නිමේෂිට, දූ පොඩිත්තියත් එක්ක ගෙදර තනියම ඉන්න වුණා. ඒත් අසල්වාසීන්ගෙන් ලැබුණු සහයෝගය නිසා චෝලිතට බයක් නැති ව වැඩකරගෙන යන්න පුළුවන් වුණා. දුව ලැබිලා අවුරුදු 6ක් ගත වුණත් මේ දෙන්නා තවත් දරුවෙක් ගැන හිතුවේ නැත්තේ මාසයෙන් බාගයක්ම චෝලිත ගෙදරින් පිට ඉන්න නිසයි, ඒ වගේම තනියෙන් නිමේෂිට දරුවන් දෙන්නෙක් බලාගන්න අමාරු නිසයි.

2011 ජුලි මාසේ චෝලිත අනුරාධපුරේ වැඩකරන අතරේ උණ රෝගයක් වැළඳුණා. වැඩ අධික නිසා ඒ තරම් රෝග තත්ත්වය ගණන් නොගෙන චෝලිත පැරසිටමෝල් අරන් දවස් 4 ක් ම එක දිගට වැඩ කළා. ගෙදර එන දවසේ චෝලිතට ඇවිද ගන්න බැරි තරමට දුර්වල වෙලායි හිටියේ. ගෙදර එනකොට හොඳටම අමාරු වූ නිසා චෝලිතව, නිමේෂි කෙලින්ම රෝහල්ගත කළා. එතනදී හොයා ගත්තේ චෝලිතට හැදිලා තියෙන්නේ මාරාන්තික ඩෙංගු උණ කියලයි. ‘මට ඉහෙන් බහින ලෙඩක් නෑ’ කියල නිතර කියන චෝලිත, වැඩ කරලා තියෙන්නේ තමන් හොඳ සෞඛ්‍ය සම්පන්නයි, කියල හිතා ගෙනයි. ඉතින් මේ හදිසියේ හැදුනේ නිකන්ම උණක් කියල ගණන් නොගෙන පැරසිටමෝල් විතරක් බීලා දවස් 4 ක් එක දිගට මහන්සි වුණා; හරියට බෙහෙතක් ගත්තේත් නැහැ. චෝලිතට හැදුනු මේ මාරාන්තික රෝගය නිසා අන්තිමට චෝලිතට තමන්ගේ බිරිඳවත් තමන්ගේ දරු පැටියා වත් අඳුනා ගන්න බැරි තරමට සිහි මඳ ගතියෙන්

හිටියේ. ඉස්පිරිතාලේ ඇඳේ ගොඩාක් දුක්විඳපු චෝලිත, තමන්ගේ බිරිඳත් පුංචි දියණියත් මේ ලෝකේ තනි කර දාල, සදහටම දෑස් දෙක පියාගත්තා.

චෝලිතගේ රස්සාවෙන් ලැබුණු පඩිය හැරුනාම වෙන කිසිම ආදායමක් චෝලිතගේ පවුලට තිබ්බේ නැහැ. චෝලිතගේ මරණෙන් නිමේෂි ගොඩාක් අසරණ වුණා. ආයිත් අම්මලා ළඟට යන්න සිද්ධ වුණේ නිමේෂිගේ අතේ සල්ලි කීයක්වත් නැති නිසායි. අම්මලාගේ ගෙදර අවුරුද්දක් විතර හිටිය කාලය තුළ නිමේෂිට අහන්න සිද්ධ වෙච්ච දේවල් කොයි තරම් කටුක වුණත්, දුව නිසා ඒවා ඉවසගෙන හිටියා. අවුරුද්දක් විතර ගත වෙනකොට නිමේෂිගේ අම්මා නිතර නිමේෂිට බල කරන්න පටන්ගත්තා ආයිත් විවාහ වෙන්න කියල, මොකද පොඩි දරුවෙක් බලා ගෙන තනියම ජීවත් වෙන්න බැරි නිසා. අම්මලා සොයා දුන්නු පුද්ගලයා එක්ක විවාහ වෙන්න නිමේෂි අකමැති වුණේ දුවගේ අනාගතය ගැන හිතලා. කොහොමවුණත් අන්තිමේදී අම්මලාගේ බල කිරීමට අකමැත්තෙන් වුණත් නිමේෂිට කමල් එක්ක විවාහ වෙන්න සිද්ධ වුණා.

නිමේෂි හිටියේ හරිම දුකින්. පාසල් කාලයේ පෙම්වතා ඉන්පස්සේ තමන්ගේ ආදරණීය සැමියා වුණු චෝලිතගේ වියෝව සමහර දවස්වලට නිමේෂි ට දරාගන්න බැරිතරම්. සමහර දවස්වල නිමේෂිට චෝලිත ගිය ලෝකෙට යන්න හිතුණු වාර අනන්තයි. ඒත් චෝලිත ගේ ඇස් දෙක වගේ ඉන්න දුව දකින කොට ඒ අහිංසක දරුවාට තාත්තයි අම්මයි දෙන්නම නැතිකරන එක කොයි තරම් අපරාධයක් ද කියලා හිතෙනවා. නිමේෂි ආයිත් අම්ම කෙනෙක් වෙන්න යන නිසා පුංචි දිනිති දුව ගැන ලොකු බයක් දැන් එයාට තියෙනවා; දුවට ඉස්සර වගේම ආදරය දෙන්න පුළුවන් වෙයිද කියල. මොකද නිමේෂිගේ දෙවැනි සැමියා කමල්, අලුත් බබාට හොඳ අවධානයක් දෙන්න ඕනේ කියලා පුංචි දිනිතිව අම්මලාගේ ගෙදර හරි පාසල් නේවාසිකාගාරේ හරි නවත්තන්න කියල බල කරනවා.

*ආදරයක් නැතිවීමේ වේදනාව නිමේෂිට හොඳට තේරෙනවා ඒ නිසාම ඒ වගේ දුකක් දුවට දෙන්න නිමේෂි කැමති නැහැ. දුවට ඉන්නේ තමන් විතරක් බව හිතෙන කොට නිමේෂිට හිතුණේ අනේ මට සල්ලි තිබ්බා නම් කාගෙවත් බල කිරීමට දුවව වෙන් කරන්න වෙන්නේ නැහැනේ. එතකොට කවුරුවත් තමන් ගේ ජීවිතේට ඇඟිලි ගහන්න, බලපෑම් කරන්න එන්නේ නැහැනේ, තමන්ට දුවත් එක්ක තනියෙන් සතුටෙන් පාඩුවේ ජීවත් වෙන්නත් පුළුවන්. එහෙම වුණා නම් චෝලිතගේත් නිමේෂිගේත් එකම හීනය වුණු දුවට තමන්ගේ මුළු අවධානයම දීලා, එයාගේ අනාගතයේ බලාපොරොත්තු ඔක්කොම ඉෂ්ට කරලා දෙන්න පුළුවන්කම තිබුණා.*

**“අදත්, හැමදාමත් මා, ජීවිත රක්‍ෂණය තරයේ විශ්වාස කරනවා. දුප්පත් මිනිසෙකුට වුවත්, තම බූදලයක් ඉන් ගොඩනගා ගත හැකියි. එසේ ගොඩනගා ගත් පසු තමනට කුමක් වුවත්, තම පවුලේ අය සුරක්ෂිතව සිටින බව දන්නා ඔහුට දැනෙන්නේ සංතෘප්තිකර හැඟීමකි.”**

**හැරි.එස්. ට්රූමන්**

**එක තාත්තා කෙනෙකුට පුංචි දරුවන් 4 දෙනෙකු රැක බලා ගැනීමට හැකි වුණත්, පුංචි දරුවන් 4 දෙනෙකුට, අසනීප වූ හෝ අකර්මණ්‍ය වූ එක තාත්තා කෙනෙක් රැක බලා ගත හැකි වේද?**

## 2.7 සෞඛ්‍යය රැකවරණය

බරපතල ලෙඩ රෝග හැදෙන්නේ හරිම අනපේක්ෂිතව; නමුත් එහෙම දෙයක් වුණොත්, ඒ නිසාම, අපට රස්සාව නැතිවෙන්න පුළුවන්, වෛද්‍ය ප්‍රතිකාර වලට යන වියදම් හේතුවෙන් අප දරුවන්ගේ අනාගතයට, අපේ විශ්‍රාමයට හෝ පවුලේ ඉදිරි වැඩවලට ඉතිරි කරලා තිබුණු හෝ ආයෝජනය

කරලා තිබුණු ධනය වියදම් වෙන්න පුළුවන්. පිළිකාවක් වගේ බරපතල රෝගයක් හැදුණොත් මුළු ජීවිත කාලය පුරාවටම දුක් විඳින්න සිදු වෙනවා විතරක් නොවෙයි ඉතුරු කරලා තිබුණු සල්ලි ඔක්කොම වියදම්වෙලා යනවා. ඒවගේම මුළු පවුලම හරිම දුක්ඛිත තත්ත්වයකට ඇද වැටෙන්න පුළුවන්. පවුලේ සිහින හා බලාපොරොත්තු නැතිවෙලා යන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, සමහර විට මුළු රටටම ණය වෙලා පවුල් නැති නාස්ති වෙලා යන්න පුළුවන්. නමුත් මේ වගේ අවාසනාවන්ත වෙන්නේ නැතුව අනාගතයේ වෙන්න පුළුවන් කියල හිතෙන මෙවැනි රෝගාබාධයක් නිසා තමනුත්, තමන්ගේ පවුලේ අයත් රැකගන්න හිතනවා නම් කොච්චර හොඳද? අපි එතරම් අවාසනාවන්ත නැහැ. හොඳින් සැලසුම් කරලා ලබා ගන්න රැකවරණයකින්, පවුලේ අයගේ කරපිටට මූල්‍යමය වශයෙන් බරක් නොදී, හොඳම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න ඕනෑකරන ප්‍රමාණයේ මුදලක් මෙමගින් ලැබෙනවා.

## අහිමි වූ අවස්ථාව

*කුසල් කොළඹ හෝටල් පාසලේ නියෝජ්‍ය විදුහල්පතියි. හැමෝම එයාට බොහොම කැමතියි ඒ වගේම එයා කවුරුත් පිළිගත් හොඳ ගුරුවරයෙක්. කුසල්ගේ බිරිඳ ගෘහණියක් වන අතර ඔවුන් දෙදෙනාට ලස්සන දුවලා තුන් දෙනෙක් හිටියා. කුසල්ට අවුරුදු 36 ක් වයස කාලෙදී තමයි ඉයන් කියලා එයාගේ පරණ ගෝලයෙක් හම්බ වුණේ. ඉයන් පිටරට ගිහින් විදේශ හෝටල් වල උසස් රැකියා කරලා නැවත ලංකාවට ඇවිත් තිබෙන්නේ ළඟදියි. ඉයන් රට ඉන්නා කාලේ හොඳට සල්ලි හම්බ කරලා තියෙනවා. එයා ඒකෙන් තමන්ගේම කියල වාහන ගෙන්වන ව්‍යාපාරයක් ආරම්භ කරන්න යන අතරතුරේදී රක්ෂණ සමාගමකටත් ඔහුට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. ඉයන්ට තමන් ගේ පළමුවෙනි රක්ෂණ ඔප්පුව අලෙවි කරන්න ඕනෑ වුණේ තමන්ගේ හෝටල්*

පාසලේ ගුරුවරයාටයි. ඉයන් කුසල්ට අසාධ්‍ය රෝග ආවරණය සහිත, රු.750,000 ක රක්ෂණාවරණයක්, යෝජනා කළා. කුසල්ට හිතුණා ජීවිත රක්ෂණයක් මිලදී ගන්න එක බුද්ධිමත් වැඩක් කියලා මොකද කුසල්ට හිටියේ දුවලාම තුන් දෙනෙක්. හදිසියේ හෘදයාබාධයක් වගේ ලොකු ලෙඩක් හැදුණොත් නැතිනම් බයි පාස් එකක් හරි කරන්න වුණොත් කියලා සෞඛ්‍යාවරණයක ඕනෑකමකුත් කුසල්ට තදින්ම දැනුණා.

කුසල් මේ ජීවිත රක්ෂණය ගැන විස්තර බිරිඳට කියූ ගමන්ම ඇය ඒක ප්‍රතික්ෂේප කළා. එවැනි දෙයකට මුදල් යොදවනවා කියන්නේ සල්ලි නාස්ති කිරීමක් කියලයි බිරිඳ කීවේ. කුසල් නැති කාලෙක බිරිඳට සල්ලි නෙමෙයි, කුසල්වම තමයි ඕනේ කියල බිරිඳ කීවා. ඉයන්ට බැහැ කියන්න බැරි නිසාත් බිරිඳ එපා කියන නිසාත් කුසල් හිටියේ හරි ප්‍රශ්නෙකට මැදිවෙලා. පළමුවෙනි ඔප්පුව තමන්ට දීලා වෘත්තිය සාර්ථක කරගන්න උත්සහ කරන ඉයන් වගේ තමන්ගේ ගෝලයෙකුට බෑ කියන්නත් බැහැ නේ. අන්තිමේදී කුසල් තීරණය කළේ ඔප්පුවේ වටිනාකම රු. 250,000 කට අඩු කරලා අසාධ්‍ය රෝග ආවරණයත් එක්ක මිලට ගන්න, හැබැයි බිරිඳට කිවේ නැහැ. බිරිඳගෙන් මේ කාරණය වසන් කළත් කුසල්ට ඒක වරදක් කියා දැනුණේ නැත්තේ, මේ ක්‍රියාවෙන් පවුලට හොඳක් වෙනවා මෙන්ම ජීවිත රක්ෂණය භුක්ති විදින්නෙත් කවදා හරි ඒ අයම නිසයි. රක්ෂණ සමාගමේ වෛද්‍ය පරීක්ෂණයෙන් පස්සේ කුසල් හොඳ ශරීර සෞඛ්‍යයෙන් සිටින බවට තහවුරු වී, රක්ෂණ ඔප්පුව නිකුත් කළා.

හරියටම මාස තුනක් ගතවුණාට පස්සේ, එකපාරටම කුසල්ගේ වමතේ නොනවතින දැඩි වේදනාවක් ඇතිවුණු නිසා දොස්තර මහතාට පෙන්නුවාම, එතනදී අනාවරණය වුණේ ඒ වේදනාව බරපතළ හදවත් රෝගයක රෝග ලක්ෂණයක් බවයි. වහාම බයිපාස් ශල්‍යකර්මයක් කරන්න කියලා දොස්තර කුසල්ට දැන්නුවේ ඉදිරියේදී ඇතිවෙන්න පුළුවන් හෘදයාබාධයක් වළක්වගන්නයි. මේ ශල්‍යකර්මයට වැය වන මුළු මුදල ගණන

*බැලුවාම රු. 700,000 වුණා. ඉයන් අදාළ ලියුම් හා අනෙක් වාර්තා අරගෙන ඉක්මනින් ක්ලේම් එක (හිමිකම) ගෙවන්න කටයුතු කරලා රු. 250,000ක චෙක් පත කුසල්ට දෙන්න හොස්පිටල් එකට ගියා. එතකොට කුසල්ව පරීක්ෂණයකට අරන් ගිහින්. බිරිඳ විතරක් කුසල් ගේ ඇඳ ළඟ වාඩි වෙලා ලොකු කල්පනාවක හිටියේ. කුසල් ජීවිත රක්ෂණය ගත්ත හැටි කතාව කියලා ඉයන් චෙක් එක කුසල් ගේ බිරිඳ අතට දෙනකොට කුසල් ගේ බිරිඳට වාවන්නේ නැතුව ගිහින් අඬාවැටුණා. "අනේ කුසල්ව වැලැක්වුවේ මමයි නේ. රක්ෂණය ගන්න එකට මම විරුද්ධ වුණේ නැත්නම් කුසල්ට අවශ්‍ය මුදල් ඔක්කොම ලැබෙනවානේ." කියලා කුසල්ගේ බිරිඳ හරියට පසුතැවිලි වුණා. කුසල්ව අත් නොහැර පිහිට වුණු එකට ඉයන්ට නොසෑහෙන්න ඇය ස්තුති කළා. තමන් ජීවිත රක්ෂණය ගැනීම වැළැක්වුව නිසාත් තමන් ගේ ඒ අදූරදර්ශී ක්‍රියාවත් නිසා, අද කුසල් ගේ ප්‍රතිකාර වලට දරුවන් වෙනුවෙන් ඉතුරු කරපු සල්ලිත් වැය කරන්න සිද්ධ වුණු නිසාත් කුසල්ගේ බිරිඳ බොහෝම දුක් වුණා.*

මිනිසුන් මුදල් ඉතිරි කරන්නේ පසුව ඒවා වියදම් කිරීම අරමුණින්. ඉතින් මොකද්ද මේ "ඉතිරිකිරීම" කියලා කියන්නේ? සරලව කියනවා නම් ඉතිරිකිරීම කියන්නේ වියදම් කිරීම කල් දානවා කියන එකයි. විවාහ, දේපල, වාහන මිලට ගැනීම් වගේ ජීවිතයක අපි බලාපොරොත්තුවෙන හා සිදුවෙන අපේක්ෂිත සිදුවීම් වෙනුවෙන් අපි ඉතිරි කරනවා.

නමුත් අපේ ජීවිතවලට බොහෝ අනපේක්ෂිත සිදුවීම් සිදුවෙනවා. හදිසියේ ඇතිවන රෝගාබාධ, හදිසි අකල් මරණ යනාදී දේවල් අනපේක්ෂිතව සිදුවිය හැකියි. මෙවැනි අනපේක්ෂිත සිදුවීම් වෙනුවෙනුත් අපි සූදානම් වුණේ නැතිනම්, අර අපි ඉතිරි කරපු මුදල් මේ දේවල් වලට වැය කරන්න සිද්ධ වෙනවා.

## ප්‍රමාණවත් සෞඛ්‍ය ආවරණයක් පුද්ගලයින් විසින් මිලදී ගතයුත්තේ ඇයි?

| | |
|---|---|
| මුල්‍යමය රැකවරණයට | "මම හදිසියේවත් රෝගාතුර වූවොත්, මට කරදරයකින් තොරව මුදල් ලැබිය යුතුයි." |
| ආරක්ෂාවට | "මම හදිසියේවත් රෝගාතුර වූවොත්, දක්ෂතම වෛද්‍යවරුන් ගෙන් මම ප්‍රතිකාර ලබා ගත යුතුයි." |
| සුවපහසුව සැලසීමට | "මම හදිසියේවත් රෝගාතුර වූවොත්, මට ලබා ගත හැකි හොඳම පහසුකම් හා සේවාවන් මා ලබාගත යුතුයි." |
| සමාජ තත්ත්වය පවත්වා ගැනීමට | "මම හදිසියේවත් රෝගාතුර වූවොත්, නවීන හා හොඳම රෝහලකින් මා ප්‍රතිකාර ලබා ගත යුතුයි." |

## 2.8 මහළු වියේදී සිතට සැනසිල්ලක්

පිටරට සමාගමක ගණකාධිකාරීවරයකු ලෙස වැඩ කරපු වීරසේකර මහතා දැන් විශ්‍රාමිකයෙක්. ඔහු දෙදරු පියෙක් වන අතර දරුවෝ දැන් විවාහවී ඕස්ට්‍රේලියාවේ පදිංචි වී සිටිති. වීරසේකර මහතාටත් ඔහුගේ බිරිඳටත් මුළු ලෝකෙම වුණේ මේ දරුවෝ දෙන්නා. එයාලට හොඳම දේ ලබා දෙන්න ඒ දෙන්නම වෙහෙසුණා. ළමයි දෙන්නව කොළඹ තියෙන හොඳම ඉස්කෝලෙකට දැම්මා; ඒ දරුවෝ දෙන්නත් උසස්පෙළ විභාගේ ඉහළින්ම සමත් වුණා. වීරසේකර මහතා තමන් ට තිබුණු එකම වත්කම වුණු සේවක අර්ථසාධක අරමුදලින් ණයක් අරන් දරුවෝ දෙන්නම ඕස්ට්‍රේලියාවේ යැව්වේ එහෙ විශ්ව විද්‍යාලයෙන් උපාධියක් ගන්න. දරුවෝ දෙන්නත් දෙමවුපියන්ගේ සිහින සැබෑකරමින් හොඳින් ඉගෙන ගෙන උසස් රැකියා කරමින් විවාහ වෙලා දැන් ඒ රටේම ස්ථිරව පදිංචි වෙලා සාර්ථක ජීවිත ගත කරනවා.

වීරසේකර මහතා තමන්ගේ දරුවෝ ගැන ආඩම්බර වෙන හොඳ තාත්තා කෙනෙක්; බිරිඳත් ඒ වගේම ජීවිතේ ගෙවුණ ආකාරය ගැන සතුටින් ඉන්නේ. ඒ උනත්, මේ දෙන්න දැන් ජීවත් වෙන්නේ ඉස්සරට වැඩිය වෙනස් විදිහට. සල්ලි අමාරුකම් නිසා වීරසේකර මහත්මයා ගිණුම් වාර්තා තබන්නෙක් විදිහට අර්ධ කාලීනව (part-time) සුළු රැකියාවක් කරමින් කුලියට ගත් නිවසක සරල ජීවිතයක් ගත කරනවා.

**ජීවිතය සරල වුණත් වීරසේකර මහතාගේ හිත තුළ ප්‍රශ්න කීපයක් නිතරම රැව්දෙනවා.**

- මගේ මේ පොඩි රස්සාව නැති වුණොත් මගේ භාර්යාව එදිනෙදා වියදම් පියවා ගන්නේ කොහොමද?
- මගේ බිරිඳට හරි මට හරි හදිසියේ බරපතල රෝගයක් හැදුනොත් ඒවාට ප්‍රතිකාර ගන්න වියදම් කරන්න සල්ලි හොයා ගන්නේ කොහොමද?
- මම හදිසියේ මැරුණොතින්, මගේ බිරිඳ මම නැතිව ජීවත් වෙන්න සල්ලි හොයා ගන්නේ කොහොමද?

මිනිස්සු මේ තරම් වයසට යාමට බිය වන්නේ ඇයි? මහළු වයසේ අභියෝගය කුමක් ද? ඇත්තටම මහළු වයසේදී අභියෝග දෙකකට මුහුණ දීමට සිදුවෙනවා. පළමුවෙනි අභියෝගය නම්, වයසට යාමත් සමග පුද්ගලයින් කායිකව දුර්වල වීම හා ඒ නිසාම එදිනෙදා තමන් විසින් සිදුකළ කාර්යයන් ඉටු කිරීමට නොහැකිවීම. එමෙන්ම ඔවුන් මහලු හා දුර්වල නිසා කිසිවෙක් ඔවුන්ට ස්ථිර රැකියාවක් ලබා දීමට කැමැත්තක් නොදක්වයි. මේ නිසාම බොහෝ අය මහළු වයසේදී මුදල් නොමැතිකමින් ඉතා අසරණ තත්ත්වයන්ට පත්වෙනවා.

ඔවුන්ගේ ඉතිරි කිරීම් සියල්ලම තම පවුල්වල වගකීම්

ඉටු කිරීම සඳහා වැයවී ඇති නිසා ඔවුන්ගේ මහළු වයසේ දී මුදල් සඳහා අනුන්ට අත පෑමට සිදු වෙන අවස්ථා එමටයි. සමාජයේ ජීවත් වනවිට එවැනි අය අපට හමුවී ඇතිබව ඔබට මතක් වේවි. දෙවැනි අභියෝගය නම් මහළු වයසේදී තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය ටිකෙන් ටික පිරිහීගෙන යනවිට ඒ වෙනුවෙන් වැයවන වෛද්‍ය ප්‍රතිකාර වියදම් ඉහළ යාමයි. තම පවුලේ වගකීම් ඉටුකළාට පසුව, මහළු වයසේදී කෙනෙක් ලෙඩරෝග වලට හෝ දුප්පත්කමට ගොදුරු විය හැකියි. ඒ දෙකටම මුහුණ පාන්න සිදුවීම හරිම අවාසනාවන්තකමක්.

මහළු කාලයේදී ජීවත් වීමට මුදල් ලබාගත හැකි ක්‍රමය කුමක්ද? ආකාර තුනකින් එය ලබාගත හැකියි.

- පිනට ජීවත්වීම
- අන් අයගෙන් යැපීම
- තමාගේ ඉතිරිකිරීමක් මත යැපීම

## පිනට ජීවත්වීම

උදව් කිරීමට දරුවන් නොමැති දුගී මහළු කෙනෙකුට ජීවත් වීමට ඇති එකම මාර්ගය අනාථාධාර මත යැපීමය. පහසුකම් අවම වූ වැඩිහිටි නිවාසයකට වී ජීවිතේ අතීතය පිළිබඳ මහත් කණස්සල්ලෙන් යුතුව ජීවත් වීමට සිදුවෙයි. ඔවුන් සතුටින් හුරුවූ, සුව පහසු ජීවන රටාව වෙනස් කරගැනීමට සිදුවීම නොවැළැක්විය හැකියි.

## අන් අයගෙන් යැපීම

සමහර වැඩිහිටියෝ මහළු කාලය ඔවුන්ගේ දරුවන් සමග ගත කරති. ඒ වුණත් මහළු කාලය ඔවුන්ට කැමති ආකාරයට ගත කිරීමට නොහැකි වන්නේ දරුවන්ගේ ජීවන රටාවන්ට

අනුව යම් සීමාවන්ට යටත්ව ජීවත් වීමට සිදුවීම නිසාය. දරුවන් කුඩා කාලයේදී ඒ අය දෙමව්පියන්ගේ අණසක පරිදි ජීවත් විය. මහළුවයසේදී දරුවන් ළඟ ජීවත් වන්නට සිදුවේ නම්, දරුවන්ගේත් ඔවුන්ගේ බිරියන් හෝ සැමියන්ගේ නීති රීති වලට යටත්ව ජීවත්වීමට දෙමව්පියන්ට සිදුවනු නිසැකයි. තමන්ගේ ස්වාධීනත්වය අහිමි වී දරුවන්ට කරදරයක් වෙමින් දුකින් ජීවත්වීම මෙහිදී සිදුවෙයි.

## තමාගේ ඉතිරිකිරීමක් මත යැපීම

විශ්‍රාම යනවා කියන්නේ ඇත්තටම මොකක්ද? එය, කිසිම වැඩක් නොකර පැත්තකට වී සිටීම නම් නොවෙයි. සාර්ථක විශ්‍රාමයක් යනු, කලින් පවත්වාගෙන ආ ජීවන රටාව, කිසිවෙකුටත් බරක් නොවී, ඒ විදිහටම පවත්වාගෙන යමින් අවශ්‍යතා සපුරා ගැනීමට ඕනෑකරන ආදායමක් ඇතිව එම කාලය සතුටින් ගත කිරීමයි. ඒ සඳහා මුදල් හොයන්න මහළු වයසේදී වෙහෙසෙන්න අවශ්‍ය නැහැ. එක් රැයකින් මේ සියල්ල ලබාගන්න නොහැකියි. මහළු කාලයේදී ප්‍රමාණවත් ආදායමක් ලැබීමට නම්, ඒ සඳහා දිගු කාලීන සැලැස්මක් මත ගොඩනගාගත් ශක්තිමත් අරමුදලක් අවශ්‍යයි. පෞද්ගලික මූල්‍ය සැලසුමක් මගින් තමන්ගේ විශ්‍රාමය සැලසුම් කර තිබුනොත්, දෙමාපියන්ට, දරුවන්ට හෝ කිසිවෙකුටත් බරක් නොවී, ආත්ම ගරුත්වයකින් යුතුව උපරිම නිදහසකින් තම සහකරු හෝ සහකාරිය සමග ගත කළ හැකියි.

**ඇමෙරිකාවේ ප්‍රධානම විශ්ව විද්‍යාල 10 - ප්‍රින්ස්ටන් වාර්තාවට අනුව විශ්‍රාමිකයින් 100කගේ විශ්‍රාම දිවිය ගෙවන අයුරු**




**8% වැනි සුළු විශ්‍රාමිකයින් පිරිසක් පමණක් සුව පහසුව විශ්‍රාමයක් ගත කරති.**

මහළු වයසේදී තමාට තමාව හා සහකාරිය රැකබලා ගැනීමට හැකි පරිදි මූල්‍ය සැලසුමක් ඇති පුද්ගලයා, "වයස්ගත මහත්මයෙක්" ලෙස සමාජය දකියි. මහළු වයසේදී මුදල් නැතිව අනුන්ට අතපාන පුද්ගලයාව සමාජය විසින් දකින්නේ, නිකම්ම "මහළු මිනිසෙක්" ලෙසයි.

මෑතක දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත දත්ත අනුව පුද්ගලයකුගේ ආයු අපේක්ෂා කාලය අවුරුදු 75ක් පමණ වේ. ජීවන රටාවන්වල ගුණාත්මක බව ඉහළ යාමත් ලෝකයේ වෛද්‍ය ප්‍රතිකාර වල දියුණුවත් නිසා මිනිසුන් දිගු කාලයක් ජීවත් වනවා. අද බොහෝ පුද්ගලයින්ට ඇති අභියෝගයනම්, ඔවුන් බොහෝ විට විශ්‍රාම ගැනීමෙන් පසු තවත් අවුරුදු 20 ක් වත් අවම වශයෙන් ජීවත්වන්න සිදුවීමයි. රැකියාවක් නොකරන ඒ කාලයේදී පුරුදු වුණු ජීවන රටාව පවත්වා ගෙන සතුටින් ඉන්නට නම්

පුද්ගලයෙකුට හොඳ මූල්‍යමය පසුබිමක් අවශ්‍යයි. හොඳින් සැලසුම් කර එක්රැස් කළ අරමුදලක් මගින් පෙර ගත කළ ජීවන රටාව ඒ ලෙසම පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහළු කාලයේදී ලැබෙන අතරම ඔබේ හා ඔබේ පවුලේ අයගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා අවශ්‍ය මුදල් ද ලැබේ.

## විශ්‍රාමික ආදායම සම්බන්ධයෙන් කළ සමීක්ෂණයක සොයා ගැනීමක්.

- ❒ විශ්‍රාම යෑමේ දී ඉපැයූ මාසික ආදායමින් 60% - 80% අතර ප්‍රමාණයක් විශ්‍රාමික ආදායම ලෙස අවශ්‍ය වෙයි.
- ❒ එනමුත්, බොහෝ පිරිසක් ඔවුන් විශ්‍රාම යෑමේ දී ඉපැයූ ආදායමින් 17% - 20% අතර ප්‍රමාණයක් විශ්‍රාමික ආදායම ලෙස ලබමින් අසරණව විශ්‍රාම දිවිය ගත කරයි.

**කලින්ම, තරුණ කාලෙදීම අරඹන්න**

කලින් ආරම්භ කළ තරමටම ඔබට පහසුවෙන් ඉතිරිය කළ හැකියි!



# 3

# ජීවන ගමනේ වෙනස්වන මූල්‍යමය අවශ්‍යතා

# 3.0 පවුලක ජීවන අවධීන් අනුව ඇතිවන මූල්‍යමය අවශ්‍යතා

මූල්‍යමය අවශ්‍යතාවන් පුද්ගලයා ගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. යම් පුද්ගලයකු එක්තරා අවස්ථාවක ඔහු ගෙවන ජීවන චක්‍රයේ අවධිය අනුව මූල්‍ය අවශ්‍යතාවන් වෙනස් විය හැක. ඒ ඒ අවධියේ ඇතිවන මූල්‍යමය අවශ්‍යතා, වගකීම් හා අභිමතාර්ථයන් අද්විතීය වේ.




## 3.1 ළමා කාලය

ළමා කාලය යනු යැපෙන්නන් ලෙස සිටින කාලයක් වන අතර ඒ කාලය බොහෝ විට දරුවන් පූර්ණ-කාලීන අධ්‍යාපනය අවසන් වන තෙක්ම දිවෙයි. දරුවකුගේ මූල්‍යමය අවශ්‍යතා දෙමවුපියන් හෝ අනෙකුත් භාරකරුවකු විසින් ඉෂ්ට කරදෙයි. දරුවන්ට රැකවරණ හා ඉතිරි කිරීමේ අවශ්‍යතා ඇති අතර ඒවා දෙමාපියන් හෝ භාරකාරයන් විසින් සපුරාලිය යුතුයි.

## 3.1 තරුණ අවිවාහක අවධිය

දරුවන්ට හොඳම අධ්‍යාපනයක් ලබා දී යහපත් ගතිගුණ හුරු කර උසස් රැකියාවන් ලබා දීමට දෙමාපියන් අති විශාල උත්සාහයක් හා කැපකිරීමක් කරයි. බොහෝ දෙමවුපියන් තමන් ගේ ජීවිතයේ අවසාන කාලය ගැන නොසිතා ඒ මුදල් ද දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන්ම යොදවයි. එබැවින් දරුවන්ගේ පරම යුතුකමක් වන්නේ දෙමවුපියන්ට ඔවුන්ගේ කටයුතු කර ගත නොහැකි කාලයකදී ඔවුන්ව රැක බලාගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දේවල් සපයාදීමයි.

## අනුන්ට පැවරිය නොහැකි වගකීම

*ඉහළ පෙළේ සමාගමක කළමණාකරුවකු ලෙස නවීන් සේවය ආරම්භ කළේ ගණකාධිකරණ උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුවයි. එදා නවීන් වෙනදාටත් වඩා වේලාසනින් කාර්යාලයට පැමිණියේ සිකුරාදා වනවිට ලබා දිය යුතු වැදගත් ලිපිලේඛන රාශියක් අවසන් කළයුතු නිසයි. උදේ 9.15 ට පමණ නවීන්ගේ ජංගම දුරකතනය නොකඩවා නාද වෙන්න පටන් ගත්තා. ඒ, අම්මාගෙන් ඇමතුමක්. ඇය ඉතාමත් කලබල වී කතා කළේ. තාත්තාට ගොඩාක් අමාරු බවත් වහාම ගෙදර එන ලෙසත් ඇය පැවසුවා. හොඳටම කලබල වූ නවීන් කාරය වේගයෙන් පදවාගෙන ගෙදර එන්න පිටත් වුණා. තාත්තා ගැන හිත හිත නවීන් රිය පැදවූවේ හරිම කණස්සල්ලෙන්. තාත්තා ඉක්මනින් රෝහලට ගෙනියන්න නවීන් කාරය වේගයෙන් පදවුවා. ගෙදරට හරියටම මීටර 500 ක් ආසන්නයේ තියෙන වංගුවේ නවීන් කාරය පැදවූවේ හරිම වේගයෙන්. මූණට මූණලා එන බස් රථය දුටුවත් නවීන්ට කාරය පදවාගෙන ආ වේගය නිසා නවතාගන්නට නොහැකි වුණා. බස් රථ රියදුරා නවීන් ආ වේගය දැක බස් රථය පාරෙන් ඉවතට කර නතර කළා. පාලනය කරගත නොහැකි වූ නිසා නවීන් කාරය පාරෙන් ඉවතට කැපුවා. ඒ එක්කම විශාල ශබ්දයක් එක්ක පාරෙන් පිට තිබු කාණුවට කාරයේ ඉදිරිපස රෝදය වැටී කාරය නතර වුණා. නවීන්ගේ තොල*

*සුක්කානමේ වැදී තුවාල වෙලා ලේ ගලන්න පටන් ගත්තා. වැඩි තුවාලයක් නැති නවීන්ට මොහොතකට ගෙදර රෝගාතුරව ඉන්න තාත්තාව සිහි වුණා.*

*බස් රථ රියදුරාට රථය පාලනය කළ නොහැකිවූයේ නම් විය හැකිව තිබූ දේ සුක්කානම තදින් අල්ලාගෙන සිටි නවීන් ගේ දෑස් ඉදිරියේ මැවී පෙනුණා. තම ජීවිත කාලයම කැප කර දුක්මහන්සි වී ඔහුව හදා වඩා ගත් අම්මාටත් තාත්තාටත් එවිට අත්වන ඉරණම සිතන විට නවීන් ඔහුගෙන්ම ඇසුවේ, "මගේ ජීවිතයට අද කරදරයක් සිද්ධ වුණා නම්, මගේ තාත්තා අම්මා බලා ගන්නේ කවුද?"*

බොහෝ දරුවන් දෙවරක් නොසිතා වයස්ගත වූ දෙමවුපියන්ට උදවු කිරීම, ඔවුන්ව රැක බලා ගැනීම, ඔවුන් ලෙඩවූ විට සැළකීම, හොඳම වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම වැනි යුතුකම් හා වගකීම් තමන්ට කළ හැකි උපරිමයෙන් ඉටු කරන්නට ඉදිරිපත් වෙයි. තම වයස්ගත වූ දෙමවුපියන්ට ඇවිදීමට නොහැකි වූ විට, තම එදිනෙදා කටයුතු තනිව කරගත නොහැකි වූ විට, ඔවුන්ට සහය වී ඔවුන් රැකබලා ගැනීමත් ඔවුන්ට හුරු වූ ජීවන රටාව පවත්වා ගැනීමට අවශ්‍ය මුදල් ලබා දීමත් දරුවන්ට පැවරෙන වගකීම් අතරට එක්වෙයි.

## වයස්ගත වූ දෙමව්පියන්ගේ මූල්‍යමය අභියෝගය

- ❒ වයස්ගත වූ විට දෙමාපියන්ට තමන්ගේ දරුවන්ගේ ආදරය සහ මූල්‍යමය රැකවරණය අහිමි වීම.

## මූල්‍ය විසඳුම්

යම් නොවැළැක්විය හැකි අමිහිරි සිදුවීමක් නිසා දරුවන්ට තම වයස්ගත දෙමවුපියන්ව තනිකර මෙලොවින් සමුගන්න සිදුවුවොත්, දරුවන් ලෙස ඔවුන්ගේ යුතුකම් හා වගකීම වනුයේ තම වයස්ගත දෙමවුපියන්ට අවශ්‍ය ප්‍රමාණයට මුදල් සම්පාදනය කර තිබීමයි.

ඒ සඳහා හොඳ රක්ෂණ ආවරණයක් ලබා ගෙන

ප්‍රතිලාභීන් ලෙස දෙමාපියන්ට පැවරීම තුළින් දෙමාපියන් වයස්ගත කාලයේදී මූල්‍යමය රැකවරණයක් සැපයිය හැකියි.

## තරුණ අවිවාහක අවධියේ අනෙකුත් අවශ්‍යතා

තරුණ කාලයේ ඔබ සතු වටිනාම වස්තුව නම්, ඔබේ නිරෝගීභාවයයි. ඔබගේ ශරීර සෞඛ්‍යය හොඳ නම්, "ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට හොඳම කාලය" එයයි. ඊට හේතුව නම් ඉහළ ජීවිතාවරණයක් ඉතා අඩු මිලකට ඒ කාලයේ දී ලබාගත හැකි වීමයි. තමන් ලබාගත් ඔප්පුවේ ස්වභාවය අනුව, වටිනා කල්පිරීමේ ප්‍රතිලාභද භුක්ති විඳිය හැකියි.

## 3.2 තරුණ විවාහක අවධිය

දෙදෙනෙක් යුග දිවියට එළැඹෙන විට, එකිනෙකා රැක බලා ගන්නා බවට පොරොන්දු වෙනවා. යුග දිවියට එළඹීමේ දී විශේෂයෙන් ම ස්වාමිපුරුෂයෙක් සිය මනමාලිය ලෙස සරණ පාවා ගන්නා කාන්තාව, තමන්ගේ බිරිඳ ලෙස පිළිගන්නා බවටත්, ඇයව ජීවිතය පුරාවට ම රැකබලාගන්නා බවටත් ප්‍රතිඥාවක් ලබා දෙයි. 'විවාහය' යනු පුරුෂයෙක් හෝ කාන්තාවක් තම ජීවිතය පිළිබඳ ගන්නා අතිශය වැදගත් තීරණයකි. එම ආරම්භය කෙනෙකුගේ ජීවිතයේ 'දෙවැනි උපත' ලෙස ව්‍යවහාරයේ පැවතෙන්නේ කෙනෙකු ගේ ජීවිතය නව මාවතක් කරා යොමු කරන, නව සිහින මවන ආරම්භයක් බැවිනි. දෙදෙනාම අලුතින් ඉඩමක් මිලදී ගෙන තමන්ගේ ම පුංචි නිවසක් සාදා ගැනීමට, මෝටර් රථයක් ගැනීමට, දරුවන් ලබා ඔවුන් ලොකුමහත් කිරීමට, දරුවන් උසස් පුරවැසියන් බවට පත් කිරීමට, ආදී බොහෝ සිහින ඔවුන් දකිනවා. වර්තමානයේ බිරින්දෑවරුන් රැකියාවකින් අස් වී ගෙදර නැවතී, දරුවන් හා තම ස්වාමියා ආදරයෙන් රැකබලා ගනිමින්, ගේ දොර වැඩකටයුතු සියල්ල ඉටු කරන්නේ තම පුංචි කැදැල්ල සතුටින් තැබීමටයි.

ඉඩමක් අරන් ගෙයක් හදන්න, කාර් එකක් ගන්න වගේ මේ සිහින සැබෑ කර ගන්නට ස්වාමිපුරුෂයා බොහෝ විට බැංකුවෙන් හෝ එවැනි ආයතනයකින් ණය ලබා ගනියි. ඔහු

මෙම පවුලේ තනි ආදායම් උපයන්නා වන අතර පවුලේ මූල්‍යමය වගකීම් සියල්ල ඔහු ගේ කර මත පැටවී ඇත.

## තරුණ විවාහක අවධියේ මූල්‍යමය අභියෝගය

- ❒ සැමියා හදිසියේ වියෝ වූවොත් බිරිඳට ජීවත් වීමට හා පවුලේ වියදම් හා කටයුතු කර ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නැතිවීම.
- ❒ සැමියාගේ වියෝවින් පසු ඔහු විසින් දැරූ මූල්‍යමය වගකීම් පියවීමට නොහැකි වීම.

## මූල්‍ය විසඳුම

ආදරණීය බිරිඳ තනිකර තමන්ට හදිසියේ මෙලොවින් සමුගන්නට සිදු වුවොත්, අනාගතය පිළිබඳ හොඳින් සිතා බලා, පවුලේ වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන ආදායම ලැබෙන බවට සහතික කෙරෙන අවශ්‍ය සැලසුම් සිදු කිරීම, සෑම ස්වාමිපුරුෂයකුගේම වගකීමකි. ඒ කාර්යය නිවැරදිව ඉටු කිරීමටනම් සෑම ස්වාමිපුරුෂයෙකුම, ප්‍රමාණවත් ජීවිතාවරණයක් සහිත 'ජීවිත රක්ෂණය' ක් ලබා ගෙන, තමා මෙලොව නොමැති විට, බිරිඳට එහි ප්‍රතිලාභ සාදා දිය යුතුය. තමාගේ වියෝවකදී තම වැන්දඹු බිරිඳට ගෞරවාන්විතව ජීවත්වීමට හැකි පරිදි මාසික ආදායමක් සාදා දීම හැම සැමියෙකුගේ වගකීමකි.

## සරල උදාහරණයක් සළකා බලමු

තිලිණ මහතා ගේ මාසික ආදායම රු.50,000 යයි උපකල්පනය කරමු. ඔහුගේ අනපේක්ෂිත මරණයකදී ඔහුගේ බිරිඳට පවුලේ කටයුතු කරගෙන යමින් ඉදිරිය ගැන සැලසුම් කර ගෞරවාන්විතව ජීවත් වීමට නම්, අවම වශයෙන් මාසික ආදායමෙන් 75% ක් පමණවත් මාසිකව ලැබිය යුතුයි. ඒ අනුව තිලිණගේ යැපෙන්නන්ට හුරුවූ ජීවන රටාව පවත්වා ගැනීමට නම් මාසිකව රු.35, 000 හෝ වාර්ෂිකව රු. 420,000 අවශ්‍යයි.

| | | | | |
|---|---|---|---|---|
| අවශ්‍ය රක්ෂණාවරණ ප්‍රමාණය | = | වාර්ෂික ආදායම / බැංකු ස්ථිර තැන්පතු පොළී අනුපාතය | X | 100 |
| | = | 420,000 / 12 | X | 100 |
| | = | රු. 3,500,000 | | |

තිළිණ මහතා රු. 4,200,000 ක් වටිනා රක්ෂණාවරණයක් ලබා ගතහොත්, ඔහු ගේ හදිසි වියෝවකදී ඔහුගේ බිරිඳට ඒ අයුරින්ම ජීවිතේ ගෙන යාමට ක්‍රමයක් ලබා දීමට සහතික වීමට ඔහුට හැකිවනවා. මෙම අවශ්‍යතාවය, අවම වශයෙන් කාලීන රක්ෂණයක් (Term insurance-ඉදිරියේදී විස්තර කරන) ලබා ගැනීමෙන් ඉෂ්ට කරගත හැකියි.

## 3.3 තරුණ විවාහක, දෙදෙනාම රැකියාවේ නියුතු

මෙවන් අවස්ථාවකදී දෙදෙනාම ආදායම උපයන අතර, සැප පහසු හොඳ ජීවන රටාවක් පවත්වා ගැනීමට වෙහෙස වී වැඩකරයි. දෙදෙනාම උත්සහ කරන්නේ ඉඩමක් මිලදී ගෙන නිවසක් සාදා, හොඳ මෝටර් රථයක් හෝ දෙදෙනාටම මෝටර් රථ දෙකක් මිලදී ගැනීමටයි. දරුවන් ඇති දැඩි කර ඔවුන්ව පිළිගත් හොඳ පාසල් වලට යවන්න, පිටරට විනෝද සවාරියක් යන්න වාගේ බොහෝ දේවල් ඉටු කරගන්න දෙදෙනාම වෙහෙසෙනවා. දෙදෙනාම ආදායමක් උපයන විට පවුලේ වගකීම් දෙදෙනාටම බෙදීයනවා. සියලුම මූල්‍යමය ගනුදෙනු සඳහා දෙදෙනාම සහභාගී වන අතරම දෙදෙනාගේම පෞද්ගලික වගකීම් ඉතා පැහැදිලියි.

### මූල්‍යමය අභියෝගය

ඉහතින් දැක්වූ ජීවන රටාව පවත්වා ගැනීමට නම්, දෙදෙනාම රැකියාව කළයුතු අතර එම ආදායම උපයමින් පෞද්ගලිකව එකිනෙකා සතු වගකීම් ඉටු කළයුතුයි. එක් අයෙකු

හෝ මියගියහොත් ජීවත් වන සහකරු මත පැටවෙන වගකීම දෙගුණයක් වනු ඇත. දෙදෙනාගේම ආදායම පෙන්වීමෙන් ඔවුන් නිවාස ණයක් ලබා ගෙන ඇතිනම් නිවාසයේ අයිතිය තබා ගැනීමට, ජීවත් වන කලත්‍රයා එම සම්පූර්ණ වාරිකය තනි ආදායමින් ගෙවිය යුතු වෙයි. එසේ නොමැති වුණොත් එම ණය ලබා දුන් මූල්‍ය ආයතනය විසින් නිවස වෙන්දේසි කර හිඟ ණය මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කරයි. පවුලේ අනෙකුත් වගකීම්වලටද මේ ඉරණමම අත්වේ. ජීවත් වන කලත්‍රයාට මුළු නිවසම බලාකියා ගන්න සිදුවන අතරම තම වෘත්තීයමය ප්‍රතිරූපයට ගැලපෙන ආකාරයට ජීවත් වීමට සිදුවෙයි.

## මූල්‍ය විසඳුම

මෙවැනි අවස්ථාවක එකිනෙකා වෙනුවෙන් රැකවරණය ලබා ගැනීම, දෙදෙනාගේම වගකීමකි. එමගින් එක අයකුගේ වියෝවකදී ජීවත්ව සිටින කලත්‍රයා මූල්‍යමය අතින් සුරක්ෂිත වන බවට සහතික විය හැක. සැමියා හා බිරිඳට මෙවැනි අවස්ථාවකදී වෙන වෙනම දෙදෙනාගේ ජීවිත වෙනුවෙන් හෝ එකාබද්ධ ජීවිතාවරණයක් මගින් එකිනෙකා ගේ ජීවිත මත රැකවරණයක් ලබා ගැනීම ඉතා සුදුසුයි.



## 3.4 තරුණ විවාහක, කුඩා දරුවන් සිටින අවධිය

මීට පෙර දැක්වුණු ජීවිත අවධි 3 ටම වැඩියෙන් මෙම අවධියේ දී ජීවිතයේ වගකීම් බරපතල වෙනවා. ජීවිතයේ මෙවැනි අවධියකදී බොහෝ දෙමවුපියන් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, නිවසක්, හෝ වාහනයක් සඳහා මුදල් ආයෝජනය කර ඇති අතර ඔවුන්ගේ ඉතිරිකිරීම් සියල්ල මේ වනවිට වැයවී හමාර වන්නට ඉඩ තියෙනවා. මෙම අවධියේ බිරිඳත් දරුවනුත් පහසු ජීවන රටාවකට හුරු වී ඇති අතර දෙදෙනාම එකිනෙකාගේ මූල්‍යමය අභිමතාර්ථ හා අනාගත සිහින සැබෑ කර ගැනීමට වෙහෙසී වැඩ කරනවා. හුරුබුහුටි කුඩා දරුවන් සමඟ සිටින තරුණ විවාහක යුවලක් දකින ඕනෑම කෙනෙකුට ඔවුන්ගේ ඇස් වල බබලන සතුට දැකගත හැකියි. මෙවැනි පවුලකට අනාගතයේ සැබෑ කරගන්න හීන හා අභිමතාර්ථ බොහෝ ඇති අතර ඔවුන් නිතරම විවිධාකාර මාවත් සොයමින් ඒවා සැබෑ කරගන්න වෙහෙසෙනවා.

### මූල්‍යමය අභියෝගය

හදිසියේම මේ පවුලේ තාත්තා මෙලොවින් සමුගතහොත් බිරිඳ කෙසේ නම් දරුවන් ඇති දැඩි කරාවි ද? මුළු පවුල ම බලා ගෙන, මූල්‍යමය වගකීම් දරාගනිමින් පවුලේ ආදායම පවත්වා ගන්නේ කෙසේ ද? සමාජයෙන් ඇසෙන මෙවැනි අමිහිරි කතන්දර ඔබ අත්දැක ඇතිබව නොඅනුමානයි. මෙවැනි ඛේදනීය ඉරණමකට පත්වූ සමහරක් පවුල්වල බිරිඳකට ගෞරවාන්විතව තනිව ජීවත් වීමට නොහැකි වූ අවස්ථා එමටයි. වර්තමාන සමාජයේ කුඩා දරුවන් හා මූල්‍යමය වගකීම් රැසක් සමඟ තනිවුණු බිරිඳක් කිසිසේත්ම සුරක්ෂිත නැහැ. වැන්දඹුවට නිවසේ ණය හරිහැටි ගෙවා ගන්න නොහැකි වුවොත් ණය දුන් බැංකුව විසින් නිවාසය වෙන්දේසි කරනු ලබයි. ඇයට තම ආදරණීය සැමියා සමඟ ගොඩනැගූ නිවාසය හැර දමා කුඩා නිවසක් හෝ වෙනත් කෙනෙකුගේ වහලක් යට ජීවත් වෙන්නට සිදු වෙයි. අසරණ වූ බිරිඳත්, කුඩා දරුවනුත්, එක් එක් අයගේ

හිරිහැර හා බලපෑම වලට නතු වෙයි. සැමියාගේ වියෝවෙන් ඇතිවුණු මෙවැනි දුක්ඛිත අවස්ථාවකදී පවුලක් මරණ තුනකට මුහුණ දෙයි. එනම් ආදරණීය සැමියකුගේ මරණය, දයාබර තාත්තාකෙනෙකු ගේ මරණය, එමෙන්ම පවුලක ආදායමේ මරණය.

## මූල්‍ය විසඳුම

ජීවිත රක්ෂණය තුළින් හෝ වෙන කිසියම් ආයතනයකින් පවුලට නැතිවූ දයාබර තාත්තා හෝ ආදරණීය සැමියා නැවත කිසිදා ලබා දිය නොහැකියි. නමුත් එමඟින් පවුලක මෙවන් අවධියකදී කිසිම තාත්තා කෙනෙකුට ජීවිත රක්ෂණයක් මඟ හැරිය නොහැකියි. දරුවන්ට, බිරිඳට තදින් ආදරය කරන තාත්තා කෙනෙක්, සැමියෙක් කිසිසේත් ජීවිත රක්ෂණයක් අමතක නොකරයි. තමන් හදිසියේ වියෝ වූ දිනෙක, දයාබර බිරිඳට හිස කෙලින් තබා ගෙන කිසිවෙකුට අත නොපා ගෞරවාන්විතව ජීවත් වීමටත්, තම දරුවන්ට ඔවුන් ගේ අනාගත හීන සැබෑ කර ගැනීමටත්, තමා ජීවත්ව සිටියානම් ඔවුන්ගේ ජීවිතවල සැප පහසුව සලසනවා මෙන් සියලු කටයුතු ඉටු කිරීමට අවශ්‍ය මාසික ආදායමක් පෙර සිටම සකසා දීමට, තාත්තා කෙනෙකු, සැමියෙකු ලෙස ඔහු, ප්‍රමාණවත් ජීවිතාවරණයක් තම ජීවිතයට ලබා ගැනීම ඔහුගේ වගකීමකි. පියෙකු හා සැමියෙකු ලෙස තම පවුල වෙනුවෙන් ඇති ආදරයේ උතුම්ම සංකේතය ජීවිත රක්ෂණයයි.

**තාත්තේ ඔබ සූදානම්ද?**

දරුවා:- තාත්තේ, මම උසස් පෙළ හොඳට කළා. දැන් විශ්වවිද්‍යාලයට යන්න මම ලෑස්තියි.
තාත්තේ ඔබ ලෑස්ති ද?

## 3.5 විවාහක, වැඩුනු දරුවන් සිටින අවධිය

දරුවන් වයසින් වැඩෙනවිට ඔවුන් ඉගෙන ගන්නා විෂයයන් අනුව අධ්‍යාපනය හා අතිරේක පන්ති සඳහා වැය වෙන මුදල දවසින් දවස ඉහළ යනවා. වාසනාවකට වගේ මේ කාලය වෙනකොට දෙමවුපියන් තම වෘත්තියන්හි හොඳින් ස්ථාවර වෙලා ආදායම ඉහළ මට්ටමකට පත්වී තිබෙන්නට පුළුවන්. සමහරක් විට පියාට ජ්‍යෙෂ්ඨ කළමනාකාර තත්ත්වයකට පවා උසස්වීමක් ලැබී තිබෙන්න පුළුවනි. දෙමවුපියන් දෙදෙනාම රැකියා කරයි නම් පවුලේ ආදායම සැළකිය යුතු තරමට ඉහළ යා හැකි අතර සැප පහසු ජීවන රටාවක් පවත්වාගෙන යා හැකියි.

### මූල්‍යමය අභියෝගයන්

- ඉහළ ගිය උසස් අධ්‍යාපන වියදම් හා පවුලේ රැකවරණ අවශ්‍යතා වැඩි වීම.
- දෙමවුපියන්ගේ වයස අවුරුදු 50කට ළඟා වන නිසා සෞඛ්‍යමය ගැටළු ඇතිවීමේ ප්‍රවණතාවය ඉහළ වීම.
- දරුවන්ගේ ආවාහ විවාහ කටයුතු සඳහා අවශ්‍ය ආයෝජන හා ඉතිරිකිරීම් අවශ්‍යතා ඇතිවීම.
- රැකියාවෙන් සමු ගැනීමට දෙමවුපියන්ට තව අවුරුදු 10ක් පමණ තිබෙන නිසා විශ්‍රාමය සඳහා ඉතිරිකිරීම් ඉක්මනින් වැඩි කිරීම.

### මූල්‍ය විසඳුම්

මේ කාලයේදී පවුලක්, ජීවිතයේ අතිශය වැදගත් අවධියක සිටියි. එබැවින් ඉහත දැක්වූ අවශ්‍යතා හොඳින් හා සම්පූර්ණයෙන් ආවරණය කළ යුතුය. විශ්‍රාමය සඳහා සවිමත් පදනමක් දැමීමත් දරුවන්ගේ අනාගත සිහින සැබෑ කරගැනීමටත් හැකි පරිදි අවශ්‍ය රැකවරණය සැපයීමට කටයුතු කිරීම දෙමවුපියන් ගේ යුතුකමක් හා වගකීමකි.

# 3.6 විශ්‍රාමික අවධියට ආසන්න වීම

දරුවන් ඉක්මනින් උස්මහත්වී ඔවුන්ගේ පාසල් අධ්‍යාපනයේ අවසාන අදියරට පැමිණෙයි. පාසල් අධ්‍යාපනයෙන් පසු ඔවුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇතුල් වෙනවා; එය මිල අධිකයි. මේ කාලයේ දී දෙමවුපියන් රැකියාවේ ඉහළ මට්ටමක සිටින නිසා ඉහළ වැටුපක් ලබා ගන්නවා විය හැකි නමුත් විශ්‍රාමය ළං වන නිසා එම වැටුප ලැබීමට හැකි වන්නේ තව සුළු කාලයක් පමණයි.

ඔවුන් නිවාස ණය වැනි ණය ලබා ගෙන ඇතිනම් ඒවා ද පියවීමට ආසන්න විය හැකියි. එනම් මේ කාලය වන විට ඔවුන්ගේ මූල්‍යමය වගකීම් ටිකෙන් ටික අඩුවෙමින් පවතියි.

## මූල්‍යමය අභියෝගයන්

- ❑ දරුවන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හමාර කරනතුරු දෙමවුපියන්ට විශාල මූල්‍යමය වගකීමක් දැරිය යුතු වෙනවා.
- ❑ මෙම අවධියේදී පවුලක් අඛණ්ඩව ලැබෙන ආදායමේ අවසානය කරා ළඟාවෙනවා.
- ❑ දෙමවුපියන්ට තමන්ගේ සෞඛ්‍ය වියදම් තමාම පියවා ගැනීමට සුදානම් වීම.
- ❑ තමන්ගේ විශ්‍රාමයෙන් පසු ජීවත් වීම සඳහා තම ඉතිරිකිරීම් පාවිච්චි කිරීමට සිදුවීම.

## මූල්‍ය විසඳුම

විශ්ව විද්‍යාලයීය අධ්‍යාපන වියදම් සුරක්ෂිත කරන්නට දැනට පවතින ජීවිත රක්ෂණාවරණය වැඩි කිරීම පිළිබඳ සිතා බැලිය යුතු වනවා. මෙය කිරීමට අවශ්‍ය වන්නේ අවුරුදු පහක තරම් කෙටි කාලයක් සඳහායි. කාලීන රක්ෂණයක් මීට හොඳ තේරීමක් විය හැකියි. අධ්‍යාපන වියදම් සුරක්ෂිත කරන අතරම

විශ්‍රාමික ආදායම සඳහා ආයෝජන සුරක්ෂිත කිරීමට හා සෞඛ්‍ය වියදම් වලට සූදානම් විය යුතුයි.

## 3.7 විශ්‍රාම දිවිය

ප්‍රීතිමත් විශ්‍රාමයක් කියන්නේ මොකද්ද? විශ්‍රාමය ප්‍රීතිමත් වීමට නම් වගකීම් කිසිවක් නැතිව, තමන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාමටත් කිසිවකුටත් බරක් නොවී ජීවත් වීමටත් ප්‍රමාණවත් අරමුදලක් සකස් කර ගත යුතුයි.

නමුත් බොහෝ දෙනා හට මෙවැනි සාර්ථකත්වයන් කරා යාමට නොහැකි වන විවිධාකාර හේතු ඇත. විශ්‍රාම දිවියේදී සාමාන්‍යයෙන් පුද්ගලයින් පත්වෙන තත්ත්වයන්.

- විශ්‍රාමික ආදායමක් හෝ ඉතිරිකිරීමක් නැතිවීම.
- අඩු විශ්‍රාමික ආදායමක් හා අඩු ඉතිරිකිරීම් ප්‍රමාණයක් තිබීම.
- ප්‍රමාණවත් විශ්‍රාමික ආදායමක් ඇති අතර, සැළකියයුතු ආයෝජන ප්‍රමාණයක් තිබීම.

ඔබත් විශ්‍රාමයේදී මින් කුමන අවධියක් ගත කිරීමට බලාපොරොත්තු වනවාද? විශ්‍රාමය සඳහා අවම වශයෙන් අවුරුදු 15 වත් පෙර සිට සැලසුම් කර ඒ කාලය පුරා සැළකිල්ලෙන් ඉතිකිරීම් සිදු කරගෙන හොඳ අරමුදලක් ගොඩ නගා ගත යුතුයි. විශ්‍රාමික වයසට පැමිණීමෙන් පසුව විශ්‍රාමය පිළිබඳ සිතීමට පටන් ගත නොහැක.

"මහළු ඔබ" වෙනුවෙන් ඔබේ "තරුණ ඔබ" වෙහෙස වී වැඩ කරන්න.




හැම පුද්ගලයෙකුම විශ්‍රාමික අරමුදලක් ගොඩනගා ගැනීමට වෙහෙස වී වැඩ කළයුතුයි.

එවිට විශ්‍රාමයේදී එම අරමුදල විසින් පුද්ගලයා රැක ගනියි.

## සාරාංශය

| ජීවිත චක්‍රයේ අවධි | ප්‍රමුඛ මූල්‍ය අවශ්‍යතා |
|---|---|
| ළමාවිය | ■ අධ්‍යාපනය සහ සෞඛ්‍ය වියදම් |
| තරුණ අවිවාහක | ■ දෙමාපියන් සුරකීම<br>■ වැඩිපුර එන ආදායම ඉතිරි කිරීම<br>■ සෞඛ්‍ය හා අබලතා ආවරණ |
| තරුණ විවාහක | ■ දෙදෙනාගේම ආදායම් හා සෞඛ්‍ය වියදම් සුරක්ෂිත කිරීම |
| තරුණ විවාහක, කුඩා දරුවන් සිටින | ■ පවුල් ආදායම් රැකවරණය<br>■ සෞඛ්‍ය වියදම් රැකවරණය<br>■ ණය හා වගකීම් රැකවරණය<br>■ අධ්‍යාපන සැලසුම්<br>■ ඉතිරි කිරීම් වර්ධනය |
| විවාහක වැඩුණු දරුවන් සිටින | ■ ආදායම් රැකවරණය වර්ධනය කිරීම<br>■ සෞඛ්‍ය වියදම් රැකවරණයේ ප්‍රමාණය වැඩිකිරීම<br>■ විශ්‍රාමික හා ආදායම් සැලසුම් කිරීම<br>■ උසස් අධ්‍යාපන සැලසුම් සුරකීම |
| පෙර විශ්‍රාමික | ■ වඩාත් සුරක්ෂිත ආයෝජනයන් වෙත තමන්ගේ ආයෝජන යොමු කිරීම<br>■ සෞඛ්‍යාවරණ කාලය සහ ප්‍රමාණය වැඩි කිරීම |
| විශ්‍රාමය | ■ අඛණ්ඩ විශ්‍රාමික ආදායමක් ලැබීම සඳහා ආයෝජනයන් සුරක්ෂිත කිරීම. |

# 4

# වෘත්තීන්වල ස්වභාවය අනුව වෙනස්වන මූල්‍යමය අවශ්‍යතා

# 4.1. ස්වයං රැකියාවක නියුතු වෘත්තිකයින් (self employed professionals)

තමන් කරන දේ පිළිබඳ හොඳ ආත්ම විශ්වාසයක් තිබෙන, තම ස්වාධීනත්වය අගයන පුද්ගලයකු බොහෝ විට ස්වයං රැකියාවක නියුතු වෙයි. ස්වයං රැකියාවක ඇති ප්‍රධානම වාසිය වන්නේ, මුළු ශුද්ධ ලාභයම තමාට හිමිවීමයි. එසේ ම, ව්‍යාපාරයේ අවදානම් හා වගකීම් සියල්ලද තමා වෙත පැවරෙයි. එසේ ම ව්‍යාපාරයේ ඕනෑම තීරණයක් ගැනීමටත් අවශ්‍ය පරිදි ව්‍යාපාරය කරගෙන යාමටත් ඔහුට හෝ ඇයට හැකියාව ලැබේ. අනිවාර්යයෙන් විශ්‍රාම ගතයුතු යැයි නිශ්චිත වයසක් ද නැත.

## මූල්‍යමය අභියෝගය

ගායකයින්, ලේඛකයින්, සුළු ව්‍යාපාරිකයින් වෛද්‍යවරුන්, නීතිඥයින්, පෞද්ගලික පන්ති ගුරුවරුන්, ගෘහ නිර්මාණශිල්පීන් වැනි ස්වයං රැකියාවල නියුතු වන පුද්ගලයින් බොහෝ විට තම පවුලේ එකම ආදායම උපයන්නා විය හැකිය. ඔවුන්ගේ අකල් මරණයක් හෝ දුබලතාවක් හේතුවෙන් ආදායම ඇණ හිටියහොත් පවුලේ අනෙකුත් සාමාජිකයින්ට සිය ජීවන රටාව පවත්වා ගැනීමට හා අනාගත බලාපොරොත්තු ඉෂ්ට කර ගැනීමට නොහැකි වී ඉතා දුෂ්කර තත්ත්වයකට මුහුණ පෑමට සිදුවිය හැක. බොහෝමයක් අවස්ථාවල වැන්දඹු බිරිඳට සිය සැමියාගේ ස්වයං ව්‍යාපාර කටයුතු ඉදිරියට කරගෙන යාමට දක්ෂතාවයක් නොමැති විය හැක. උදා: වෛද්‍යවරයකුගේ හෝ නීතිඥවරයකුගේ කාර්යභාරය එවන් වෘත්තීයමය සුදුසුකමක් නොමැති භාර්යාවට කළ නොහැකිය. එමෙන්ම ස්වයං රැකියාවක නියුතු පුද්ගලයින්ට විශ්‍රාමිකයක් හෝ සේවක අර්ථසාධක අරමුදලක් ද නොමැත.

### මූල්‍ය විසඳුම

- ❑ හොඳ පවුල් ආදායම් රැකවරණ සැලසුමක් ලබා ගැනීම.
- ❑ හොඳ සෞඛ්‍යාවරණ රක්ෂණ සැලසුමක් හා විශ්‍රාමික ආදායම් සුරක්ෂිත කරන සැලසුමක් ලබා ගැනීම.

## 4.2. ආයතනයක සේවයේ නියුතු පුද්ගලයින් (employed)

යම් සේවා යෝජකයකු යටතේ හෝ ආයතනයක සේවය කරන පුද්ගලයෙකුට නිශ්චිතවම මාසිකව වේතනයක් ලැබෙන අතර 10% ත් 20% අතර වූ (මෙය අනිවාර්ය නොවේ) වාර්ෂික වැටුප් වැඩිවීමක් ද ලැබිය හැක. රජයේ රැකියාවක නියුතු වූවන් සඳහා විශ්‍රාමික මුදලක් රජයෙන් ලැබෙන අතර පෞද්ගලික අංශයේ රැකියාවක නියුතුවූවන් හට අදාළ සේවක අර්ථ සාධක අරමුදල ලැබෙන අතර අනිවාර්යය නොමැතිවුවත්, වාර්ෂික පාරිතෝෂික/ප්‍රසාද දීමනා (බෝනස් මුදල්) ද ලැබෙන්නට හැකියාවක් ඇත. එමෙන්ම සමහර ආයතනවලින්, පවුල් සෞඛ්‍ය ආවරණ මෙන්ම සමූහ ජීවිත රක්ෂණ ආවරණ පහසුකම් ද තම කාර්ය මණ්ඩලය වෙත ලබා දී ඇත.

### මූල්‍යමය අභියෝගය

ස්වයං රැකියාවක නියුතු පුද්ගලයෙකු හා සැසඳීමේදී ආයතනයක සේවයේ නියුතු පුද්ගලයෙකු මූල්‍යමය වශයෙන් යම් දුරකට සුරක්ෂිතය. නමුත් ස්වයං රැකියාවක් කරන පුද්ගලයකුට මෙන් නොව ආයතනයක සේවයේ නියුතු පුද්ගලයෙකු එක්තරා නිශ්චිත වයසකදී අනිවාර්යයෙන්ම එම ආයතනයෙන් ඉවත්වී විශ්‍රාම ගත යුතුය. එවිට සමාගමෙන් දෙනු ලැබූ සෞඛ්‍යාවරණ හා සමූහ ජීවිත රක්ෂණ ඔහුට තව දුරටත් නොලැබෙයි. විශ්‍රාමික ආදායමක් සම්පාදනය කර නොගත් පුද්ගලයෙකුට විශ්‍රාම ගත් විට ජීවත් වීම සඳහා තමන් විසින්ම ආදායමක් උපයා ගැනීමට සිදුවේ.

## මූල්‍ය විසඳුම

- ආදායම් හිඟයන් පියවා ගැනීමට සුදුසු පවුල් ආදායම් රැකවරණ විසඳුමක්.
- විශ්‍රාමික ආදායම් හිඟයන් පියවා ගැනීමට සුදුසු විශ්‍රාමික අරමුදල් සැලසුමක්.
- දරුවන්ගේ අධ්‍යාපන වියදම් සුරක්ෂිත කරන හොඳ අධ්‍යාපන අරමුදල් විසඳුමක්.

## 4.3. පෞද්ගලික අංශයේ විධායක ශ්‍රේණියේ නියුතු කළමණාකාරවරුන් (Company executives)

පෞද්ගලික අංශ විධායක නිලධාරීන්, කළමණාකාරවරුන්, සාමාන්‍යාධිකාරීවරුන්, ආයතනයක ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂකවරුන් වැනි විධායක ශ්‍රේණි මට්ටමේ රැකියා වල නියුතු පුද්ගලයින් ඉතා ඉහළ හා සුඛෝපභෝගී ජීවන රටාවන් පවත්වාගෙන යන කොටසකි. හොඳ වැටුප් හා පාරිතෝෂික ලබන මෙවැනි නිලධාරීන් ඉතා සුඛෝපභෝගී ජීවිත ගත කරති. ඔවුන්ගේ දරුවන්, ඉහළ පෙළේ රජයේ පාසල් වල හෝ ජාත්‍යන්තර පාසල් වල ඉගෙනුම ලබති. ඔවුන්ගේ ජීවන වියදම ඉහළ අගයක් ගන්නා අතරම විනෝද හා සංග්‍රහ කටයුතු වෙනුවෙන් ඉහළ පිරිවැයක් දරයි. ඔවුන්ගේ පවුලේ අය වෙනුවෙන් වාහන එකකට වඩා වැඩි ගණනක් භාවිතා කරයි.

## මූල්‍යමය අභියෝගය

මෙවැනි පවුල්වල ප්‍රධානතම අභියෝගය නම්, පුරුදු වූ ඉහළ ජීවන රටාව හා ගරු කටයුතු සමාජ තත්ත්වයන් පවත්වා ගෙන යාමයි. එවැනි තත්ත්වයන් ට සරිලන පරිදි නිවෙස් තැනීමට ඉතා මිල අධික නිවාස ණය ඔවුන් විසින් ලබා ගෙන තිබිය හැක. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය සඳහා ඉහළ වියදමක්

දරන අතරම සාමාන්‍ය හා උසස් පෙළ විදේශීය විභාග වලටත් සරසවි අධ්‍යාපනයටත් සූදානම් වන දරුවන් සිටින පවුල්වල් අධ්‍යාපනය සඳහා යන වියදම අතිශය ඉහළය.

විශේෂයෙන් ම මෙවැනි පවුල්වල සහකරු හෝ සහකාරිය සහ දරුවන්, ඔවුන් ජීවත් වන සමාජ තත්ත්වය හා ජීවන රටාවන් හේතුවෙන්, දුෂ්කර ජීවිත ගෙවීමට හුරු වී නොමැත.

## මූල්‍ය විසඳුම

- ❑ ඉහළ පෙළේ ජීවන රටාවන් දිගටම පවත්වාගෙන යාමට අවශ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට සුදුසු පවුල් ආදායම් රැකවරණයක්.
- ❑ දරුවන්ගේ අධ්‍යාපන වියදම් සුරක්ෂිත කිරීමට හොඳ අධ්‍යාපන වියදම් රැකවරණයක්.
- ❑ හුරුවූ ජීවන රටාව විශ්‍රාමයේදීත් පවත්වාගෙන යාමට හැකිවන පරිදි විශ්‍රාමික ආදායමක් ලබාදිය හැකි විශ්‍රාම අරමුදලක්.

## 4.4. ව්‍යාපාරිකයෙක් (Businessman)

ව්‍යාපාරිකයෙක් යනු කණ්ඩායමක් සමග යම් ව්‍යාපාරයක් / සමාගමක් පවත්වාගෙන යන පුද්ගලයෙකි. තම කණ්ඩායමේ කාර්යයන් තුළින් ඉහළ ලාභයක් උපයා ගැනීමේ අපේක්ෂාවෙන් යුතුව ඔහු විසින් එම ව්‍යාපාරය / සමාගම තුළට තමා සතු බොහෝ මුදලක් ආයෝජනය කර තිබෙනවා විය හැක. ව්‍යාපාරයක් හෝ සමාගමක් පවත්වාගෙන යාම ඉතා වෙහෙසකාරී කාර්යයක් වන අතරම, ඒ සඳහා සුදුසු දැනුම, පළපුරුද්ද සහ එම ව්‍යාපාර ලෝකය පිළිබඳ හොඳ අවබෝධයක් ද තිබිය යුතුය.

## ඔබෙන් පසු ව්‍යාපාරය කරගෙන යන්නේ කවු ද?

*රෝහණ, හම්බන්තොට ප්‍රදේශයේ කැපී පෙනෙන ව්‍යාපාරිකයෙකි. විශාල තොග වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඔහුට කුඩා ප්‍රමාණයේ කඩ සාප්පු සඳහා බඩු බෙදාහැරීමට වෑන් රථ පහක් හිමිය. මෙම කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කඩ සඳහා රෝහණ විසින් ලබා දෙන හොඳ මිල වට්ටම් හා හිතවත් සේවාව හේතුවෙන් රෝහණගෙන්ම අවශ්‍ය බඩු මිලට ගැනීමට ඔවුන් දිරිමත් වෙයි.*

*දරුවන් තිදෙනෙකුගේ පියෙකු වන රෝහණගේ දියණියන් දෙදෙනාගෙන් වැඩිමහල් දියණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වූවා පමණි. දෙවැනි දියණිය සාමාන්‍ය පෙළ පන්තියේ ඉගෙනුම ලබන අතර බාල පුතු පහ වසරේ ඉගෙනුම ලබයි. රෝහණත් බිරිඳත් තම දරුවන් ට හොඳින් ඉගැන්වීමට වෙහෙසෙන්නේ ඔවුන් රටේ යහපත් පුරවැසියන් බවට පත් කිරීමටයි. තම මුළු කාලයම දරුවන් හා නිවසේ වැඩපළ කිරීමට යොදවන රෝහණගේ බිරිඳ ඔහුගේ ව්‍යාපාරයට හවුල් වුණේ නැහැ. දවසින් වැඩි කාලයක් භාණ්ඩ මිලදී ගැනීම හා අලෙවි කිරීම මෙන්ම ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සියල්ල කළමනාකරණය කිරීමට යොදවන රෝහණ ගේ ව්‍යාපාරය ඉතා ඉක්මනින් වර්ධනය වුණා. ඒ සඳහා බැංකු කිහිපයකින් ම ණය මුදල් ලබා ගත්තේ සිය ව්‍යාපාරය හොඳින් වර්ධනය වන නිසා ණය පිළිබඳ කරදර වීමට අවශ්‍ය නොවන බව ඔහු විශ්වාස කළ නිසයි.*

*දිනක් බඩු ගබඩාවේ වැඩ බලමින් සිටි රෝහණට හදිසියේම දරුණු පපුවේ අමාරුවක් ඇතිවීම නිසා ඉක්මනින් රෝහල් ගත කළා. රෝහලට ගෙනියන අතරවාරයේ එක පිට ඇතිවුණු දරුණු හෘදයාබාධ දෙකක් නිසා රෝහලට ඇතුළත් කර විනාඩි*

10 ක් තුළදී රෝහණ සදහටම මෙලොවින් සමුගත්තා.

රෝහණගේ බිරිඳ මල්කාන්ති පසුවුණේ ඉතාමත් දුක්බර තත්ත්වයකයි. රෝහණගේ හදිසි වියෝවත් සමගම කඩා වැටුණු පවුලේ අනාගතය මෙන්ම රෝහණගේ ව්‍යාපාරයට කුමක් කළ යුතු දැයි ඇයට සිතා ගන්නටත් බැරිවුණා. ව්‍යාපාරයේ මෙහෙයුම් ඉදිරියට කරගෙන යාමට, පිරිස් කළමනාකරණය කිරීමට, සැපයුම්කරුවන් හමුවීමට, බැංකු සමග කටයුතු කිරීමට හා මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යාම වැනි කටයුතු පිළිබඳ මල්කාන්තිට කිසිදු අවබෝධයක් තිබුණේ නැහැ. හදිසියේම පියෙකු, ස්වාමිපුරුෂයෙකු මෙන්ම ව්‍යාපාරිකයෙකු බවට ඇය පත් වුණේ, මවක් හා බිරිඳක් යන භූමිකා වලට අමතරවයි.

මල්කාන්තිට එක පිට එක ගැටළු මතුවන්නට පටන් ගෙන තිබුණා. දිවා රෑ ඇයගේ සිතට වධ දුන් කරුණු කීපයක්ම තිබුණා;

- ❑ ව්‍යාපාරයට කළ යුත්තේ කුමක්ද? පවත්වා ගෙන යනවාද? විකුණා දමනවාද?
- ❑ ගේ දොර මාසික වියදම සොයා ගන්නේ කෙසේ ද?
- ❑ රෝහණ ජීවත්ව සිටි කාලයේදී සැළකූ ආකාරයටම දරුවන්ට සලකන්නේ කෙසේ ද?
- ❑ රෝහණ වගේ පියෙකුගේ චරිතය දරුවන් වෙනුවෙන් ඉටු කරන්නේ කෙසේ ද?
- ❑ දරුවන්ගේ අනාගත සිහින හා බලාපොරොත්තු ඉෂ්ට කර දෙන්නේ කෙසේද?

## මූලාපමය අභියෝගය

ව්‍යාපාර හිමිකරු මිය ගියහොත් හෝ සදාකාලික දුබලතාවකට පත් වූවොත්, ජීවත් වන සහකරුට සහකාරියට ජීවන රටාව පවත්වා ගැනීමට ඇති විකල්ප මොනවා විය හැකිද? ප්‍රධාන වශයෙන් විකල්ප තුනකි.

1. ව්‍යාපාරය ඉදිරියට දිගටම කරගෙනයාම
2. මුළු ව්‍යාපාරයම විකුණා දැමීම
3. ව්‍යාපාරයේ කොටස් වෙන වෙනම විකුණා මුදල් බවට හැරවීම

**පළමු විකල්පය :-** මෙය එතරම් පහසු කටයුත්තක් නොවෙයි. ව්‍යාපාරය ඉදිරියට කරගෙන යාමට නම්, ව්‍යාපාරිකයා සතුවූ සියලු කුසලතාවයන් හා පළපුරුද්ද බිරිඳට තිබිය යුතුය. එවැනි හැකියාවක් නොමැති වූ විට බිරිඳ විසින් ව්‍යාපාරය කරගෙනයාමේදී විවිධ පුද්ගලයින් නිසා හා ව්‍යාපාරය පිළිබඳ දැනුම අඩු නිසාත් බොහෝ විට දුර්වල කළමණාකාරීත්වයක් ඇතිවී අඩුලුහුඩු කම් ඇතිවීමටත්, ගැටළුකාරී තත්ත්වයන් උදාවීමටත් අවස්ථාව වැඩිය. එමෙන්ම ජීවත්වන සහකාරියට මවකගේ හා පියෙකුගේ යන දෙදෙනාගේම කාර්යභාරයන් ඉටු කිරීමටද සිදුවේ.

**දෙවැනි විකල්පය :-** සාධාරණ හා හොඳ ගැනුම්කරුවෙකු සිටියි නම්, මෙම විසඳුම යම් දුරකට හොඳ විකල්පයක් වේ. නමුත් බොහෝ විට සිදුවන්නේ ව්‍යාපාරිකයකුගේ මරණයක් නිසා ඇණහිටින ව්‍යාපාරයන් මිලදී ගැනීමට ගැනුම්කරුවන් ඉතා අඩු වටිනාකමක් ඉදිරිපත් කිරීමයි. ව්‍යාපාරයක් සතු වගකීම් සලකා බලන කල එය විකුණා

දැමීමෙන් පසු අතිරික්තය ලෙස ලැබෙන මුදල යැපෙන්නන්ට ප්‍රමාණවත් විය නොහැක.

**තුන් වැනි විකල්පය :-** එනම් ව්‍යාපාරය කොටස් වශයෙන් විකුණා දමා වගකීම් පියවීමෙන් අනතුරුව ඉතිරිය යැපෙන්නන් වෙනුවෙන් ලබා ගැනීමයි.

මෙම විකල්ප තුනෙන් කිසිවකින් යැපෙන්නන් වෙත වඩාත් හොඳ ප්‍රතිඵලයක් ලැබේද යන්න නිශ්චිතව කිව නොහැක. නමුත්, ජීවත් වන යැපෙන්නන්ට විශාල මූල්‍යමය අස්ථිරභාවයක් උදා වන බව නම් නිශ්චිත වශයෙන් කිව හැක.

## මූල්‍ය විසඳුම

- ❑ ව්‍යාපාරයට කුමක් සිදුවුවද එවැනි අවස්ථාවකදී ජීවත්වන යැපෙන්නන්ට ඔවුන්ට හුරු වූ ජීවන රටාව පවත්වා ගැනීමට හැකි ආකාරයේ ආදායමක් ලැබෙන පවුල් ආදායම් රැකවරණයක් තිබීම.

- ❑ ව්‍යාපාරයේ අනෙකුත් වගකීම් පියවීමට සුදුසු රක්ෂණාවරණයක් තිබීම.

- ❑ දරුවන්ගේ පාසල් හා සරසවි අධ්‍යාපනය (දේශීය හෝ විදේශීය) සඳහා යන වියදම් සුරැකීමට අවශ්‍ය අරමුදල් සැපයීමට සුදුසු අධ්‍යාපන රැකවරණයක් තිබීම.

- ❑ ජීවත්වන සහකරු / සහකාරිය හා දරුවන් ගේ පහසුව වෙනුවෙන්, නිරවුල් අන්තිම කැමති පත්‍රයක් සැකසීම

- ❑ හුරු පුරුදු වූ ජීවන රටාව විශ්‍රාම දිවියේදීත් පවත්වා ගෙන යෑමට හැකිවන පරිදි ආදායමක් ලැබීමට ස්ථාවර විශ්‍රාමික සැලසුම් ක්‍රමයක් තිබීම.

හවුල් ව්‍යාපාරයකදී නම්, සෑම හවුල් කරුවකුම තමන් විසින් ව්‍යාපාරයට යොදවන ලද ප්‍රාග්ධනයේ වටිනාකමට සමාන ජීවිතාවරණයක් ලබා ගෙන එහි ප්‍රතිලාභය, ව්‍යාපාරයේ අනෙකුත් හවුල් කරුවන් හෝ තම යැපෙන්නන් එහි නාමිකයන් ලෙස නම් කළ යුතුය. මෙම ජීවිතාවරණයේ වාරිකය ව්‍යාපාරය විසින් ගෙවිය යුතුවේ. මෙමගින් එක හවුල්කරුවකුගේ මරණයකදී අනෙකුත් හවුල්කරුවන්ට පහසුවෙන් ව්‍යාපාරය පවත්වා ගෙන යාමටත් මිය ගිය හවුල්කරු විසින් යෙදවූ ප්‍රාග්ධනයට සමාන මුදලක් ඔහුගේ යැපෙන්නන් වෙත ගෙවීමටද හැකියා ව ලැබේ.

# 5

# ජීවිත රක්ෂණ අවශ්‍යතා ගණනය කිරීම

## ජීවිත රක්ෂණ අවශ්‍යතා ගණනය කිරීම

ඔබට අද දිනයේ අකල් මරණයක් සිදු වූවොත්, ඔබේ ආදරණීයයන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය වන ජීවිත රක්ෂණ අවශ්‍යතා ප්‍රමාණය, පහත දැක්වෙන ආකාරයට ඔබටම ගණනය කර ගත හැකිවේ. එනමුත්, ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට පෙර ඒ පිළිබඳ වැඩිදුර විශ්ලේෂණයක්, පළපුරුදු රක්ෂණ උපදේශකවරයකුගේ උපදෙස් අනුව සිදුකර ගැනීම වඩාත් යෝග්‍යය.

## පවුල් ආදායම් අවශ්‍යතා ගණනය

| | ආදායම | රු |
|---|---|---|
| a | අද මාගේ මරණය සිදුවූවොත් මගේ පවුලට අවශ්‍ය වාර්ෂික ආදායම | |
| b | මගේ වෙනත් ආදායම් (වාර්ෂික) | |
| c | පවුලේ වාර්ෂික ආදායම් අවශ්‍යතාවය = a - b | |
| | (c)<br>මුළු ආදායම සුරක්ෂිත කිරීමට අවශ්‍ය ජීවිත රක්ෂණයේ වටිනාකම (අරමුදල)<br>= (පවුලේ වාර්ෂික ආදායම් අවශ්‍යතාවය/12x 100)<br>↑ (පොළිය) | |

c හි වටිනාකම අවශ්‍ය පමණ සාදා ගතහොත් ප්‍රධාන ආදායම් උපයන්නාගේ මරණයකදී පවුලකට සිය ජීවන රටාව පෙර සේම පවත්වා ගත හැකියි.

අ. වත්කම් රැකවරණ අවශ්‍යතා ගණනය

| | වත්කම් | රු |
|---|---|---|
| d | ඉතිරිකිරීම්, ආයෝජනයන්, දේපළ හා අනෙකුත් දෑ | |
| e | සියළුම වගකීම් (උකස් ණය හා පියවීමට ඇති අනෙකුත් ණය මුදල්) | |

**ප්‍රධාන ආදායම් උපයන්නාගේ අභාවයයේ දී**

(i) ප්‍රමාණවත් වටිනාකමකින් යුත් ජීවිත රක්ෂණයකින් ප්‍රධාන ආදායම් උපයන්නාගේ ආදායම ගෙදරට / යැපෙන්නන්ට ලැබීමට සැලැස්වීමෙන් යැපෙන්නන්ගේ සුපුරුදු ජීවන රටාව ආරක්ෂා කළ හැකියි.

(ii) සියළුම මූල්‍ය වගකීම්/ණය වලට සමාන රක්ෂණ ආවරණයක් ලබා ගැනීමෙන් පවුලේ සියළුම වත්කම් රැක ගත හැකියි.

**ආ. ජීවත්ව සිටියදී ඇතිවන වෙනත් මූල්‍ය අවශ්‍යතා**

මෙම ස්වයං ඇගයීම කළ පසු, යම් පුද්ගලයකුට තමාගේ ජීවිත රක්ෂණ අවශ්‍යතා හිඟය අනාවරණය කරගෙන ඒ පිළිබඳව දැනුවත්වී, එම හිඟය පියවා ගැනීමට සුදුසු පියවර ගැනීමට හැකියාව ලැබේ.

| මූල්‍ය අවශ්‍යතාව | මුළු අවශ්‍යතාවය | දැනට ඇති මුදල/ සැලසුම | අවශ්‍යතා හිඟය |
|---|---|---|---|
| **ඉතිරි කිරීම් හා ආයෝජනයන්**<br>පවුලේ විශේෂ කටයුතු හෝ පෞද්ගලික අවශ්‍යතා සඳහා මුදල්. | | | |
| **විශ්‍රාමික ආදායම**<br>සුවපහසු විශ්‍රාමික ජීවිතයක් සඳහා ප්‍රමාණවත් මුදලක්. | | | |
| **සෞඛ්‍ය වියදම්**<br>මා මහන්සි වී ඉතිරි කරගත් මුදල් වැය නොකර මගේ සෞඛ්‍ය වියදම් පියවීමට සුදුසු විසඳුමක් තිබීම. | | | |

සෑම විටම වෘත්තීයමය ජීවිත රක්ෂණ උපදේශකවරයකුගේ සහය ලබාගෙන සම්පූර්ණ ජීවිත රක්ෂණ අවශ්‍යතා විශ්ලේෂණයක් කරගැනීම යෝග්‍යයි.

## ජීවිත රක්ෂණයට විකල්පයක් නැත

තිලකරත්න මහතාගේ පවුලේ ජීවන රටාව පවත්වා ගැනීමට මාසිකව රු. 100,000 ක මුදලක් අවශ්‍ය වේ. බිරිඳ ගෘහණියක් වන අතර ඔහුට කුඩා දරුවන් දෙදෙනෙකු සිටියි. ඔහු සතුව දැනට ඇති ඉතිරි කිරීම් හා ආයෝජන ප්‍රමාණය රු. 3,600,000 ක් වන අතර තිලකරත්න මහතා ජීවිත රක්‍ෂණය පිළිබඳ විශ්වාස නොකරන්නෙකි.

ඔහු අද දිනයේ අකල් මරණයකට භාජනය වුහොත් ඔහුගේ බිරිඳ හා දරු දෙදෙනාට එම මුදලින් තමන් ට හුරු වූ ජීවන රටාව පවත්වා ගෙන යාමට හැකිවන්නේ මාස 36 ක් වැනි කාලයකට පමණි. (3,600,000/100,000) එසේනම් ඔහුගේ රැකියාවක් නොකරන බිරිඳ, මාස 36 කින් පසු පවුල පවත්වාගෙන යන්නේ කෙසේ ද?

# 6

# ජීවිත රක්ෂණයේ මූලික සිද්ධාන්ත සහ ආකල්ප

## 6.1 ජීවිත රක්ෂණයේ මූලික සිද්ධාන්ත

මූලික වශයෙන් ජීවිත රක්ෂණය සිද්ධාන්ත දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වෙයි.

### ❑ උපරිම විශ්වාසය

ජීවිත රක්ෂණය සම්පූර්ණයෙන්ම විශ්වාසය මත ගොඩනැගුනු ව්‍යාපාරයකි. ජීවිත රක්ෂණ ඔප්පුව ලබා ගන්නා පුද්ගලයා (රක්ෂිතයා) විසින්, ලබා දෙන ලෙස ඉල්ලීමක් කළද නොකළද, අත්‍යවශ්‍ය සියලුම තොරතුරු නිවැරදිව හා සම්පූර්ණයෙන්ම රක්ෂණ සමාගම (රක්ෂකයා) වෙත, ලබා දිය යුතු බව මින් අදහස් වේ.

### ❑ රක්ෂණීය අයිතිය

එක් පුද්ගලයකු (A) තවත් පුද්ගලයකු (B) කෙරෙහි රක්ෂණීය අයිතියක් ඇතිවන්නේ පළමු කී පුද්ගලයා (A) හට දෙවැනි පුද්ගලයා (B) ගේ මරණය/දුබලතාවට පත්වීම/අසාධ්‍ය රෝගයක් වැළඳීම යන කරුණු නිසා මූල්‍යමය වශයෙන් පාඩුවක් සිදුවෙනවා නම් ය. එනම්, කිසියම් පුද්ගලයෙකුට රක්ෂණය කරන පුද්ගලයාගේ (තමා ඇතුළුව) ජීවිතයට නීතිමය අයිතියක් හෝ සම්බන්ධතාවයක් තිබිය යුතුයි.

## 6.2 ජීවිත රක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාවේ බහුතරය දරන ආකල්පය

ජීවිත රක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාවේ බහුතරයක් දරන්නේ ඉතා සෘණාත්මක ආකල්පයකි. ඊට පහත සඳහන් කරුණු බලපෑ හැක.

## ❑ ජීවිත රක්ෂණය පිළිබඳ නිවැරදි දැනුමක් අඩු වීම

ජීවිත රක්ෂණය යනු වසර 3000 ක් පමණ පැරණි, පුද්ගලයින්ගේ අනාගත මූල්‍යමය වශයෙන් සුරක්ෂිත කිරීමට හැකි සංකල්පයකි. එනමුත් ශ්‍රී ලංකාව තුළ ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් තරම් මූලාශ්‍ර හා දත්ත නැත. මෙම විෂයය පාසල් තුළ හෝ වෙනත් අධ්‍යාපන ආයතන තුළ ප්‍රමාණවත් තරමින් ඉගැන්වීමක් සිදු නොවෙයි. ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණයේ වැදගත්කම අනාවරණය වන අන්දමේ සඟරා, ලිපි ලේඛන, පුවත්පත්, පොත් හෝ වෙනත් තොරතුරු මූලාශ්‍රයන් නැත. මේ හේතු නිසා ම ජීවිත රක්ෂණය හා එහි ඇති අද්විතීය ප්‍රතිලාභයන් පිළිබඳ අඩු තක්සේරුවක් හා අඩු පිළිගැනීමක් මෙන්ම නිවැරදි දැනුමේ අඩුවක් ලාංකික සමාජය තුළ බහුලව දක්නට ලැබේ.එනමුත් බොහෝ සංවර්ධිත රටවල ජීවිත රක්ෂණය යන සංකල්පය පිළිබඳ හොඳ අවබෝධයක් හා දැනුමක් එම ජනතාවට ලබා ගැනීමට බොහෝ මාර්ග ඇත.

## ❑ රක්ෂණ ඔප්පු හිමියන්ගේ පෞද්ගලික අත්දැකීම්

ඉතා සාධාරණ හේතු මත රක්ෂණ සමාගමක් මගින් යම් වන්දියක් ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභයක් ලෙස නොගෙවූ විට, සමහරක් පුද්ගලයින් ජීවිත රක්ෂණය දැඩි ලෙස හෙළා දකිමින් විවේචනයට ලක් කරයි. ඔවුන් ප්‍රචලිත කරන මතයක් වන්නේ, “ජීවිත රක්ෂණය නම් මිළට ගන්න පහසුයි, නමුත් වන්දියක් ලබා ගැනීම අති දුෂ්කරයි.” මීට සුලභ හේතුවක් වන්නේ, ජීවිත රක්ෂණයක් මිළට ගැනීමේදී ඊට අවශ්‍ය තොරතුරු සම්පූර්ණ ලෙස ලබා නොදීම හෝ එම ජීවිත රක්ෂණය නිසි පරිදි වාරික ගෙවමින් පවත්වාගෙන නොයාමත් ය.

රක්ෂණ සමාගමක් විසින් ජීවිත රක්ෂණ වන්දියක් හෝ ප්‍රතිලාභයක් නොගෙවා සිටීමට හේතු කිහිපයක් ඇත. ඒවා නම්;

- වාරික මුදල් හිඟ වීම; ගෙවීම පැහැරහැර තිබීම
- පාරිභෝගිකයා වන්දිය ඉල්ලන ප්‍රතිලාභය එම ඔප්පුවට ඇතුළත් කර නොතිබීම
- පාරිභෝගිකයා විසින් සත්‍ය තොරතුරු වසන් කර තිබීම හෝ අවශ්‍ය සියලු තොරතුරු සම්පූර්ණ ලෙස සමාගමට ලබා නොදී තිබීම
- අදාළ ප්‍රතිලාභය හෝ සිද්ධිය ඔප්පුවේ කොන්දේසි වලට අනුව බැහැර කර තිබේ නම්
- ප්‍රතිලාභීන් හෝ නාමිකයින් ඔප්පුවේ සඳහන් කර නොමැති නම්
- රක්ෂණ ඔප්පු හිමියාගේ වයස සනාථ කිරීමට අවශ්‍ය සහතික කරන ලද උප්පැන්න සහතිකය හෝ රක්ෂණ සමාගම විසින් ඒ සඳහා පිළිගන්නා වෙනත් කිසිදු ලේඛනයක් මගින් වයස සනාථ කර නොතිබීම

ජීවිත රක්ෂණ ගිවිසුමක් ඉතා හොඳින් කියවා බලා අවබෝධ කරගත යුතුය. ඔප්පු හිමියන්ට ජීවිත රක්ෂණයක් මිලදී ගන්නා අවස්ථාවේ දී එහි අඩංගු ප්‍රතිලාභයන්, කොන්දේසි හා වරප්‍රසාද මෙන්ම බැහැර කිරීම් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම වෘත්තීයමය ජීවිත රක්ෂණ උපදේශකවරයකුගේ වගකීමකි.

රක්ෂණ සමාගමකට ජීවිත රක්ෂණ වන්දියක් නොගෙවීමෙන් කිසිදු වාසියක් සිදු නොවෙයි. රක්ෂණ සමාගම

හැමවිටම ජීවිත රක්ෂණ වන්දි ගෙවීමට බැඳී සිටියි. නිවැරදිව නිරවුල්ව මිලදී ගත් රක්ෂණ ඔප්පු වලින් හිමිකම් ලබා ගැනීම ඉතාමත් පහසු වේ.

- **වෘත්තීයමය නොවන රක්ෂණ උපදේශකවරුන්ගේ නොමනා ව්‍යාපාර කටයුතු**

ජීවිත රක්ෂණයක් සෑම විටම නිර්දේශ කළයුත්තේ, පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් සැළකිල්ලට ගනිමින්, සත්‍ය තොරතුරු සම්පූර්ණයෙන් හෙළිදරවු කරමින් හා දැරිය හැකි වාරික ප්‍රමාණයත් අනුවය. සතුටුදායක ලෙස පසු අලෙවි සේවාවන් ලබා දීමද ඉතා වැදගත්වේ. මෙම අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවන් වලදී හෝ එම යුතුකම් පැහැර හැරිය අවස්ථාවන් වලදී පාරිභෝගිකයින් අසතුටු වන අතරම, ජීවිත රක්ෂණ වාරික ගෙවීම නවතා දමා ජීවිත රක්ෂණය පිළිබඳ සෘණාත්මක ආකල්පයක් ගොඩනගා ගනිති. සෑම රක්ෂණ සමාගමකම වගකීම වනුයේ සිය ජීවිත රක්ෂණ උපදේශකවරුන්හට නිසි පුහුණුවක් ලබාදී ඔවුන් උසස් ඇගයීම් ඇති, අවංක හා ව්‍යාපාර ආචාරධර්ම වලට අනුකූල වෘත්තිකයින් බවට සංවර්ධනය කිරීමයි.

ශ්‍රී ලංකා රජය විසින් රක්ෂණ කර්මාන්තය දැඩි ලෙස විධිමත් කර ඇති අතර හොඳ අධීක්ෂණයක් පවත්වා ගනියි. එම අධීක්ෂණය හොබවන්නේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගිනි. එහි ප්‍රධාන වගකීම වන්නේ, ජීවිත රක්ෂණ සමාගම් මගින් තම ව්‍යාපාර කටයුතු මනා කළමනාකරණයකින් යුතුව පවත්වා ගෙන යන බවටත්, ඔවුන්ගේ පාරිභෝගිකයින් හට නිවැරදි සේවාවක් ලබා දෙන බවත් අධීක්ෂණය මගින් තහවුරු කිරීමය.

## 6.3 රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා (රක්ෂණ දුක්ගන්නාරාළ)

ඔම්බුඩ්ස්මන්වරයා යනු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පත් කරන ලද ස්වාධීන පුද්ගලයෙකි. ඔහුගේ ප්‍රධාන කාර්යභාරය වනුයේ රක්ෂණ ඔප්පුහිමියන්ගේ දුක් ගැනවිලි හා ඔවුන්ට සිදුවූ අසාධාරණ කම් පිළිබඳව සවන්දී යම් යම් එකඟතාවන්ට හෝ ගැටළු නිරාකරණය කිරීමට සහය වීමයි. මෙම සේවාව නොමිලේ කරදෙනු ලබයි.

**රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා**

143 ඒ, වජිර පාර, කොළඹ 5

දුරකතන අංක : 00 94 11 4528671, 2505542

ෆැක්ස් අංකය : 00 94 11 4528670

ඊ මේල් : info@insuranceombudsman.lk

වෙබ් අඩවිය : www.insuranceombudsman.lk

# 7

# විවිධ ජීවිත රක්ෂණ වර්ග

විවිධාකාර වූ ජීවිත රක්ෂණ වර්ග නූතන රක්ෂණ වෙළෙඳපොළේ බහුලය. එනමුත් ජීවිත රක්ෂණයක් මිලදී ගත යුත්තේ නිවැරදි උපදෙස් මතය.

## ❑ කාලීන රක්ෂණය (Term Insurance)

කාලීන රක්ෂණය, වෙළෙඳපොළේ ඇති සරල හා මිල අඩු රක්ෂණ ක්‍රමයකි. මෙවැනි ජීවිත රක්ෂණ ක්‍රම මගින් නිශ්චිත මූල්‍යමය අගයක් වෙනුවෙන් නිශ්චිත කාල සීමාවක් තුළ රැකවරණය සපයයි. එකඟ වූ කාල සීමාව තුළදී මරණයක් සිදුවුවහොත් පමණක් එකඟ වූ මූල්‍ය අගය යැපෙන්නන් සඳහා ගෙවනු ලැබේ. කිසිදු ආපදාවකින් තොරව එකඟ වූ කාලය ඉක්ම ගිය විට, අදාළ ජීවිත රැකවරණය අහෝසි වන අතර කිසිදු කල් පිරීමේ ප්‍රතිලාභයක් හෝ මුදලක් ආපසු නොගෙවයි. හදිසි අනතුරු මරණ අවදානම වෙනුවෙන් මෙවැනි ම රක්ෂණ සැලසුම් පවතියි.

## ❑ පරිත්‍යාග රක්ෂණය (Endowment Insurance)

මේ වර්ගයේ රක්ෂණ සැලසුම්වල ක්‍රියාකාරීත්වය, කාලීන රක්ෂණයට තරමක් දුරට සමානය. එනමුත් මෙහි වෙනස නම්, නිශ්චිත කාල සීමාව අවසානයේ එකඟවූ මුදල සමාගම විසින් ගෙවනු ලැබීමයි. රක්ෂණ සමාගම් වලින් නිකුත් කර ඇති ජීවිත රක්ෂණ බොහෝමයක්ම පාහේ පරිත්‍යාග වර්ගයේ රක්ෂණය වේ. මෙම රක්ෂණ ඔප්පු වල එකඟ වූ රක්ෂිත මුදල සහතික වන අතර ඔප්පුව කල්පිරීමේදී ජීවිත රක්ෂිතයා ජීවත්ව සිටියි නම් කල් පිරුණු ප්‍රතිලාභද (රක්ෂිත මුදල) හිමිවෙයි.

## ❑ ඒකක භාර රක්ෂණ (Unit Linked Insurance)

ඒකක භාර රක්ෂණය, පරිත්‍යාග වර්ගයේ ඔප්පු වලට සමාන රක්ෂණ ක්‍රමයකි. එනමුත්, ඒකක භාර ඔප්පුවක කල්පිරීමේ වටිනාකම පිළිබඳ නිශ්චිත සහතිකවීමක් නැත. ඒකක භාර රක්ෂණ ඔප්පුවල ආයෝජන කොටස, කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි සමාගම් වල කොටස් වල

ආයෝජනය කරයි. මෙය සිදු කෙරෙන්නේ රක්ෂණ සමාගම් වලින් නිර්මාණය කරගත් අරමුදල් හරහායි. රක්ෂණ ඔප්පුවේ ආයෝජන අගය, කොටස් වෙළෙඳපොළේ සමාගම් කොටස් වල අගයන් අනුව ඉහළ පහළ යයි. රක්ෂණ ඔප්පුවේ කල්පිරුණු ප්‍රතිලාභය සියලුම කොටස් වල වටිනාකමට සමාන වෙයි.

## ❑ අමතර ආවරණ (Rider Benefits)

අමතර ආවරණ යනු පරිත්‍යාග වර්ගයට අදාළ වූ ජීවිත රක්ෂණ ඔප්පු වලට ඈඳා ගත හැකි අමතර රක්ෂණ ආවරණ වේ. මෙමගින් රක්ෂිත ජීවිත වලට අදාළ ප්‍රතිලාභ වැඩි කරගත හැක. උදා: අමතර ජීවිත ආවරණ, හදිසි අනතුරු ආවරණ, සෞඛ්‍යාවරණ ආදී... මෙම අමතර ආවරණ වල ප්‍රධානම වාසිය වන්නේ වැඩි ආවරණයක් අඩු වාරිකයකට ලබා ගත හැකි වීමයි. අමතර ආවරණ වලට කල්පිරීමේ ප්‍රතිලාභයක් නොමැත.

# 8

# ජීවිත රක්ෂණයක් මිලදී ගත හැකි ක්‍රම

## 8.1 ජීවිත රක්ෂණ සමාගමක් තෝරා ගන්නේ කෙසේද?

රක්ෂණය යනු ඉතා විධිමත් හා විනයක් සහිත ව්‍යාපාරයකි. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් සියලුම රක්ෂණ සමාගම් අධීක්ෂණය වෙයි. ලියාපදිංචි රක්ෂණ සමාගම් පිළිබඳ අධ්‍යයනය කළ හැකි හොඳම මාර්ගය වනුයේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වෙබ් අඩවියට පිවිස එම සමාගම් වල කාර්යසාධනය හා ප්‍රතිඵල අධ්‍යයනය කිරීමයි. එමගින් සමාගම් කිහිපයක් තෝරා ගැනීමෙන් අනතුරුව එම සමාගම් වල වෙබ් අඩවි වලට පිවිස ඒවායේ ස්ථාවරත්වය, මූල්‍ය විසඳුම්/ රක්ෂණ ඔප්පු, සේවාවන්, වෙළෙඳ නාම හා එම සමාගම් පිළිබඳ ඇති කීර්ති නාමය යනාදී කරුණු සම්බන්ධව හොඳ අවබෝධයක් ලබා ගත හැකිය.

## 8.2 ජීවිත රක්ෂණයක් මිලදී ගත හැකි ක්‍රම.

**අ. රක්ෂණ අලෙවි නියෝජිතයකුගෙන්**

ජීවිතරක්ෂණයක් මිලදී ගැනීමට වඩාත් සුදුසු නියෝජිතයෙකු තෝරා ගැනීම තරමක් අභියෝගාත්මක කටයුත්තක් විය හැකියි. ඒ සඳහා ඔබේ මිතුරන්ගේ, කාර්යාලයේ ඔබ හා එකට වැඩ කරන අයගේ හෝ ඔබේ නෑයන්ගේ ජීවිත රක්ෂණ කටයුතු කරන නියෝජිතයින් පිළිබඳව විමසා බලා ඔවුන්ගෙන් හොඳ නියෝජිතයකු පිළිබඳ නිර්දේශයක් ලබා ගැනීම උචිතයි.

**හොඳ නියෝජිතවරයකු හඳුනා ගත හැකි ලක්ෂණ;**

- ✓ සුහදශීලියි
- ✓ අඩුවෙන් කතාකර, හොඳින් සවන් දෙයි, ප්‍රශ්න අසයි.
- ✓ පළමුවෙන් පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් තේරුම් ගනියි, ඊට අවශ්‍ය තොරතුරු එක්රැස් කරයි.

- ✓ තමන් කතා කරන විෂය සම්බන්ධයෙන් ගැඹුරු දැනුමක් ඇත.
- ✓ රක්ෂණ මණ්ඩලය මගින් නිකුත් කරන බලපත්‍රය ලබා ඇති අතර සමාගම මගින් ඉතා හොඳින් පුහුණුවීම් ලබා තිබීම.
- ✓ වෘත්තිකයකු ලෙස කටයුතු කිරීමේ ඉතිහාසයක් ඇති අයකු වීම.
- ✓ විශ්වාසය තැබිය හැකි බව හා වගකීමෙන් යුතුව කටයුතු කිරීම.
- ✓ මිලදී ගැනීමට බල නොකරයි.
- ✓ ගනුදෙනුව අවසන් කිරීමට හදිසි නොකරයි.
- ✓ පාරිභෝගිකයාට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් හෝ අලෙවි නොකරයි.
- ✓ නියෝජිතයා නිර්දේශකරන ඔප්පුව/විසඳුම ම මිලදී ගැනීමට සෘජුව හෝ වක්‍රව බල නොකරයි.
- ✓ ඉල්ලා සිටින සියළුම හා අත්‍යවශ්‍ය තොරතුරු ලබා දෙයි.
- ✓ පාරිභෝගිකයා මෙන්ම ප්‍රතිලාභීන්ද හොඳින් දැනුවත් කරයි.

**සාර්ථක අලෙවියක් සිදු කිරීමට හොඳ නියෝජිතවරයකු විසින් ඉටු කළ යුතු දේ;**

- ✓ අත්‍යවශ්‍ය තොරතුරු එක්රැස් කර නිවැරදිව අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකර අවශ්‍යතා හිඟයන් පිළිබඳ පාරිභෝගිකයා හොඳින් දැනුවත් කිරීම.

- ✓ හොඳින් වේලාව ගෙන එම අවශ්‍යතා හිඟයන්ට සුදුසු විසඳුමක් නිර්මාණය කිරීම.
- ✓ ඉන්පසු පාරිභෝගිකයා හමුවී තමන් නිර්මාණය කළ විසඳුම ඉදිරිපත් කර, අසන සෑම ප්‍රශ්නයකටම නිවැරදිව හා සම්පූර්ණයෙන් පිළිතුරු සැපයීම.
- ✓ වාරික ගෙවිය හැකි ආකාර හා හිමිකමක් ඉදිරිපත් කිරීමේදී කළයුතු සියල්ල හොඳින් පහදා දීම.
- ✓ ඔප්පුවෙන් ආවරණය නොවන සියලු දේ පිළිබඳ පැවසීම.
- ✓ වැඩිදුර සහතික වීම් සඳහා, අත්‍යවශ්‍යනම්, තම සමාගමේ සහය ලබා ගැනීම.

## ආ. ජීවිත රක්ෂණ සමාගමකින් සෘජුවම, මිලදී ගැනීම

ජීවිත රක්ෂණයක් ලබා ගැනීමට ඇති හොඳ ක්‍රමයක් නම් ඔබ තෝරාගත් සමාගමක් වෙත ගොස් සෘජුවම මිලදී ගැනීමයි. ඔබ තෝරා ගත් ජීවිත රක්ෂණ සමාගමේ පාරිභෝගික සේවා අංශය වෙතට ගොස් ඔබේ අවශ්‍යතාවයන් ට වඩාත් ගැලපෙන ලෙස ජීවිත රක්ෂණ ක්‍රමය සාකච්ඡා කර ඔවුන්ගේ උපදෙස් ලබා ගත හැකියි. සමහරක් අවස්ථාවලදී එම අංශය මඟින් ඔබට වඩාත් ගැලපෙන ලෙස හොඳින් ජීවිත රක්ෂණ විසඳුම ලබා දීම සඳහා, ප්‍රවීණ ජීවිත රක්ෂණ උපදේශවරයකුගේ සහය ලබා ගනියි.

## ඇ. වෙබ් අඩවියක් හරහා මිලදී ගැනීම

සමහර සමාගම් සිය වෙබ් අඩවිය ඔස්සේ ජීවිත රක්ෂණාවරණ මිලදී ගැනීමට පහසුකම් සපයා ඇත. මෙය පාරිභෝගිකයින්ට ඉතාමත් පහසු ක්‍රමයකි. පාරිභෝගිකයෙකුට මෙම ක්‍රමයේ ඇති ප්‍රධාන අවාසිය වන්නේ, තම රක්ෂණ අවශ්‍යතා පිළිබඳ නියෝජිතයකු හා සාකච්ඡා කිරීමේ වාසිය

නොලැබී යාම හා එම අවශ්‍යතාවන්ට වඩාත් ගැළපෙන රක්ෂණ විසඳුම තෝරා ගැනීමට අවශ්‍ය වෘත්තීමය උපදේශයක් නොලැබීයාමය.

**ඈ. තමා රැකියාව කරන සමාගම හරහා**

පුද්ගලයෙකුට සිය සමාගමේ මානව සම්පත් අංශය වෙතින් ජීවිත රක්ෂණය පිළිබඳ උපදෙස් ලබා ගත හැකිය. සමහර ආයතනවල මානව සම්පත් අංශයෙන් නොමිලේ රක්ෂණ උපදෙස් ලබාදෙන අතර, සමහරක් සමාගම් වල ඔවුන්ගේම අභ්‍යන්තර රක්ෂණ නිලධාරීවරුන්ද සිටිති. ඔවුන් සමූහ ජීවිත රක්ෂණාවරණ සිය කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් වෙත ලබා දෙයි.

## 8.3 නාමිකයින්/ ප්‍රතිලාභීන් නම් කිරීම

ජීවිත රක්ෂණයක් මිලදී ගන්නේ තව කෙනෙකුට ඇති ආදරය නිසාවෙනි. එනමුත්, ප්‍රතිලාභීන් හෝ නාමිකයින් හරි ආකාරව නම් කිරීම සිදු නොවුණහොත් අදාළ ප්‍රතිලාභ එම ප්‍රතිලාභීන් හෝ නාමිකයින් හට ලැබීම් ප්‍රමාද විය හැක.

ප්‍රතිලාභීන් හෝ නාමිකයින් නම් කිරීමට පෙර ප්‍රධාන ආදායම් උපයන්නා හෝ ජීවිත රක්ෂිතයා විසින් සිතා බැලිය යුතු කරුණු වන්නේ ,

- ❑ පියාගේ මරණයක් සිදුවුවහොත් ප්‍රතිලාභ මුදල් ලැබිය යුත්තේ කාට ද?
- ❑ මවගේ මරණයක් සිදුවුවහොත් ප්‍රතිලාභ මුදල් ලැබිය යුත්තේ කාට ද?
- ❑ මවත් පියාත් දෙදෙනාම එක විට මිය ගියහොත් ප්‍රතිලාභ මුදල් ලැබිය යුත්තේ කාට ද?

සාමාන්‍යයෙන් අවුරුදු 18ට අඩු දරුවන් නාමිකයින් හෝ ප්‍රතිලාභීන් ලෙස පත් කිරීම එතරම් යෝග්‍ය නොවෙයි. ඊට හේතුව වන්නේ නෛතික ගිවිසුම් වල දී මුදල් සම්බන්ධව ගනුදෙනු කිරීමට ඔවුන්ට අයිතියක් නොමැති බැවිනි.

මවත් පියාත් යන දෙදෙනා ම එකවිට මිය ගිය අවස්ථාවක, දරුවන් රැක බලා ගැනීමට යම් වැඩිහිටි පුද්ගලයෙකු සිටිය යුතුය. වඩාත් සුදුසුම විසඳුම නම් එම ඔප්පුව මහා භාරකරු හෝ වෙනත් භාරකරුවෙකු වෙත පැවරීමය.

# 9

# ජීවිත රක්ෂණ අත්දැකීම්

# මිලින්ද, ඔබ අපිට ඉතිරි කළේ ලොකු වේදනාවක් !

මා ආදරණීය සැමියා වන මිලින්ද වෙතයි,

ඔබ ඔය තරම් රක්ෂණය ප්‍රතික්ෂේප කළේ ඇයි? ඔබ ජීවිත රක්ෂණය ගැන කතා කරන විට ඊට අවඥාවෙන් හිනා වුණේ තරුණ වයසේ මියනොයන බවත් ඔබ මියගියත් මා නැවත විවාහ වන බවත් කියමින්. එත් හරියටම ඊට අවුරුද්දකට පස්සේ මාව තනිකරලා ඔබ මිය ගියා. ඔබේ මරණයෙන් අවුරුද්දක් දැන් ගතවෙලා, අපට ජීවත් වෙන්න තරම් ප්‍රමාණවත් මුදලක් අපට දැන් නැහැ. විඳින දුක් නිසා මම ශාරීරිකව හා මානසිකව පහළටම ඇද වැටුණා.

නොහිතූ විදිහට දුවත් මමත් තනි වුණා. නිවාස ණය වාරික ගෙවාගන්න බැරිවුණු නිසා අපේ ගෙදර, බැංකුවෙන් වෙන්දේසි කළා. දැන් රැකියාවල් දෙකක් කරන මම මාසේ වියදම ගෙනියන්නේ බොහොම අමාරුවෙන්. ණයකාරයන් ගෙදරටත් මගේ යාළුවන්ටත් දුරකථනයෙන් කතා කරලා කරදර කරනවා. දැන් මම රැකියාව කරන තැනටත් ඒ අය කතා කරනවා. ඔයාට හෘදයාබාධය හැදිලා රෝහලට ගෙන ගිහින් ලබා දුන්නු ප්‍රතිකාර වලටයි දොස්තර හා රෝහල් ගාස්තුයි විතරක්ම රුපියල් ලක්ෂ 6 ක් වුණා. ඒවා ගෙවුවේ මගේ රත්තරන් බඩු උකස්තියලයි. ඒවා දැන් බැංකුවට සින්න වෙන්න ළඟයි.

අපි ඉස්සර කොයි තරම් නම් සතුටින්ද හිටියේ.. පුංචි පහේ සතුටක් වත් දැන් නැති තරම්, මේ විඳින දුක් කරදර නිසා. එක අතකින් බලන විට මේවාට ඔබ හා සමානව මමද වගකිව යුතුයි. ජීවිත රක්ෂණ නිලධාරියා කියූ දේවල්, ඉදිරියේදී මටත් විය හැකියි කියල මට හිතන්නට තිබුණා. නමුත් මම කළේ අපි එතරම් අවාසනාවන්ත නැහැ කියල හිතලා ඔබත් එක්ක ඒවාට හිනා වුණු එක විතරයි.

ඒ ගැන හිතනකොට විහිලුව කැරකුණේ මා වෙතයි. නැවත කවදාකවත් විවාහ වෙන්න අදහසක් මට නැහැ. තමන්

ආදරය කළ කෙනෙකුගේ වියෝවෙන් පසු, දුක හා වේදනාව කොයි තරම් දැඩිව තමන්ට දැනෙනවාද යන්න හරිම පුදුම කාරණයක්; ඒක ඒ තරම්ම කටුකයි.

ඔබට මේ ලියුම ලියන්නේ මම දැන් මගේ ජීවිතය වෙනුවෙන් ජීවිත රක්ෂණයක් අරගත් බව කියන්නයි. කොයි තරම් අගහිඟකම් තිබුණත්, මගේ පඩිය ලැබුණම වෙන්කර ගෙවන පළමු බිල මගේ ජීවිත රක්ෂණ වාරිකයයි. මට හදිසියේ යමක් වුණොත්, මගේ දුවට කවදාවත් දුක් විඳින්න මම ඉඩ දෙන්නේ නැහැ; මගේ දුවගේ අනාගතය සුරක්ෂිතයි. ඒත් මිලින්ද, එදා ඔයා ජීවත්ව සිටින කාලයේදී අපි වෙනුවෙන් රුපියල් 4000 ක් වෙන් කළානම්, අද දුවටත් මටත් මෙහෙම දුක් නොවිඳ සතුටින් සැනසිල්ලෙන් ඉන්න තිබ්බ නේද කියලා හිතෙන කොට හදවත මිරිකගෙන යන තරම් දුකක් දැනෙනවා.

- **රමණී**

• • •

**අපෙන් සදහටම සමු ගත්තද, මගේ දයාබර සැමියාගේ ආදරය ජීවමානයි!**

තිලංක දාහකින්වත් හොයා ගන්නට බැරි දෙවියෙක් වගේ මනුෂ්‍යයෙක්. ඔහු ආදරණීය තාත්තා කෙනෙක්; කලණ මිතුරෙක්. උදේ පාන්දරින් අවදි වී බොහෝ දුරක් ගෙවා රැකියාවට ගියේ අපේ අදත්, හෙටත් ලස්සන, ප්‍රීතිමත් දවසක් බවට පත් කරන්නයි. උපකාරයක් අවශ්‍ය ඕනෑම කෙනෙකුට උදව් කළ තිලංක සංවේදී හදවතක් තිබූ කෙනෙක්. තිලංක නැති අඩුව මේ තරම් කියලා කියන්න බැරිතරම්! එත් එයා හොඳ ලෝකයකට වෙලා අපි දිහා හැමදාම බලන් ඉන්න බව අපි හැමෝටම දැනෙනවා.

මීට අවුරුදු දෙකකට පෙර අපේ නිවසට පැමිණි ජීවිත රක්ෂණ අලෙවි නිලධාරියා මටත් තිලංකටත්, එහි වැදගත්කම ඉතා හොඳින් පැහැදිලි කළා. ජීවිත රක්ෂණයක අවශ්‍යතාවය

මෙන්ම විවිධාකාර ජීවිත රක්ෂණ වර්ග පිළිබඳ ඔහු අපව දැනුවත් කළා. තිලංකත් ඔහුත් එක්වී කළ අවශ්‍යතා විශ්ලේෂණයෙන් පසු එම නිලධාරියා අපට විසඳුම් කිහිපයක් යෝජනා කළා.

වාර්ෂිකව තිලංක රු. 250,000 ක මුදලක් උපයන අතරම තිලංක ඒ කාලයේ වැඩ කළ සමාගම විසින් ඒ වගේ දෙගුණයක ජීවිතාවරණයක් ලබා දී තිබුණා. අපි හැමදාම හිතුවේ ඒ ප්‍රමාණයම කොයි තරම් නම් සහනයක්ද කියලයි. නමුත් අපේ අවශ්‍යතාවන් හා දැනට ඒ සඳහා ඇති විසඳුම් බලාගෙන යන අතර ඉතාමත් වැදගත් දෙයක් එම නිලධාරියා මෙසේ අපට පැහැදිලි කළා. තිලංක ගේ ජීවිතාවරණය වලංගු වන්නේ ඒ සමාගමේ රැකියාව කරන කාලය තුළ පමණයි. බැරි වෙලාවත්, එතනින් තිලංකට අස් වෙන්නට සිදු වුණොත් ඒ හැම දෙයක්ම අපට අහිමි වෙනවා. ඉදිරි කාලයේ හදිසියේ එහෙම දෙයක් සිදුවුණාට පස්සේ සමහරක් විට තිලංකට ජීවිත රක්ෂණයක් මිලදී ගැනීමට නොහැකි වෙන්නත් පුළුවන්; එහෙමත් නැත්නම් ඒ කාලයේ දී එය මිල අධික වෙන්නත් පුළුවන්. මේ හේතු නිසා අපේ ජීවිත රක්ෂණය කිරීමේ වගකීම අපි අතට ගෙන එය ඉක්මනින් මිලදී ගැනීම ඉතාමත් බුද්ධිමත් තීරණයක් බව ජීවිත රක්ෂණ නිලධාරියා අපට පැහැදිලි කළා. තිලංකත් මමත් ඒ උපදේශය අනුව එදාම ඒ කටයුත්ත ඉටුකළා.

ජීවිත රක්ෂණය දෙවියන්ගෙන් ලැබුණු තෑග්ගක් වාගේ මට දැනුණේ ඊට අවුරුද්දකට පසු සිදුවුණු ඉතා දුක්බර සිද්ධිය නිසයි. තිලංකට සමාගමෙන් අස් වෙන්නට සිදුවූ නිසා ඔහු රැකියා සම්මුඛ සාකච්ඡාවක් සඳහා කොළඹ එන අතරතුරේ සිදුවූ රිය අනතුරකින් සදහටම අපෙන් වෙන්වුණා. ජීවිත රක්ෂණ නිලධාරියා අපට එදා කළ පැහැදිලි කිරීම නිසාත් මගේ දයාබර තිලංකගේ ආදරය නිසාත් අප ලබා ගත්ත ජීවිත රක්ෂණය නොවෙන්නට, ඒ කාලයේ ප්‍රමාණවත් කියා සිතපු සමාගමේ රක්ෂණය පමණක් තිබුණා නම්, තිලංකගේ වියෝවත් සමග මම දරුවන් සමඟ මහමගට වැටෙන්නට ඉඩ තිබුණා. ඊට හේතුව තිලංක මිය යන විට ඔහු සමාගමේ රැකියා නොකළ බැවින් එහි ජීවිතාවරණය ඔහුට වලංගු නොවුණ නිසයි.

තිලංකගේ වියෝවෙන් දැනට අවුරුදු දෙකක් ගත වෙලා; තිලංක නැති අඩුව එදා තරම් ම වේදනාකාරී වුණත් දැන් මටත් දරුවන්ටත් නිදහසේ අපේ ජීවිත ගෙන යාමටත්, අනාගතයේ ඇතිවෙන්න පුළුවන් මුල්‍යමය අභියෝගවලට සූදානම්ව සිටීමටත් ප්‍රමාණවත් මුදලක්, තිලංක ජීවිත රක්ෂණය හරහා අපට ලබා දී තිබෙනවා. එදා ඒ ජීවිත රක්ෂණ නිලධාරියා ගේ උපදෙස් පරිදි ප්‍රමාණවත් ජීවිත රක්ෂණාවරණයක් මිලදී ගෙන එහි ගෙවීම් අත් නොහැර සිදු කළ තිලංකගේ ආදරය ජීවමානව අපට දැනෙනවා.

• • •

**දික්කසාදය අමිහිරියි ! ඉන්පසුත් දුෂ්කරයි !**

අවුරුදු දහයකට පෙර, මා දික්කසාද වීමට ගොනු කළ නඩුව අසා අවසානයේ විනිශ්චයකාරතුමා හා මාගේ ජීවිත රක්ෂණ උපදේශක මහතා මගේ දික්කසාද සැමියා ගේ ජීවිතය ට රක්ෂණ ඔප්පුවක් ගෙන එහි අයිති කරු ලෙස මා නම් කර මිලට ගන්නේ නම් වඩාත් සුදුසු බව පැවසුවේ ඇයි ද යන්න එකළ මට හරි හැටි වැටහුණේ නැත.

අද එහි වටිනාකම මට සක්සුදක් සේ පැහැදිලිය! මගේ දික්කසාද සැමියාගේ ස්වභාව හොඳින් දන්නා නිසා, ඔහු ගේ ජීවිතයමත ගත් රක්ෂණ ඔප්පුවේ අයිතිකරු ඔහුවී මා නාමිකයා වූවා නම්, අද මට කිසිදු මුදලක් නොලැබෙනු නියතයි. ඊට හේතුව ඔහු අදාළ වාරික ගෙවීම පැහැර හැරියේ නම් ඒ පිළිබඳ කිසිදු දැනුම් දීමක් මට නොලැබෙන අතරම, වාරික නොගෙවීමෙන් ඔප්පුව කල් ඉකුත් වූයේ නම්, මටත් මගේ දරුවන්ටත් අදාළ කාලය අවසානයේ කිසිදු ආකාරයක ප්‍රතිලාභයක් නොලැබී යන්නට ද තිබුණු නිසයි.

නීතියට අනුව මගේ දික්කසාද වූ සැමියා විසින් වාරික ගෙවීමට නියම වූ නමුත්, එම ඔප්පුවේ අයිතිකරු මා වන බැවින්, ඔප්පුව පවත්වා ගෙන යාම මගේ වගකීමක් බවට පත්වූවා. මීට අවුරුදු හතකට පෙර සමාගම විසින් වාරික

නොගෙවීම පිළිබඳ මට දැන්වීමත් සමග මට හිඟ වාරික ඉක්මනින් ගෙවා ඔප්පුව යළි ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණා.

දෙවියන්ට ස්තුතිවන්න මම ඔප්පුව හොඳින් පවත්වාගෙන ගියා. ඉන් මාස තුනකට පසු ඔහු මිය ගියා. දැන් මගේ දරුවන්ට හා පවුලේ හැමට දීප්තිමත් අනාගතයක් කරා යාමට අවශ්‍ය මූල්‍යමය උපකාරය ලැබුණා. මා මෙය ලියන්නේ කෙනෙක් මට දුන් උපදේශය තුළින් කළ මහඟු උපකාරය මවිසින් තව කෙනෙකුවෙත ලබා දීමට මා අදහස් කරන බැවිනි.

• • •

**දෙවියන්ට ස්තුති වේවා අපට එය අවශ්‍ය වුණේ නැහැ. දැන් අපේ විශ්‍රාමයට හොඳ මුදලක් තිබෙනවා!**

මීට අවුරුදු තිස් දෙකකට පෙර ප්‍රියා මගේ ආදරණීය බිරිඳ වූ දා වාගේම අදත් මම ඉන්නේ හරිම සතුටින්.

මීට අවුරුදු 32 කට පෙර මම ජීවිත රක්ෂණ ඔප්පුවක් මිලදී ගත්තේ ප්‍රියා කෙරෙහි මා තුළ වූ දැඩි ආදරය නිසාමයි. මම හදිසියේ මිය ගියොත්, මේ ලෝකේ තනිවෙන මගේ බිරිඳටත්, මගේ මුළු පවුලටත්, මම ඉන්නා කාලේ ගත කරපු ජීවන රටාව, ඒ පහසුකම්, වෙනසක් නොවී ඒ විදිහටම ගෙනියන්න පුළුවන්කමක් ලැබුණොත් හොඳයි කියල මට හිතුණා. වාසනාවකට එහෙම කරදරයක් අපට වුණේ නැහැ. ඒත් දැන් අපට ඒ මුදල් වලින් අපේ විශ්‍රාමය ලස්සනට ගතකළ හැකියි.

ජීවිතේ හැල හැප්පීම් වලට මුහුණ දෙමින් ප්‍රියාත් මමත් ගෙවා ගෙන ආ මේ ගමනේදී ජීවිත රක්ෂණය මිලට ගත්ත හේතුව දෙවි පිහිටෙන් සිදු වුනේ නැහැ. දැන් මගේ දරුවෝ ලොකුමහත් වෙලා විවාහ වෙලා එයාලාගේ නිවහන් හදා ගෙන ගිහින්. මගේ ජීවිත රක්ෂණය කල්පිරී, අපිට ලොකු මුදලක් ලැබුණා! ජීවිතයේ සැඳෑසමයේ කවද හරි මම මිය යනවා. නමුත් එතෙක් ප්‍රියාටත් මටත් සතුටින්, අපි කැමති විදිහකට අපේ

විශ්‍රාම දිවිය ගත කරන්න තරම් අවශ්‍ය මුදල් මා ළඟ තියෙන බව මම දන්නවා. ඒක මට ලොකු සහනයක්!

**තාත්තේ, අපිව හැමදාම බලා ගත්තාට ඔයාට ස්තුතියි !**

ඒ දවස මට, අද ඊයේ වගේ මතකයි. 2001, දෙසැම්බර් 14 වැනිදා උදේ 3 යි. මාව ඇහැරුනේ අම්මා ගේ කෑගැසීමත් එක්කයි. හොඳටම බයවෙලා අම්මලාගේ නිදන කාමරයට දුවගෙන ගිය මට දකින්න ලැබුණේ තාත්තා හදිසි හෘදයාබාදධයකින් අපිව දාලා ගිහින් තිබුණු අයුරුයි.

හෘදයාබාධයක් හැදෙන්නේ අවුරුදු 50 - 60 අයටයි කියලා අපි හිතුවට මගේ තාත්තා මිය යන විට ඔහුට අවුරුදු 33 ක් පමණයි.

එදා සිදුවීමෙන් මම ඉගෙන ගත්ත පාඩම තමයි, අනාගතයේ වෙන්න පුළුවන් දේවල් වලට ලෑස්තිවෙලා ඉන්න අපි කාටවත් බැහැ කියලා. එහෙම උනත් මගේ තාත්තා අපි ගැන හිතලා කළ සැලසුමක් නිසා අපි රැකුණා.

ජීවිත රක්ෂණයෙන් ලැබුණු මුදල තාත්තා දැක්කේ නැති වුණත්, අප වෙනුවෙන් ඒක ගනිද්දී ඔහු බලාපොරොත්තු වූ විදිහට අපව එමගින් බලා ගත්තා. වෛද්‍ය ප්‍රතිකාර, තාත්තාගේ අවමංගල්‍ය වියදම් වලට අවශ්‍ය වුණු සල්ලි විතරක් නෙමෙයි, අපේ ගෙදර අපටම තියා ගන්නත් ඉදිරියේදී අපට එන්න පුළුවන් මූල්‍යමය බාධක බොහෝමයකටත් මුහුණ දෙන්න පුළුවන් වෙන විදිහට මුදලක්, මගේ දයාබර තාත්තා අපට දීලා ගියා.

මගේ තාත්තාට ගොඩාක් ස්තුතියි !

මම තාත්තාට ගොඩාක් ආදරෙයි !

• • •

**මා එපා කීවද; මට එය අවශ්‍යම බව, ඔබ කීවා;**
මගේ ආදරණීය නිම්මි,

ඔබ නැති පාළුව හැම මොහොතකදීම අපට දැනෙනවා.

ඔබට මෙය කිව යුතුමයි. මගේ දැඩි විරෝධය හමුවේ වුණත්, අවුරුදු තුනකට පෙර, අප හමුවීමට පැමිණි ඒ ජීවිත රක්ෂණ උපදේශකවරයා කියූ දේ ඔබ පිළිගත්තාට මගේ හදපත්ලෙන්ම ඔබට මා කෘතඥවනවා; මා සදා ඔබට ණයගැතියි.

ඔබ අප අතර නැති නමුත්, ඔබ හොඳ ලෝකයක සිටින බව මට සහතිකයි. අපි හැමෝම හොඳින් ඉන්නා බව ඔබ දන්නවා නම් අනිවාර්යයෙන්ම ඔබ සතුටුවන බව මම දන්නවා. අපේ දරුවෝ ඉක්මනින් උස්මහත් වෙනවා. එයාලාගේ ආයම්මා හරිම කරුණාවන්තයි. ඔයා අපිව දාලා ගිය මුල් කාලේ මම හිටියේ හොඳටම හිතේ කරදරෙන්. වැඩට යන්නයි, අපේ ඇස්දෙක වගේ ඉන්න දරුවෝ බලා ගන්නයි මේ පවුල ඉස්සරහට ගෙනියන්නයි තනියම මට ශක්තියක් නැති වෙයි කියල මට හිතුණා. ඔයා නැති අඩුව මේ තරම් කියල පෙන්නන්න බැරිතරම් විශාලයි. ඒත්, මගේ රත්තරන් නිම්මි, ඔයා අපේ අනාගතය ගැන හිතලා බොහොම හොඳට ජීවිතය සැලසුම් කළා. දුරදක්නා නුවණින් ඔයා කළ සැලසුම් නිසා, අපේ ගේ ගැනයි, දරුවන්ගේ අධ්‍යාපනය ගැනයි මගේ හිතට ලොකු සැහැල්ලුවක් ඇතිවුණා. ඔයා අපේ අනාගතය හොඳින් රැකගත් නිසා අපිට ඔයා එක්ක ගත කළ ඒ සුන්දර අතීතය නිතර මතක් කරන්න නිදහසක් තියෙනවා.

මගේ දයාබර නිම්මි, ඔයාගේ උත්සාහවන්ත බවටයි ඔයාගේ කැපවීමටයි සිය දහස් වාරයක් ස්තුතියි!

**මීට, ඔබේ සැමියා, නිලංග**

● ● ●

**ඔබ මෙය කියවමින්, ජීවිත රක්ෂණයක් ගත යුතු ද නැද්ද යන්න තවම තීරණය කර නැතිනම්, ඔබෙන් ම අසන්න මෙහෙම, "මම හදිසියේ මියගියොත්, මගේ පවුලේ අයට කුමක් සිදුවේවිද? මට වටින්නේ මේ මාසයකට ගෙවන රු. 2500/- ද, ඔවුන්ගේ සතුටද?**

# 10

# සමාප්තිය

## "ජීවිත රක්ෂණය ආදර හසුනකි."

අපේ ජීවිතයේ සතුට රැඳී ඇත්තේ ආදරය මතයි. අප සියළු දෙනා ආදරයෙන් හා සෙනෙහසින් එකිනෙකා කෙරෙහි බැඳී සිටිති. ඔබේ දයාබර බිරිඳ හෝ සැමියා කෙරෙහි, ඔබේ දරුවන්, දෙමාපියන් කෙරෙහි ඔබ තුළ ඇති ආදරය ගැන වෙන කිසිවකු විසින් නැවත නැවත මතක් කර දීමක් ඔබට අනවශ්‍යයි. ඔබේ ආදරණීය පවුල කෙරෙහි ඔබ දරන වගකීම් ඔබට මතක් කර දීමට තුන් වැන්නෙක් අනවශ්‍යයි.

ඔවුන් සෑම දෙනා කෙරෙහි ඔබ තුළ ඇති ආදරය ඔබේ මතකයේ රඳවාගත යුත්තේ අන් කිසිවකු නොව, ඔබමයි! ඒ අනුව ඔවුන් සුරක්ෂිත කිරීමේ කාර්යය ආරම්භ කර, පවත්වා ගත යුතු වන්නේ ඔබ විසින්මයි! ඔබේ බිරිඳ, සැමියා හෝ දරුවන්ට තෑග්ගක් දීමට වෙන කෙනෙකු ගේ තීරණයක් නොව, අවශ්‍ය වන්නේ ඔබේ තීරණයයි!

ඔබේ බිරිඳ හෝ සැමියාගේ උපන්දිනයේදී, ඔබ ඔවුන්ගෙන්, අසනවාද ඔබෙන් ඔවුන්ට තෑග්ගක් ඕනෑද කියා? ඔබේ දරුවන් ගෙන් ඔබ එසේ අසයිද? ඔබ එසේ අසන්නේ නැහැ. ඔවුන්ට ඔබ තුළ ඇති ආදරය නිසාම ඔවුන්ට හොඳම දේ ඔබ තිළිණ කරාවි. එය ඔබේ වගකීමක් ලෙස ඔබට තදින් දැනෙන නිසා ඔබ ඔවුන්ව සතුටෙන් තැබීමට ඕනෑ හැම දෙයක්ම ඉටු කරාවි. ඔබේ පවුලේ අයගේ සතුට වෙනුවෙන් ඔබ සතු යුතුකම් හා වගකීම් ඉටු කිරීමට ඔබ බැඳී සිටියි.

අදම ඔබේ ජීවිත රක්ෂණය ලබාගෙන, ඔබේ ආදරණීයයන් වෙනුවෙන් ලියන ආදරයේ වටිනාම හසුන ලියාතබන්න

ඔබ හැමටම, ආදරයෙන් පිරුණු ප්‍රීතිමත් ජීවිතයක් වේවා!